// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 1919/81 - 2015 ජුනි මස 19 වැනි සිකුරාදා - 2015.06.19

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

### මධ්‍යම පළාතේ පළාත් සභාව

### කඩුගන්නාව නගර සභාව

#### අතුරු ව්‍යවස්ථා

255 වැනි අධිකාරය වන නගර සභා ආඥාපනතේ 153 වැනි වගන්තියේ (1) වන උපවගන්තිය සමග කියවිය යුතු එකී ආඥාපනතේ 157 වැනි වගන්තියේ 10 (ඇ) වැනි උප වගන්තිය යටතේ නගර සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව කඩුගන්නාව නගර සභාව විසින් සාදන ලද පහත සඳහන් අතුරු ව්‍යවස්ථා 1989 අංක 12 පළාත් සභා (ආනුෂාංගික විධිවිධාන) පනතේ 2 වැනි වගන්තිය (1) වැනි උප වගන්තිය සමග කියවිය යුතු ඉහත කී නගර සභා ආඥාපනතේ 154 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව මධ්‍යම පළාත් සභාවේ පළාත් පාලන විෂය භාර අමාත්‍ය සරත් ඒකනායක වන මා විසින් අනුමත කරනු ලැබූ බවත් මෙම නිවේදනය ගැසට් පත්‍රයේ පළකරනු ලැබූ දින සිට එකී අතුරු ව්‍යවස්ථා කඩුගන්නාව නගර සභා බල ප්‍රදේශයේ බලපවත්වන බවත් මෙයින් නිවේදනය කරමි.

සරත් ඒකනායක,
මධ්‍යම පළාතේ ප්‍රධාන අමාත්‍ය හා පළාත් පාලන විෂයභාර අමාත්‍ය.

2014 සැප්තැම්බර් මස 15 වැනි දින,
මහනුවර,
මධ්‍යම පළාතේ පළාත් සභාවේ,
ප්‍රධාන අමාත්‍ය කාර්යාලයේ දී ය.

*අයාලේ යන සතුන් අල්ලා ගැනීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව*

01. මෙම අතුරු ව්‍යවස්ථාව කඩුගන්නාව නගර සභා බල ප්‍රදේශය තුළ අයාලේ යන සතුන්ගෙන් වන හානි වළක්වා ගැනීම සඳහා හා එකී සතුන් අල්ලා ගැනීම හා ඊට අදාළ ආනුෂාංගික විධිවිධාන සැලැස්වීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව ලෙස හඳුන්වනු ලැබේ.

02. සභාපතිවරයා විසින් නිශ්චිතව බලය පැවරූ පුද්ගලයෙකු විසින් නගර සභා බල ප්‍රදේශයේ පොදු ස්ථානයක අයාලේ යන සතෙකු අල්ලා ගැනීම එම සතුන් තමන් භාරයට ගැනීම සිදුකළ හැකිය.

1A - PG 2522 — 106 (2015/06)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

03. දෙවන අතුරු ව්‍යවස්ථාව යටතේ අල්ලා ගනු ලබන සතුන් රැකවල්කාරයකු භාරයට ගෙන හැකිතාක් ඉක්මනින් නගර සභාව විසින් පිහිටුවා පවත්වාගෙන යනු ලබන සත්ව ගාලක් වෙත ගෙන යා යුතුය.

04. කවර හෝ තැනැත්තෙකු විසින් ඉහත දෙවන අතුරු ව්‍යවස්ථාව අනුව බලයලත් අයෙකුගේ රාජකාරි ඉටුකිරීමේදී ඊට බාධා කිරීම හෝ නුසුදුසු ලෙස මැදිහත්වීම් සිදු නොකළ යුතුය.

05. මෙම අතුරු ව්‍යවස්ථාවේ සඳහන් රැකවල්කරු විසින් ගාල තුලට භාරගන්නා ලද සතුන් පිළිබඳ ලේඛනයක් පවත්වාගෙන යා යුතු අතර එය උපලේඛන අංක 01 පරිදි විය යුතුය.

06. ගාල් කරන ලද සතුන්ට වන හානි සඳහා සභාව වගකියනු නොලැබේ.

07. ගාල් කර ඇති සතෙකු නිදහස් කරගැනීම සඳහා එම සතා ඇල්ලීමට දැරූ වියදම, රැකවල් ගාස්තුව, ආහාර ගාස්තුව, රෝගී අවස්ථාවන් හිදී ප්‍රතිකාර ගාස්තු වශයෙන් ගණන් බැලූ නගර සභාව විසින් නියම කරනු ලැබූ මුදලක් සතාගේ හිමිකරු/භාරකරු විසින් නගර සභාවට ගෙවා කුවිතාන්සියක් ලබාගත යුතුය.

08. සභාපතිවරයා හෝ සභාපතිවරයා විසින් බලය පවරන ලද නිලධාරියෙකු විසින් නිකුත් කරනු ලබන සතුන් නිදහස් කිරීමේ නියෝගයක් නොමැතිව කිසිම සතෙකු නිදහස් නොකළ යුතු අතර නිදහස් කිරීමේ නියෝගයේ සඳහන් අයටම සතුන් භාරදිය යුතුය.

09. හිමිකරුවෙකු, භාරකරුවෙකු ඉදිරිපත් නොවන්නා වූද නියමිත ගාස්තු ගෙවා නොමැති වූද, අල්ලා ගත් දින සිට දින 10කට නොඅඩු කාලයක් ගාල තුල තබා සිටියාවූද කවර හෝ සතෙකුගේ හිමිකම එනයින්ම සභාව සතු වන අතර සභාවට අයවිය යුතු මුදල් ලබාගැනීම සඳහා සභාව විසින් තීරණය කරනු ලබන ආකාරයකින් වෙන්දේසියේ විකිණීම නීත්‍යානුකූල වන්නේය.

10. 09 වන අතුරු ව්‍යවස්ථාව යටතේ සභාව විසින් මස් පිණිස සතුන් වෙන්දේසි කිරීම නොකළ යුතුය.

11. වෙන්දේසි කිරීමෙන් ලබාගන්නා මුදලෙන් නගර සභාවට අයවිය යුතු ගාස්තු පියවා ගත් පසු ඉතිරියක් වේ නම් එය නියම හිමිකරු, භාරකරු ඉල්ලා සිටියහොත් ඔහුට ලබාදිය යුතුයි. වෙන්දේසියෙන් මාස 06ක කාලයක් ඉකුත්වීමෙන් පසු ලැබෙන එවැනි ඉල්ලීම් භාර නොගත යුතු අතර එම ශේෂ මුදල සභාවේ පොදු අරමුදලට බැරකළ යුතු වන්නේය.

12. ඉහතින් දැක්වූ අතුරු ව්‍යවස්ථා එකක් හෝ කිහිපයක් හෝ සියල්ලම හෝ උල්ලංඝනය කිරීම වරදක් වන අතර නිසි බලය ඇති අධිකරණයක් මගින් වරදකට වරදකරු කරනු ලැබූ විට නියම කළ හැකි උපරිම දඩය හා එම කඩකිරීම හෝ උල්ලංඝනය කිරීම නොකඩවා තවදුරටත් කරගෙන යන විටක ඒ පිළිබඳ වරදකරු කිරීමෙන් පසුව හෝ උල්ලංඝනය ගැන අවධානය යොමුකරමින් සභාපතිවරයා විසින් බලයලත් වෙනත් නිලධාරියෙකු විසින් ලිඛිත දැන්වීමක් භාරදෙනු ලැබීමෙන් පසුව කඩකිරීම හෝ උල්ලංඝනය තවදුරටත් නොකඩවා කරගෙන යන සෑම එක් දිනයක් සඳහාම නියම කළ හැකි අතිරේක උපරිම දඩය නගර සභා ආඥාපනතේ (255 අධිකාරය) 153 (02) වගන්තිය අනුව නියම කළ හැකිය.

13. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස ;

"සභාව" යන්නෙන් කඩුගන්නාව නගර සභාව ද,

"සභාපති" යන්නෙන් කඩුගන්නාව නගර සභාවේ සභාපතිවරයා ද,

"බලය පවරනු ලැබූ නිලධාරියා" යන්නෙන් කඩුගන්නාව නගර සභාවේ සභාපතිවරයා විසින් බලය පවරනු ලැබූ නිලධාරියා ද, අදහස් වේ

"අයාලේ යන සතුන්" යන්නෙන් යම්කිසි පොදු ස්ථානයක ගැවසෙන ගවයකු, ඌරකු, අශ්වයෙකු, පෝනියෙකු, එළුවෙකු අදහස් වේ.

14. මෙම අතුරු ව්‍යවස්ථාවේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් එවිට සිංහල පාඨයෙහි අර්ථ දැක්වෙන අදහස බලපැවැත්වේ.

*උපලේඛන අංක 01*

| *දිනය* | *සතුන්ගේ විස්තර (වර්ගය/පාට)* | *සතුන් ප්‍රමාණය* | *භාරදුන් නිලධාරියාගේ අත්සන* | *භාරගත් නිලධාරියාගේ අත්සන* |
|---|---|---|---|---|
| | | | | |

## කඩුගන්නාව නගර සභාව

### අතුරු ව්‍යවස්ථා

255 වැනි අධිකාරය වන නගර සභා ආඥාපනතේ 153 වැනි වගන්තියේ (1) වන උපවගන්තිය සමග කියවිය යුතු එකී ආඥාපනතේ 157 වැනි වගන්තියේ 3 වැනි උප වගන්තිය යටතේ නගර සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව කඩුගන්නාව නගර සභාව විසින් සාදන ලද පහත සඳහන් අතුරු ව්‍යවස්ථා 1989 අංක 12 දරන පළාත් සභා (ආනුශාංගික විධිවිධාන) පනතේ 2 වැනි වගන්තිය (1) වැනි උප වගන්තිය සමග කියවිය යුතු ඉහත කී නගර සභා ආඥාපනතේ 154 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව මධ්‍යම පළාත් සභාවේ පළාත් පාලන විෂය භාර අමාත්‍ය සරත් ඒකනායක වන මා විසින් අනුමත කරනු ලැබූ බවත් මෙම නිවේදනය ගැසට් පත්‍රයේ පළකරනු ලැබූ දින සිට එකී අතුරු ව්‍යවස්ථා කඩුගන්නාව නගර සභා බල ප්‍රදේශයේ බලපවත්වන බවත් මෙයින් නිවේදනය කරමි.

සරත් ඒකනායක,
මධ්‍යම පළාතේ ප්‍රධාන අමාත්‍ය හා පළාත් පාලන විෂයභාර අමාත්‍ය.

2014 සැප්තැම්බර් මස 15 වැනි දින,
මහනුවර,
මධ්‍යම පළාතේ පළාත් සභාවේ,
ප්‍රධාන අමාත්‍ය කාර්යාලයේ දී ය.

*බදු අයකර ගැනීම සඳහා තොරතුරු ලබාගැනීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව*

01. මෙම අතුරු ව්‍යවස්ථාව කඩුගන්නාව නගර සභා බල ප්‍රදේශයේ සියලු ව්‍යාපාරික ස්ථාන හා කර්මාන්ත සම්බන්ධයෙන් බදු අයකර ගැනීම සඳහා අවශ්‍ය තොරතුරු ලබාගැනීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව යනුවෙන් හඳුන්වනු ලැබේ.

02. මෙම අතුරු ව්‍යවස්ථාව කඩුගන්නාව නගර සභා බල ප්‍රදේශයේ සියලු ව්‍යාපාරික ස්ථාන හා කර්මාන්ත සම්බන්ධයෙන් බදු අයකිරීමේ කාර්යය සඳහා අවශ්‍ය වන්නාවූ ගිණුම් වාර්තාවලට අදාළ තොරතුරු ලබාගැනීමට අවශ්‍ය වාර වාර්තා ලබාගැනීමේ කටයුතු විධිමත් කිරීම සඳහා පනවනු ලැබේ.

03. කඩුගන්නාව නගර සභා බල ප්‍රදේශයේ ඇති සියලුම ව්‍යාපාර කර්මාන්ත හා සංවිධාන පිළිගත් ගිණුම් ක්‍රමයක් අනුව පැහැදිළි ගිණුම් වාර්තා පවත්වාගෙන යා යුතු ය.

04. සභාපතිවරයා හෝ ඔහු විසින් බලය පවරනු ලැබූ නිලධාරියා විසින් ඉල්ලුම් කරනු ලබන සියලුම මූල්‍ය හා ගිණුම්වලට අදාළ තොරතුරු ලබාදීම, පිටපත් ලබාදීම ව්‍යාපාර බද්දකට යටත් තැනැත්තෙකුගේ කාර්යය වන්නේය.

05. සභාපතිවරයා හෝ සභාපතිවරයා විසින් බලය පැවරූ යම් නිලධාරියෙකු විසින් කලින් කල ඉල්ලා සිටිනු ලබන සියලුම ව්‍යාපාර තොරතුරු හා මූල්‍ය ගිණුම් පිළිබඳ වාර වාර්තා පිළිගත් මූල්‍ය හා ගිණුම් සංකල්ප මත පිළියෙල කරනු ලබන එවා විය යුතුය.

06. ඉහත 05 වන අතුරු ව්‍යවස්ථාව මගින් ඉදිරිපත් කරන සියලුම මූල්‍ය හා ගිණුම් වාර්තා පිළිගත් ගිණුම් පරීක්ෂකයෙකු මගින් පරීක්ෂාවට ලක්කළ සහතික කරන ලද වාර්තා විය යුතුය.

07. කඩුගන්නාව නගර සභාවේ ලේකම්වරයා හෝ බලය පැවරූ නිලධාරියා විසින් යවනු ලබන දැන්වීමක් ලැබූ කවර හෝ තැනැත්තෙකු විසින් එකී දැන්වීම තමාට ලැබුණු දින සිට දින 14 ක් ඇතුළත එකී දැන්වීම් මගින් ඉල්ලා ඇති තොරතුරු ලේකම්වරයා වෙත ඉදිරිපත් කළ යුතුය.

08. අසත්‍ය තොරතුරු ලබාදීම හෝ තොරතුරු හෙළිදරවු නොකිරීම වරදක් වන්නේය.

09. ඉහත 05 වන අතුරු ව්‍යවස්ථාව යටතේ ඉල්ලා සිටිනු ලබන වාර වාර්තාවලට අදාළ තොරතුරු පරීක්ෂා කිරීමට අවශ්‍ය වන්නේ නම් අදාළ ව්‍යාපාරික ස්ථානයට කර්මාන්ත පරිශ්‍රයට පැමිණ සභාපතිවරයාට හෝ බලය පැවරූ නිලධාරියාට එම පොත් පත්වල සත්‍යතාවය පරීක්ෂා කිරීම නීත්‍යානුකූල වන්නේය.

10. මේ අතුරු ව්‍යවස්ථාවල කවර වූ හෝ විධිවිධානයක් කඩ කිරීම හෝ උල්ලංඝනය කිරීම වරදක් වන අතර, නිසි බලය ඇති අධිකරණයක් මගින් ඒ වරදකට වරදකරු කරනු ලැබූ විට නියම කළහැකි උපරිම දඩය සහ එම කඩ කිරීම හෝ උල්ලංඝනය නොකඩවා තවදුරටත් කරගෙන යන විටක ඒ පිළිබඳව වරදකරු කිරීමෙන් පසුව හෝ එම උල්ලංඝනය ගැන අවධානය යොමුකරමින් සභාපතිවරයා විසින් හෝ බලයලත් වෙනත් නිලධාරියෙකු විසින් ලිඛිත දැන්වීමක් භාරදෙනු ලැබීමෙන් පසුව කඩ කිරීම හෝ උල්ලංඝනය තවදුරටත් නොකඩවා කරගෙන යන සෑම එක් දිනයක් සඳහාම නියම කළ හැකි අතිරේක දණ්ඩනයේ උපරිමය පිළිවෙලින් නගර සභා ආඥා පනතේ (255 අධිකාරය) 153 (2) උප වගන්තියෙන් නියම කර ඇති උපරිම දඩ මුදල හා අතිරේක දණ්ඩනයේ උපරිමය විය යුතුය.

11. 10 වන අතුරු ව්‍යවස්ථාව යටතේ නියම කරන දඩ මුදල් නගර සභාවේ පොදු අරමුදලට බැර විය යුතුය.

12. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස මෙම අතුරු ව්‍යවස්ථාවේ,

"සභාපති" යන්නෙන් කඩුගන්නාව නගර සභාවේ සභාපතිවරයා ද,

"සභාව" යන්නෙන් කඩුගන්නාව නගර සභාව ද,

''ලේකම්'' යන්නෙන් කඩුගන්නාව නගර සභාවේ ලේකම්වරයාද,

"බලයලත් නිලධාරි" යන්නෙන් සභාපතිවරයා විසින් බලය පවරන ලද නිලධාරියෙකු අදහස් කෙරේ.

13. මෙම අතුරු ව්‍යවස්ථාවේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් එවිට සිංහල පාඨයෙහි අර්ථ දැක්වෙන අදහස බලපැවැත්වේ.

07 - 279/2

---

## කඩුගන්නාව නගර සභාව

### අතුරු ව්‍යවස්ථා

255 වැනි අධිකාරය වන නගර සභා ආඥාපනතේ 153 වැනි වගන්තියේ (1) වන උපවගන්තිය සමග කියවිය යුතු එකී ආඥාපනතේ 157 වැනි වගන්තියේ 9(ඛ) වැනි උප වගන්තිය යටතේ නගර සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව කඩුගන්නාව නගර සභාව විසින් සාදන ලද පහත සඳහන් අතුරු ව්‍යවස්ථා 1989 අංක 12 පළාත් සභා (ආනුශාංගික විධිවිධාන) පනතේ 2 වැනි වගන්තිය (1) වැනි උප වගන්තිය සමග කියවිය යුතු ඉහත කී නගර සභා ආඥාපනතේ 154 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව මධ්‍යම පළාත් සභාවේ පළාත් පාලන විෂය භාර අමාත්‍ය සරත් ඒකනායක වන මා විසින් අනුමත කරනු ලැබූ බවත් මෙම නිවේදනය ගැසට් පත්‍රයේ පළකරනු ලැබූ දින සිට එකී අතුරු ව්‍යවස්ථා කඩුගන්නාව නගර සභා බල ප්‍රදේශයේ බලපවත්වන බවත් මෙයින් නිවේදනය කරමි.

සරත් ඒකනායක,
මධ්‍යම පළාතේ ප්‍රධාන අමාත්‍ය හා පළාත් පාලන විෂයභාර අමාත්‍ය.

2014 සැප්තැම්බර් මස 15 වැනි දින,
මහනුවර,
මධ්‍යම පළාතේ පළාත් සභාවේ,
ප්‍රධාන අමාත්‍ය කාර්යාලයේ දී ය.

*පදික වේදිකා අවහිර කිරීම් වැළැක්වීම සඳහා වන අතුරු ව්‍යවස්ථාව*

01. මෙම අතුරු ව්‍යවස්ථාව කඩුගන්නාව නගර සභා බල ප්‍රදේශයේ පදික වේදිකා අවහිර කිරීම් වැළැක්වීම හා පාලනය කිරීම සඳහා වූ අතුරු ව්‍යවස්ථාව යනුවෙන් හඳුන්වනු ලැබේ.

02. කිසියම් තැනැත්තෙකු, කිසියම් ආකාරයකින් පදික වේදිකාවේ කිසිදු ද්‍රව්‍යයක් විකිණීම, වෙළඳාම් කිරීම රැස්කර තැබීම හෝ ප්‍රදර්ශනය කර තැබීම හෝ ප්‍රදර්ශනය කිරීම නොකළ යුතු ය.

03. යම් පුද්ගලයෙකු යම් පදික වේදිකාවක කුමන හෝ වාහනයක් පදවාගෙන යාම හෝ නතර කර තැබීම හෝ නොකළ යුතු ය.

04. පදික වේදිකාවට අවහිර වන පරිදි වාඩි වී සිටීම හෝ පරිහරණය කිරීම නොකළ යුතු ය.

05. කිසියම් පුද්ගලයෙකු සභාපතිවරයාගේ ලිඛිත අවසරය ලබාගෙන මිස පදික වේදිකාව අසල පිහිටි ගොඩනැගිල්ලක් අළුත්වැඩියා කිරීම හෝ ඒ සඳහා පලංචි සැදීම හෝ ගොඩනැගිල්ලක වහලයේ කොටසක් හෝ ; නාම පුවරුවක් පදික වේදිකාව දෙසට නෙරා යන පරිදි ඉදිකිරීම හෝ සවි කිරීම හෝ සවි කර තැබීම නොකළ යුතු ය.

06. කිසියම් හෝ පුද්ගලයෙකු පදික වේදිකා අවහිර වන ලෙසට ගල්, ගඩොල්, වැලි, දැව, හෝ වෙනත් යම් ද්‍රව්‍යයක් විකිණීම හෝ වෙනත් අයුරකින් ප්‍රයෝජනයට ගැනීම සඳහා තැන්පත් කිරීම, රැස්කර තැබීම නොකළ යුතු ය.

07. මෙම අතුරු ව්‍යවස්ථාවේ සඳහන් වන අන්දමට සභාපතිවරයා විසින් දෙනු ලබන ලිඛිත අනුමැතියෙහි සඳහන් යම් ඉදිකිරීමක්, අළුත්වැඩියාවක් කඩා වැටීමෙන් හෝ ඒ සඳහා උපයෝගී කරගනු ලබන ද්‍රව්‍ය හෝ උපකරණ පදික වේදිකාව මතට වැටීමෙන් හෝ පතිත වීමකදී යම් පදිකයෙකුට සිදුවන අලාභහානි හෝ ශාරීරික පීඩා සඳහා වන්දි ලබාගැනීමේ අයිතියට හානියක් සිදු නොවිය යුතුය. වන්දි ගෙවීම සම්බන්ධයෙන් අවසරපත්‍ර ලාභියා වගකිව යුතු ය.

08. කිසියම් පුද්ගලයෙකු තම ගොඩනැගිල්ලකින් පිට කරනු ලබන අපජලය හෝ වැසි ජලය පදික වේදිකාවට හෝ ගලා ඒමට සැළැස්වීම නොකළ යුතු ය.

09. දහතුන් වන අතුරු ව්‍යවස්ථාවේ සඳහන් විධිවිධානයන්ට හානියක් නොවන පරිදි තුන් වන හා හය වන අතුරු ව්‍යවස්ථාවල සඳහන් පදික වේදිකාව අවහිර වන ලෙස නවතා තිබෙන වාහනයක් හෝ කිසියම් ද්‍රව්‍යයක් ඉවත් කර ගැනීමට සභාපතිවරයා විසින් ලිඛිතව හෝ වාචිකව දැනුම් දීමෙන් පසු එම දැන්වීමේ සඳහන් කාලය තුළ හා එහි සඳහන් පරිදි ක්‍රියා කිරීමට යම් වාහනයක රියදුරු හෝ අයිතිකරු හෝ යම් ද්‍රව්‍යයක හිමිකරු අපොහොසත් වුවහොත් එම වාහනය හෝ ද්‍රව්‍ය නියම කරනු ලබන ස්ථානයකට ගෙන ගොස් ගාල්කර තැබීමට හෝ ගබඩා කර තැබීමට සභාපතිවරයාට හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියාට බලය ඇත්තේය.

10. නව වන අතුරු ව්‍යවස්ථාවේ සඳහන් පරිදි ක්‍රියා කිරීමේ දී ඇතිවන කිසියම් හෝ අලාභ හානියක් සඳහා වන්දි ඉල්ලීමක් හෝ වන්දියක් ලැබීමට හෝ කිසිදු පුද්ගලයෙකුට හිමිකමක් නොතිබිය යුතු ය.

11. නව වන අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ක්‍රියා පිළිවෙල අනුගමනය නොකර තිබියදී එවැනි වාහනයකින් හෝ ද්‍රව්‍යයකින් යම් අනතුරක් අලාභ හානියක් හෝ ශාරීරික ආපදාවක් ඇතිවුවහොත් ඒ සඳහා වන්දි ගෙවීම වාහන අයිතිකරු හෝ ද්‍රව්‍ය හිමිකරු විසින් කළ යුතු අතර සභාපතිවරයා යම් වන්දි ගෙවීමකට යටත් නොවිය යුතු ය.

12. පදික වේදිකාව වෙන් කර තැබීම හා මායිම්කර තැබීම සඳහා යොදා ඇති අත්වැල් වලට හෝ වැට කණු වලට අලාභහානි කිරීම හෝ කිරීමට සැළැස්වීම හෝ අයුතු ලෙස ප්‍රයෝජනයට ගැනීම හෝ ඒ මත වාඩි වී සිටීම නොකළ යුතු ය.

13. පදික වේදිකාව, පදිකයන්ට අවහිරතාවයක් නොවන පරිදි සභාව විසින් විධිමත් පරිදි නඩත්තු කළ යුතු ය.

14. ඉහතින් දක්වූ අතුරු ව්‍යවස්ථා එකක් හෝ කිහිපයක් හෝ සියල්ලම හෝ උල්ලංඝනය කිරීම වරදක් වන අතර නිසි බලය ඇති අධිකරණයක් මගින් වරදකට වරදකරු කරනු ලැබූ විට නියම කළ හැකි උපරිම දඩය හා එම කඩ කිරීම හෝ උල්ලංඝනය කිරීම නොකඩවා තව දුරටත් කර ගෙන යන විටක ඒ පිළිබඳ වරදකරු කිරීමෙන් පසුව හෝ උල්ලංඝනය ගැන අවධානය යොමු කරමින් සභාපතිවරයා විසින් හෝ බලයලත් වෙනත් නිළධාරියෙකු විසින් ලිඛිත දැන්වීමක් භාර දෙනු ලැබීමෙන් පසුව කඩ කිරීම හෝ උල්ලංඝනය තව දුරටත් නොකඩවා කර ගෙන යන සෑම එක් දිනයක් සඳහාම නියම කළ හැකි අතිරේක උපරිම දඩය 255 වන නගර සභා ආඥා පනතේ 153(2) උප වගන්තිය අනුව නියම කළ හැකිය.

15. 14 වන අතුරු ව්‍යවස්ථාව යටතේ නියම කරන දඩ මුදල් නගර සභාවේ පොදු අරමුදලට බැර විය යුතුය.

16. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස

"සභාව" යන්නෙන් කඩුගන්නාව නගර සභාව ද,
"සභාපති" යන්නෙන් කඩුගන්නාව නගර සභාවේ සභාපතිවරයා ද,
"බලය පවරනු ලැබූ නිලධාරියා" යන්නෙන් කඩුගන්නාව නගර සභාවේ සභාපතිවරයා විසින් බලය පවරනු ලැබූ නිලධාරියාද අදහස් වේ.
මෝටර් වාහනය යන්නෙන් මෝටර් රථ ආඥ පනතේ දැක්වෙන අදහස නිරූපනය වේ.

17. මෙම අතුරු ව්‍යවස්ථාවේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර, යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් එවිට සිංහල පාඨයෙන් අර්ථ දැක්වෙන අදහස බල පැවැත්වේ.

07 - 279/3

---

## කඩුගන්නාව නගර සභාව

### අතුරු ව්‍යවස්ථා

255 වැනි අධිකාරය වන නගර සභා ආඥපනතේ 153 වැනි වගන්තියේ (1) වන උපවගන්තිය සමග කියවිය යුතු එකී ආඥපනතේ 157 වැනි වගන්තියේ 7 (ඌ) වැනි උප වගන්තිය යටතේ නගර සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව කඩුගන්නාව නගර සභාව විසින් සාදන ලද පහත සඳහන් අතුරු ව්‍යවස්ථා 1989 අංක 12 දරන පළාත් සභා (ආනුශාංගික විධිවිධාන) පනතේ 2 වැනි වගන්තිය (1) වැනි උප වගන්තිය සමග කියවිය යුතු ඉහත කී නගර සභා ආඥාපනතේ 154 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව මධ්‍යම පළාත් සභාවේ පළාත් පාලන විෂය භාර අමාත්‍ය සරත් ඒකනායක වන මා විසින් අනුමත කරනු ලැබූ බවත් මෙම නිවේදනය ගැසට් පත්‍රයේ පළකරනු ලැබූ දින සිට එකී අතුරු ව්‍යවස්ථා කඩුගන්නාව නගර සභා බල ප්‍රදේශයේ බලපවත්වන බවත් මෙයින් නිවේදනය කරමි.

සරත් ඒකනායක,
මධ්‍යම පළාතේ ප්‍රධාන අමාත්‍ය හා පළාත් පාලන විෂයභාර අමාත්‍ය.

2014 සැප්තැම්බර් මස 15 වැනි දින,
මහනුවර,
මධ්‍යම පළාතේ පළාත් සභාවේ,
ප්‍රධාන අමාත්‍ය කාර්යාලයේ දී ය.

### *දැන්වීම් පුවරු සම්බන්ධයෙන් වන අතුරු ව්‍යවස්ථාව*

1. මෙම අතුරු ව්‍යවස්ථා කඩුගන්නාව නගර සභා බල ප්‍රදේශය තුළ යම් මංමාවතකට පෙනෙන පරිදි ප්‍රදර්ශනය කර ඇති ප්‍රචාරක දැන්වීම් විධිමත් කිරීම, පාලනය කිරීම, එසේ ප්‍රචාරණය කරනු ලබන ප්‍රචාරක දැන්වීම් සඳහා ගාස්තු අයකිරීම සඳහා වන අතුරු ව්‍යවස්ථා වන්නේය.

2. මෙම අතුරු ව්‍යවස්ථාව කඩුගන්නාව නගර සභාවේ ප්‍රචාරක දැන්වීම් විධිමත් කිරීම, පාලනය කිරීම, ගාස්තු අයකිරීමේ අතුරු ව්‍යවස්ථාව වශයෙන් හැඳින්වේ.

3. කිසිම තැනැත්තෙකු විසින්, යම් මංමාවතකට පෙනෙන කිසිම දැන්වීමක් ප්‍රදර්ශනය කිරීම හෝ ප්‍රදර්ශනය කිරීමට සැලැස්වීමට ඒ සඳහා කඩුගන්නාව නගර සභාවෙහි සභාපති විසින් නිකුත් කරන ලද බලපත්‍රයක බලය යටතේ මිස කරනු නොලැබිය යුතුය.

4. ප්‍රචාරක දැන්වීම යන්නෙන් ප්‍රධාන මාර්ගයට, අතුරු මාර්ගයට, පළාත් සභා, නගර සභා, හෝ පෞද්ගලික මාර්ගයට පෙනෙන සේ පුවරු බැනර්, කටවුට්, ඇලුමිනියම් තහඩු, යකඩ, පොලිතින්, රෙදි, කඩදාසි වැනි තහඩු රෙදි හෝ කොළවල ඇඳීමෙන්ද නොමැති නම් ගැල්වනයිස් යකඩ යොදා සකස් කරන ලද දැන්වීම් පුවරුවක නිවසක, කඩයක, හෝටලයක, බිත්තියක, තාප්පයක ආදි ස්ථානයක අකුරු යොදා තම වෙළඳ ස්ථානය, වෙළඳ භාණ්ඩය, ව්‍යාපාරය, වෙළඳ ප්‍රදර්ශනය, සැණකෙළිය ආදී උත්සව අවස්ථාවන්හිදී යොදන විශේෂ දැන්වීම් ද අදහස් වන්නේය.

5. කවර හෝ දැන්වීම් ප්‍රදර්ශනය කිරීමේ බලපත්‍රයක් සඳහා වන සෑම ඉල්ලුම්පත්‍රයක්ම මෙහි පළවන උපලේඛනයෙහි සඳහන් ආකෘතියට වියයුතු අතර මේ අතුරු ව්‍යවස්ථාවල පස්වන අතුරු ව්‍යවස්ථාවට අනුකූලව ඒ ප්‍රචාරක දැන්වීම් ප්‍රදර්ශනය කිරීමට අදහස් කරන දිනයට යටත් පිරියෙන් දවස් හතකට කලින් සභාවෙහි සභාපති වෙත ඉදිරිපත් කළ යුතුය.

6. හතරවන අතුරු ව්‍යවස්ථාව යටතේ ඉදිරිපත් කරන සෑම ඉල්ලුම් පත්‍රයක්ම පහත දැක්වෙන දේ වලින් සමන්විත යුතුය :

(අ) ලේකම්වරයාට යොමු කළ ලිඛිත ඉල්ලුම් පත්‍රය ;

(ආ) දැන්වීම් ප්‍රදර්ශනය කිරීමට අදහස් කරන නිර්මිතයේ පිහිටීමට සාපේක්ෂව පරිමාවට නොඅඩු පරිමාවකින් අඳින ලද භූමි සැලැස්ම ;

(ඇ) 1:1000 පරිමාවට නොඅඩු පරිමාවකට අඳින ලද එම නිර්මිතයේ රූ සටහන ;

(ඈ) එම සැළැස්මේ, රූප සටහනේ හෝ පිරිවිතරයෙහි, මේ අතුරු ව්‍යවස්ථාවලට අනුකූලවනු පිණිස කරන සංශෝධන වෙතොත් ඒ සංශෝධන ;

(ඉ) ප්‍රදර්ශනය කරන ප්‍රචාරක දැන්වීමෙහි යොදා ගන්නා වර්ණ සියල්ලම යොදා කුඩා පරිමාවක අඳින ලද ඒ දැන්වීමේ පිටපතක් ;

(ඊ) යාබද වීදිවලට සහ ප්‍රධාන භූමි සළකුණුවලට සාපේක්ෂව ප්‍රචාරක දැන්වීමෙහි පිහිටීම දැක්වෙන සැළැස්ම ;

(උ) මේ සභාවේ යෝජනා සම්මුතියක නිශ්චය කොට දැක්වෙන සහ ගැසට් පත්‍රයේ යථා පරිදි පළ කරන ගාස්තුව ;

(ඌ) ඒ ප්‍රචාරක දැන්වීම ප්‍රදර්ශනය කිරීමට අනුමැතිය දීමේ කාර්යය සඳහා කඩුගන්නාව නගර සභාවට අවශ්‍ය විය හැකි වෙනත් යම් තොරතුරු.

7. කඩුගන්නාව නගර සභාවෙහි සභාපති විසින් ලියවිල්ලකින් අනුමත කරන ලද සැලසුම් වලට, රූප සටහන්වලට සහ පිරිවිතරයට අනුකූලව මිස කිසිම තැනැත්තෙකු විසින් කඩුගන්නාව නගර සභා බල ප්‍රදේශය ඇතුළත යම් ප්‍රචාරක දැන්වීමක් හෝ ප්‍රචාරක දැන්වීම් හෝ ප්‍රදර්ශනය කිරීමේ කාර්යය සඳහා ප්‍රයෝජනයට ගැනීම පිණිස කිසිම පුවරුවක්, බිල් පුවරුවක්, දැන්වීම් පුවරුවක් හෝ වෙනත් යම් නිර්මිතයක් ඉදිකිරීම හෝ ඉදිකිරීමට සැළැස්වීම නොකළ යුතුය.

8. 4 වන අතුරු ව්‍යවස්ථාව යටතේ ඉදිරිපත් කරන ලද ඉල්ලුම් පත්‍රයක් නගර සභාවෙහි සභාපති විසින් අනුමත කරනු ලැබූ අවස්ථාවක අදාළ වර්ෂයේ ගාස්තු අය කිරීම සම්බන්ධ ගැසට් පත්‍රයෙහි සඳහන් ආකාරයට තීරණය කරන ලද නියමිත ගාස්තු ගෙවන තෙක් ඉල්ලුම්කරුට බලපත්‍රයක් නිකුත් කරනු නොලැබිය යුතු අතර, ඒ වෙළඳ ව්‍යාපාරිකයන්ගේ ස්ථාන නාම පුවරු එහි විශාලත්වය නගර සභාව විසින් තීරණය කරනු ලැබේ.

9. ප්‍රචාරක දැන්වීමක් ප්‍රදර්ශනය කිරීම සඳහා යම් තැනැත්තෙකුට බලපත්‍රයක් නිකුත් කරනු ලැබූ අවස්ථාවක ඔහු විසින් ප්‍රදර්ශනය කරනු ලබන සෑම ප්‍රචාරක දැන්වීමකම බල පත්‍රයේ යොමු අංකය සහ බලපත්‍රධාරියාගේ නම ඇතුළත් කරන ලෙස කඩුගන්නාව නගර සභාව විසින් ඒ තැනැත්තාට නියම කළ යුතුය.

10. මේ අතුරු ව්‍යවස්ථාවල විධිවිධාන පහත දැක්වෙන ප්‍රචාරක දැන්වීම් කිසිවකට ඒ දැන්වීම් ප්‍රදීප්ත ප්‍රචාරක දැන්වීමක් හෝ ගුවන් නාම පුවරුවක් හෝ වන්නේ නම් මිස අදාළ නොවිය යුතුය :

(අ) ලබන ශුද්ධ ප්‍රමාණය, පුණ්‍ය කටයුතු සඳහා යොදවන යම් ප්‍රසංගයකට අදාළ දැන්වීමක් ;

(ආ) කිසියම් ප්‍රසංගයක් පවත්වන ලබන ස්ථානයේ, ඒ ප්‍රසංගයට අදාළව ප්‍රදර්ශනය කෙරෙන ප්‍රචාරක දැන්වීමක් ;

(ඇ) ආගමික, දේශපාලන මහජන රැස්වීමක් සම්බන්ධයෙන් වන ප්‍රචාරක දැන්වීමක් ;

(ඈ) "කුලියට දීමට තිබේ" යනුවෙන් වූ ප්‍රචාරක දැන්වීමක් ;

(ඉ) "විකිණීමට තිබේ" යනුවෙන් වූ ප්‍රචාරක දැන්වීමක් ;

(ඊ) ගෘහ නාම පුවරු (එහි විශාලත්වය නගර සභාව විසින් තීරනය කරනු ලැබේ) ;

(උ) වෘත්තීය කටයුතු සඳහා යොදා ගනු ලබන, ප්‍රමාණයෙන් වර්ග මීටර් 0.93ක් නොඉක්මවන නාම පුවරුවක් ;

(ඌ) වෙළඳ කටයුත්තක් හෝ ව්‍යාපාරයක් සඳහා පාවිච්චි කරන වාහනයක එම වෙළඳ කටයුත්තේ හෝ ව්‍යාපාරයේ ස්වභාවය දැක්වෙන සහ අයිතිකරුගේ නම සහ ලිපිනය දුරකථන හෝ ටෙලෙක්ස් අංකය ආදී දැක්වෙන ප්‍රචාරක දැන්වීමක්.

11. කිසිම් තැනැත්තෙකු විසින් :

(i) යම් වීදියක, පාරක හෝ අඩි පාරක රිය මගට උඩින් හෝ හරහා හෝ නෙරා සිටින ආකාරයකට ප්‍රචාරක දැන්වීමක් ප්‍රදර්ශනය කිරීම ;

(ii) පොළොවේ සිට මීටර් 15ක් ඉක්මවන උසකින් ඇති යම් පුවරුවක් ප්‍රචාරක දැන්වීමක් ප්‍රදර්ශනය කිරීම හෝ ;

(iii) කිසියම් වීදියකට හෝ පාරකට මුහුණලා යාව පිහිටි ගොඩනැගිල්ලක මුහුණතෙහි හෝ වෙළඳ ශාලා නාම පුවරුවක හෝ ඒ ගොඩනැගිලි මුහුණතෙහි සීමාව ඉක්මවා යන දිගකින් යුත් ප්‍රචාරක දැන්වීමක් සවි කොට නැතහොත් එල්ලා තැබීම ;

(iv) ගුවන් නාම පුවරුවක ස්වරූපයේ ප්‍රචාරක දැන්වීමක් කඩුගන්නාව නගර සභාවේ පූර්ව අනුමැතිය ලබා නොගෙන යම් ආකාරයකට තැනීම ඉදිකිරීම නොකළ යුතුය.

12. කිසිම තැනැත්තෙකු විසින්, පෞද්ගලික හෝ පොදු ගොඩනැගිල්ලක, පොදු පූජනීය ස්ථානයක, පොදු උද්‍යානයක හෝ යම් පාළමක හෝ පාර ඇති මාර්ග පාළමක, දුරකථන හෝ විදුලි රැහැන් කණුවක, පැති බැම්මක, වේල්ලක, අමුණක, බෝක්කුවක, පර්වතයක, ඉවුරක හෝ ගසක ප්‍රචාරක දැන්වීමක් ප්‍රදර්ශනය නොකළ යුතුය.

13. මේ සභාවේ යෝජනා සම්මතයක නිශ්චය කොට දැක්වෙන සහ ගැසට් පත්‍රයේ යථා පරිදි පළ කරන ලද යම් ප්‍රදේශයක කිසිම ප්‍රචාරක දැන්වීමක්, ඒ දැන්වීම කඩුගන්නාව නගර සභාව විසින් අනුමත කළ ආකාරයට තනා හෝ ඉදිකර ඇති වෙළඳ ශාලා පුවරුවක් වන්නේ නම් මිස ප්‍රදර්ශනය නොකළ යුතුය.

14. කිසිම තැනැත්තෙකු විසින් නගර සභා ප්‍රදේශය ඇතුළත යම් වීදියක හෝ පාරක :

(i) යම් පුවරුවක, ආධාරයක හෝ රාමුවක ප්‍රදර්ශිත යම් ප්‍රචාරක දැන්වීමක් ප්‍රදර්ශනය සඳහා ගෙනයාම හෝ ගෙනයාමට සැලැස්වීම නොකළ යුතුය ;

(ii) යම් ප්‍රචාරක දැන්වීමක් ප්‍රදර්ශනය කිරීමට හෝ හැඳින්වීමේ කාර්යය සඳහා ගුවන් විදුලි යන්ත්‍රයක්, ග්‍රැම ෆෝනයක්. සංගීත භාණ්ඩයක්, සීනුවක් හෝ වෙනත් උපකරණයක් නගර සභාවේ අවසරයකින් තොරව පාවිච්චි කිරීම නීත්‍යානුකූල නොවන්නේය.

15. (i) යම් ප්‍රචාරක දැන්වීමක අවලස්සන හෝ පිළිකුල් සහගත හා මහජන සදාචාරයට හානිකරන යමක් නිරූපනය කරන අවස්ථාවක නගර සභාව විසින් ලිඛිත නිවේදනයක් මගින් ඒ නිවේදනයේ නිශ්චය කොට දැක්වෙන යම් කාලයක් ඇතුළත ඒ ප්‍රචාරක දැන්වීම ප්‍රදර්ශනය කිරීම නතර කරන ලෙස ඒ ප්‍රචාරක දැන්වීම සිදුකරන තැනැත්තාට නියම කළ හැකිය ;

(ii) මේ අතුරු ව්‍යවස්ථාවේ 01 වන ඡේදය යටතේ නිවේදනයක් භාර දෙනු ලැබූ කවර හෝ තැනැත්තෙකු විසින් එහි නිශ්චිත කොට දැක්වෙන කාලය ඇතුළත ඒ නිවේදනය අනුව ක්‍රියා කළ යුතුය.

16. ප්‍රචාරක දැන්වීම ප්‍රදර්ශනය පිණිස ප්‍රයෝජනයට ගන්නා යම් පුවරුවක අයිතිකරු හෝ බදුකරු විසින් :

(i) ඒ පුවරු නිසි අලුත්වැඩියාවෙන් යුතුව සහ තැනැත්තන්ගේ ආරක්ෂාව තහවුරු වන ආකාරයෙන් පවත්වාගෙන යා යුතුය. තවද ;

(ii) ඒ පුවරු ඉදිරිපස ප්‍රකටව පෙනෙන තැනක පැහැදිලි හා කියවිය හැකි අකුරෙන් ඔහුගේ නම සහ ලිපිනය ප්‍රදර්ශනය කළ යුතුය.

17. යම් ප්‍රචාරක දැන්වීමක් ප්‍රදර්ශනය කිරීම සඳහා නියමිත බලපත්‍ර ගාස්තුව ගෙවා ඇති බව පෙන්වීමට යම් ප්‍රචාරක දැන්වීමක නගර සභාව විසින් ඇතුළත් කර ඇති යම් ලාංඡනයක්, සළකුණක්, අක්ෂරයක්, වචනයක් හෝ ඉලක්කමක් කිසිම තැනැත්තෙකු විසින් විරූප කිරීම හෝ නොකළ යුතුය.

18. ඉහතින් දැක්වූ අතුරු ව්‍යවස්ථා එකක් හෝ කිහිපයක් හෝ සියල්ලම හෝ මේ අතුරු ව්‍යවස්ථාවල තවදුරටත් හෝ විධිවිධානයක් කඩකිරීම හෝ උල්ලංඝණය කිරීම වරදක් වන අතර, නිසි බලය ඇති අධිකරණයක් මගින් ඒ වරදකට වරදකරු කරනු ලැබූ විට නියම කළහැකි උපරිම දඩය සහ එම කඩකිරීම හෝ උල්ලංඝණය කිරීම නොකඩවා තව දුරටත් කරගෙන යන විටෙක ඒ පිළිබඳව වරදකරු කිරීමෙන් පසුව හෝ උල්ලංඝණය ගැන අවධානය යොමු කරමින් සභාපතිවරයා විසින් හෝ බලයලත් වෙනත් නිලධාරියෙකු විසින් ලිඛිත දැන්වීමක් භාරදෙනු ලැබීමෙන් පසුව කඩ කිරීම හෝ උල්ලංඝණය තවදුරටත් නොකඩවා කරගෙන යන සෑම එක් දිනයක්

සඳහාම නියමකළ හැකි අතිරේක දණ්ඩනයේ උපරිම පිළිවෙලින් නගර සභා ආඥා පනතේ (255 වන අධිකාරය) 153 වගන්තියේ (2) උපවගන්තියෙන් නියම කර ඇති උපරිම දඩ මුදල හා අතිරේක දණ්ඩනයේ උපරිමය විය යුතුය.

19. 18 වන අතුරු ව්‍යවස්ථාව යටතේ නියම කරන දඩ මුදල් නගර සභාවේ පොදු අරමුදලට බැර විය යුතුය.

20. අවසර පත්‍රයක් නොගෙන නගර සභා බල ප්‍රදේශය තුළ ප්‍රදර්ශනය කරනු ලබන අංක 04 වගන්තියෙන් දැක්වෙන සියළු ප්‍රචාරක දැන්වීම් කිසිදු පූර්ව දැනුම්දීමකින් තොරව සභාව විසින් ඉවත් කිරීම නීත්‍යානුකූල වන්නේ ය.

21. ප්‍රචාරක දැන්වීම් ප්‍රදර්ශනය කිරීමට අවසර ලැබීමෙන් පසු අවසර පත්‍රයේ වලංගු කාලය ඉදිරියට ඉතිරිව තිබියදී වුවද, යම් අයුරකින් සවි කරන ලද, බිත්තියක හෝ තාප්පයක අඳින ලද බැනරයක්, කටවුට් එකක් ප්‍රචාරක දැන්වීම් පුවරුවක් කෙසේ හෝ සුළඟට ඇලවී, ගැලවී බිම ඇද වැටී හෝ දුර්වර්ණ වී කැඩී බිඳී වෙනස් වී නගරයේ අලංකාරයට කුමන අයුරකින් හෝ හේතුවේ නම් එබඳු දැන්වීම් පිළිබඳ ලිඛිත දැන්වීමක් අදාළ අයිතිකරු වෙත භාර දී දින 14ක් ඇතුළත යථා පරිදි සකස් කිරීමට දැනුම්දිය යුතු අතර, එසේ නොමැති නම් සභාව විසින් ඉවත් කිරීම කළ යුතු වන්නේය. සභාව විසින් එසේ දැන්වීමෙන් දින14ක් ගත වීමෙන් පසු සභාවේ සේවකයින් යොදවා දැන්වීම ඉවත් කිරීමට සිදුවුවහොත් එහි දැන්වීම පිළිබඳ කිසිම වගකීමක් සභාව විසින් දරනු නොලැබේ.

22. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස මෙම අතුරු ව්‍යවස්ථාවේ ;

''සභාපතිවරයා'' යන්නෙන් කඩුගන්නාව නගර සභාවේ සභාපතිවරයාද,

''සභාව'' යන්නෙන් කඩුගන්නාව නගර සභාවද,

''ප්‍රචාරක දැන්වීම්'' යන්නෙන් කිසියම් ගොඩනැගිල්ලක ඉඩමක, ඉදිකිරීමක, හෝ එවැන්නක් උඩින් හෝ එහි ප්‍රචාරක කාර්යයක් සඳහා සම්පූර්ණ හෝ අර්ධ වශයෙන් දැන්වීමක ස්වභාවය උසුලන ප්‍රචාරක දැන්වීමක් ලෙස පාවිච්චි කරන ඕනෑම අකුරක්, වචනයක්, වචන කිහිපයක්, සංඥාවක්, විශාල දැන්වීම් කොළයක්, පුවරුවක් වෙනත් උපක්‍රමයකින් අනුරූපයක් අදහස් වේ.

23. මෙම අතුරු ව්‍යවස්ථාවේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් එවිට සිංහල පාඨයෙන් අර්ථ දැක්වෙන අදහස බලපැවැත්වේ.

***01 උපලේඛනය***

*කඩුගන්නාව නගර සභාව*

**ප්‍රචාරක නාම පුවරුවක් සවි කිරීම සඳහා අයදුම් කිරීම**

1. ඉල්ලුම්කරුගේ නම :————.
   ලිපිනය :————.
   ප්‍රචාරක ආයතනය :————.
   දුරකථන අංකය :————.

2. දැන්වීම් පුවරුව සම්බන්ධ ප්‍රචාරක ආයතන මගින් පත්කර ඇති වගකිවයුතු නියෝජිතයකු නම්
   නම :————.
   ලිපිනය :————.
   දුරකථන අංකය :————.

3. ඉඩම අයිතිකරු
   නම :————.
   ලිපිනය :————.
   වරිපනම් අංකය හා පාරේ නම :————.
   ඉඩම් අයිතිකරුගෙන් කැමැත්ත ලබා ගතිමි/ලබා නොගතමි

4. ප්‍රචාරක නාම පුවරුව
   පුවරුවේ සඳහන් වෙළඳ නාමය :————.
   ප්‍රචාරක නාමපුවරුවේ දිග .......................... පළල ..................................... වර්ග අඩි............................
   අවසන් වරට බලපත්‍ර ලබාගත් වර්ෂය :————.
   ප්‍රචාරක නාම පුවරුවේ ඡායාරූපයක් අමුණා ඉදිරිපත් කරන්න.

5. ප්‍රචාරක නාම පුවරුව සවිකරන ලද ස්ථානය දල සටහන (සවිකරන ස්ථානයට ප්‍රවේශ වීමට පහසු ආකාරයට)
   ......................................................................................................................................................
   ......................................................................................................................................................
   ......................................................................................................................................................

   ඉහත කරුණු නිවැරදි බව මෙයින් සහතික කරමි.

දිනය : ......................................................

.........................................................
අත්සන.

---

කාර්යාලීය ප්‍රයෝජනය සඳහා

නිර්දේශය

ගරු සභාපතිතුමාගේ අනුමැතිය

*02 උපලේඛනය*

*දැන්වීම් පුවරු සම්බන්ධව*

(වර්ග අඩියට රුපියල්)

| අනු අංකය | පුවරුවේ ස්වභාවය | දින 3 හෝ ඊට අඩු | දින 3 - 7 | දින 7 - 14 | දින 14 - 30 | වසරක් |
|---|---|---|---|---|---|---|
| 01 | කිසියම් බිත්තියක් හෝ තාප්පයක ප්‍රචාරය කරනු ලබන ප්‍රචාරක දැන්වීම් | 01 | 02 | 03 | 05 | - |
| 02 | රෙදි ඩිජිටල් බැනර් සඳහා | 25 | 34 | 45 | 50 | 75 |
| 03 | තහඩු හෝ දැව මගින් ප්‍රදර්ශනය කරනු ලබන ප්‍රචාරක දැන්වීම් | 25 | 40 | 50 | 75 | 100 |
| 04 | විදුලිය යොදා ක්‍රියාත්මක කරනු ලබන ප්‍රචාරක දැන්වීම් | 25 | 40 | 50 | 75 | 100 |
| 05 | විද්‍යුත් උපකරණ යොදා කරනු ලබන ප්‍රචාරක දැන්වීම් | 25 | 40 | 50 | 75 | 100 |
| 06 | ප්ලාස්ටික් පුවරු හෝ ෆයිබර් පුවරු මගින් ප්‍රදර්ශනය කරනු ලබන ප්‍රචාරක දැන්වීම් | 20 | 30 | 40 | 50 | 75 |
| 07 | ඉටිරෙදි හෝ කාඩ් බෝඩ් මගින් කරනු ලබන ප්‍රචාරක දැන්වීම් | 03 | 05 | 07 | 10 | 25 |

## කඩුගන්නාව නගර සභාව

අතුරු ව්‍යවස්ථා

255 වැනි අධිකාරය වන නගර සභා ආඥාපනතේ 153 වැනි වගන්තියේ (1) වන උපවගන්තිය සමග කියවිය යුතු එකී ආඥාපනතේ 157 වැනි වගන්තියේ 9 (බ) වැනි උප වගන්තිය යටතේ නගර සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව කඩුගන්නාව නගර සභාව විසින් සාදන ලද පහත සඳහන් අතුරු ව්‍යවස්ථා 1989 අංක 12 දරන පළාත් සභා (ආනුශාංගික විධිවිධාන) පනතේ 2 වැනි වගන්තිය (1) වැනි උප වගන්තිය සමග කියවිය යුතු ඉහත කී නගර සභා ආඥාපනතේ 154 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව මධ්‍යම පළාත් සභාවේ පළාත් පාලන විෂය භාර අමාත්‍ය සරත් ඒකනායක වන මා විසින් අනුමත කරනු ලැබූ බවත් මෙම නිවේදනය ගැසට් පත්‍රයේ පළකරනු ලැබූ දින සිට එකී අතුරු ව්‍යවස්ථා කඩුගන්නාව නගර සභා බල ප්‍රදේශයේ බලපවත්වන බවත් මෙයින් නිවේදනය කරමි.

සරත් ඒකනායක,
මධ්‍යම පළාතේ ප්‍රධාන අමාත්‍ය හා පළාත් පාලන විෂයභාර අමාත්‍ය.

2014 සැප්තැම්බර් මස 15 වැනි දින,
මහනුවර,
මධ්‍යම පළාතේ පළාත් සභාවේ,
ප්‍රධාන අමාත්‍ය කාර්යාලයේ දී ය.

*අවමංගල්‍ය සේවා සැපයුම් ස්ථාන පිළිබඳ අතුරු ව්‍යවස්ථාව*

01. මෙම අතුරු ව්‍යවස්ථාව කඩුගන්නාව නගර සභා බල ප්‍රදේශයේ අවමංගල්‍ය සේවා සැපයුම් ස්ථාන විධිමත් කිරීම අධීක්ෂණය කිරීම හා පාලනය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව ලෙස හැඳින්වේ.

02. කඩුගන්නාව නගර සභා බල ප්‍රදේශයේ අවමංගල්‍ය සේවා සැපයුම් ස්ථාන විධිමත් කිරීම අධීක්ෂණය කිරීම හා පාලනය කිරීම සඳහා පනවනු ලැබේ.

03. කිසියම් තැනැත්තෙකු විසින් කඩුගන්නාව නගර සභාවේ සභාපතිවරයාගෙන් ලබා ගත් බලපත්‍රයක් යටතේ හැර අවමංගල්‍ය සේවා සැපයීමේ ස්ථානයක් පවත්වාගෙන නොයා යුතුයි.

04. තුන්වන අතුරු ව්‍යවස්ථාව යටතේ නිකුත් කරනු ලබන සෑම බලපත්‍රයක්ම සභාපතිවරයා විසින් කලින් අවලංගු කරනු ලැබුවහොත් මිස එය නිකුත් කරනු ලැබුවේ යම් වර්ෂයක් වෙනුවෙන් ද ඒ වර්ෂයේ දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් විය යුතුය.

05. මෙම අතුරු ව්‍යවස්ථාවේ සඳහන් නියමයන් ඒ ආකාරයෙන් ම සම්පූර්ණ කර ඇත්තේ නම් මිස කඩුගන්නාව නගර සභාවේ සභාපතිවරයා විසින් අවමංගල්‍ය සේවා සැපයුම් ස්ථානයකට බලපත්‍රයක් නිකුත් නොකළ යුතු ය.

(i) අවමංගල්‍ය සේවා සැපයුම් ස්ථානයක් පවත්වාගෙන යනු ලබන ගොඩනැගිල්ලේ ඇතුලත මෘතදේහ සැකසීම පිණිස වෙන්වූ කාමරයක් තිබිය යුතු අතර, එකී කාමරයේ එක් පුද්ගලයෙකුගේ මෘත දේහයක් සැකසීම සඳහා අවම වශයෙන් වර්ග මීටර් නවයකට නොඅඩු ඉඩ කඩක් තිබිය යුතු ය. එසේම එකී කාර්යය සිදු කිරීමට ප්‍රමාණවත් කොන්ක්‍රීට් වේදිකාවක් තිබිය යුතු වන අතර එය පිඟන් ගඩොලින් බැඳ මනා නිමාවකින් තිබිය යුතු ය.

(ii) මෘත දේහ සැකසීම කරනු ලබන කාමරය සෑම විටම අවමංගල්‍ය සේවා සැපයුම් ස්ථානයේ ප්‍රදර්ශන ශාලාවෙන් වෙන් වී තිබිය යුතු අතර බාහිර පුද්ගලයන්ට අවසරයකින් තොරව ඇතුළුවීම වලක්වා තිබිය යුතු ය.

(iii) මෘත දේහ සැකසීම කරනු ලබන කාමරයේ අභ්‍යන්තරයට පිරිසිදු වාතය ලැබෙන පරිදි කාමරයේ වර්ගඵලයෙන් හතෙන් එකකට නොඅඩු ප්‍රමාණයක කවුළු සකසා තිබිය යුතුය.

(iv) මෘත දේහ සැකසීම කිරීමේදී ඉවත් කරනු ලබන මෘත ශරීර කොටස් තාවකාලිකව බහාලීමට ප්‍රමාණවත් භාජන තිබිය යුතු අතර එකී කාර්යය කරන අවස්ථාවේදී මෘත ශරීරයෙන් බැහැර වන ලේ හෝ වෙනත් යම් දියර හෝ මෘත දේහ සේදීම කරනු ලබන්නේ නම් එකී අප ජලය රැස්කර ගැනීම සඳහා අපාරගම්‍ය හා මැස්සන් මීයන් හෝ වෙනත් සතුන්ට ප්‍රවේශ විය නොහැකි වන සේ හොඳින් වසා තැබිය හැකි ආකාරයේ භාජන තබා තිබිය යුතු අතර එම අපද්‍රව්‍ය කිසිම හේතුවක් නිසා පොදු කාණුවකට පොදු ඇල මාර්ගයකට හෝ එළිමහන් භූමියකට ගලා යාමට ඉඩ සැලැස්වීම නොකළ යුතු ය.

(v) බලපත්‍ර ගත් ස්ථානයේ මහජන ගෞරවය පිණිස මෘත දේහ තබා ගැනීමට ඉඩ සලසා ඇති විට කිසියම් මෘත දේහයකට අවසන් ගෞරව දැක්වීමට පැමිණෙන තැනැත්තන්ගේ පහසුව පිණිස ප්‍රමාණවත් ආසන සංඛ්‍යාවක් තැබීමට හා එසේ පැමිණෙන අයගේ වාහන නැවතීමට ප්‍රමාණවත් ඉඩකඩ වෙන්කර තැබිය යුතු ය.

(vi) විකිණීම සඳහා තබා ඇති මෘත දේහ බහාලන පෙට්ටි (මිනි පෙට්ටි) හා මල් වඩම් ආදිය ප්‍රදර්ශනය කිරීමේදී එසේ ප්‍රදර්ශනය කරනු ලබන ශාලාව හෝ කාමරය කළු වීදුරු යොදා පිටතට නොපෙනෙන පරිදි සකස් කර තිබිය යුතු ය.

6. අවමංගල්‍ය සේවා ස්ථානයක් සඳහා බලපත්‍රයක් ලබා ගැනීමට අවශ්‍ය සෑම තැනැත්තෙකුම විසින් මේ කොටසේ පළමුවන උපලේඛනයේ සඳහන් ආකෘතියට පිළියෙල කර ගත් අයදුම්පත්‍රයක් කඩුගන්නාව නගර සභාවේ සභාපතිවරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

7. මෘත දේහයක් සැකසීමේදී ඉවත් කරනු ලබන හෝ ඉවත් වන මෘත ශරීර කොටස් මහෙස්ත්‍රාත්වරයෙකු හෝ හදිසි මරණ පරීක්ෂක වරයෙකු හෝ විසින් ඒ පිළිබඳව ලබා දී ඇති නියෝගයක් නොමැති නම් එකී කොටස් ඒ කාර්යය අවසන් වී පැය හයක් ගත වීමට මත්තෙන් පොලොවේ මතුපිට සිට මීටර් 1.2ක් ගැඹුරු වලක වල දමා මැනවින් වසා තැබිය යුතු ය.

8. මෘත දේහයක් සැකසීමේදී ඉවත් කරනු ලබන හෝ ඉවත් වන මෘත ශරීර කොටස් පිළිබඳව මහේස්ත්‍රත්වරයෙකු හෝ හදිසි මරණ පරීක්ෂකවරයෙකු හෝ විසින් නියෝගයක් කර ඇති විටක ඒ නියෝගයට අනුව ක්‍රියා කිරීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතු ය.

9. 7 වන අතුරු ව්‍යවස්ථාවේ කාර්යයන් සඳහා ප්‍රමාණවත් ඉඩකඩක් අවමංගල්‍ය සේවා සැපයුම් ස්ථානයේ නොමැති විටක සභාව විසින් කලින් කළ තීරණය කරනු ලබන ගාස්තුවක් ගෙවීමෙන් පසුව එකී කාර්යය කඩුගන්නාව නගර සභාවේ පොදු සුසාන භූමිය ඇතුළත මෙම අතුරු ව්‍යවස්ථාවේ නියම කර ඇති ගැඹුරක වල දමා වසා දැමිය යුතු ය.

10. මෘත දේහ සැකසීම කරන කාමරය නිරන්තර විෂබීජ නාශක යොදා පිරිසිදුව පවත්වා ගැනීම කළ යුතු ය.

11. මෘත දේහ සැකසීම කරනු ලබන කාමරවල වැඩ කරන සියළුම සේවකයන්ට කඩුගන්නාව නගර සභාවේ සභාපතිවරයා විසින් නිර්දේශ කරනු කරනු ලබන ආකාරයේ ආරක්ෂිත ඇඳුම්, මුවවැසුම් හා අත්වැසුම් ලබා දීම සහ මෘත දේහ සැකසීම කරනු ලබන අවස්ථාවේදී එකී සේවකයන් ඒ ඇඳුම් වලින් හා පැලඳුම් වලින් සැරසී අදාළ කාර්යයේ නියුක්ත වන බවට වගබලා ගැනීමට බලපත්‍රලාභියාගේ කර්යය විය යුතු ය.

12. බලපත්‍රලත් ස්ථානයේ සේවයේ යොදවා ඇති සියළුම සේවකයන් අවම වශයෙන් වර්ෂයකට එක් වතාවක් වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරවීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතු ය.

13. මෘත දේහ ප්‍රවාහනය කරනු ලබන රථය හෝ රථය ඇතුළත අවම වශයෙන් දිනකට එක් වතාවක් බැගින් රික්ත ශෝධක මගින් පිරිසිදු කර විෂබීජ නාශක යොදා තිබිය යුතු ය.

14. අධික වශයෙන් තුවාල සිදු වීම හේතුවෙන් හෝ වෙනත් යම් හේතුවක් නිසා සැකසීම කළ නොහැකි අන්දමින් පවතින මෘත දේහ හැර වෙනත් මෘත දේහ තැන්පත් කරනු ලබන පෙට්ටියක ඇතුළත හෝ මෘත දේහය සම්පූර්ණයෙන්ම හෝ ඉන් කොටසක් හෝ ආවරණය කිරීම පිණිස පොලිතීන් හෝ දිරාපත් නොවන වෙනයම් ද්‍රව්‍යයක් හෝ භාවිතා නොකළ යුතු ය.

15. කඩුගන්නාව නගර සභාවේ සභාපතිවරයා විසින් නියම කරනු ලබන කොන්දේසි වලට යටත්ව ඔහු විසින් ඒ වෙනුවෙන් බලපත්‍රලාභියාට දෙන ලිඛිත අවසරයක් ඇත්තේ නම් මිස කොළරාව, මහාමාරිය, වසූරිය, කහ උණ හෝ ඒඩ්ස් රෝගයෙන් මියගොස් ඇති බවට සැලකෙන කිසියම් තැනැත්තෙකුගේ මෘත දේහයක් ඇති බවට සැළකෙන කිසියම් තැනැත්තෙකු විසින් මෘත දේහයක් බලපත්‍ර ලත් තැන වෙත ගෙන ඒම හෝ ගෙන ඒමට ඉඩ දීම කවර හෝ තැනැත්තෙකු විසින් නොකළ යුතු ය.

16. කිසියම් මෘත දේහයක් සැකසීමට සහ අවමංගල්‍ය කටයුතු සංවිධානය පිණිස භාර ගැනීමට පෙර එකී මරණය සම්බන්ධයෙන් මරණ ලියාපදිංචි කිරීමේ නිලධාරියා විසින් නිකුත් කරනු ලැබූ විධිමත් මරණ සහතිකයක් තමා වෙත ඉදිරිපත් කර ඇත්තේ නම් මිස එකී කාර්යයන් සඳහා මෘත දේහයක් භාර ගැනීම බලපත්‍රලාභියා විසින් නොකළ යුතු ය.

17. කිසියම් මෘත ශරීරයකට අදාළ මරණය හදිසි මරණයක් වන විටක හෝ එකී මරණය සැක සහිත වන විටක මහෙස්ත්‍රාත් වරයෙකු විසින් කරනු ලැබූ හදිසි මරණ පරීක්ෂණයකින් අනතුරුව නිකුත් කරනු ලැබූ වාර්තාවක් තමා වෙත ඉදිරිපත් කරනු ලැබ ඇත්තේ නම් මිස එකී මෘත ශරීරය සැකසීම හෝ සැකසීම සඳහා බාර ගැනීම හෝ කවර හෝ තැනැත්තෙකු විසින් නොකළ යුතුය.

18. මහේස්ත්‍රාත්වරයෙකු හෝ හදිසි මරණ පරීක්ෂකවරයෙකු විසින් කරනු ලැබූ හදිසි මරණ පරීක්ෂණයකින් අනතුරුව නිකුත් කරනු ලැබූ වාර්තාවක් මගින් එකී මෘත දේහයේ අවසන් කටයුතු සම්බන්ධයෙන් දෙනු ලැබ ඇති කිසියම් නියෝගයක් වේ නම් බලපත්‍රලාභියා විසින් එකී නියෝගයේ විධිවිධාන පිළිපදිනු ලැබිය යුතු ය.

19. මහජන ගෞරවය පිණිස මෘත දේහයක් තබනු ලබන ස්ථානය පිරිසිදුව හා සෞඛ්‍යාරක්ෂිතව පවත්වා ගැනීමට සැලැස්වීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතු ය.

20. අවමංගල්‍ය සේවා සැපයුම් ස්ථානය ආසන්නයේ පදිංචිකරුවන්ට කරදරකාරී වන්නා වූ හෝ පීඩාකාරී වන්නා වූ හෝ කවර කාර්යයක් අවමංග්‍ය සේවා ස්ථානයේ පරිශ්‍රය තුළ දී සිදු කිරීම හෝ එසේ කිරීමට ඉඩ දීම හෝ කවර හෝ තැනැත්තෙකු විසින් නොකළ යුතු ය.

21. ඉහතින් දැක් වූ අතුරු ව්‍යවස්ථා එකක් හෝ කිහිපයක් හෝ සියල්ලම හෝ උල්ලංඝනය කිරීම වරදක් වන අතර නිසි බලය ඇති අධිකරණයක් මගින් වරදකට වරදකරු කරනු ලැබූ විට නියම කළ හැකි උපරිම දඩය හා එම කඩ කිරීම හෝ උල්ලංඝනය කිරීම නොකඩවා තවදුරටත් කරගෙන යන විටක ඒ පිළිබඳව වරදකරු කිරීමෙන් පසුව හෝ එම උල්ලංඝනය ගැන අවධානය යොමු කරමින් සභාපතිවරයා විසින් බලයලත් වෙනත් නිලධාරියෙකු විසින් ලිඛිත දැන්වීමක් භාර දෙනු ලැබීමෙන් පසුව කඩ කිරීම හෝ උල්ලංඝනය තව දුරටත් නොකඩවා කරගෙන යන සෑම එක් දිනක් සඳහා ම නියම කළ හැකි අතිරේක දණ්ඩනයේ උපරිම දඩය 255 වන අධිකාරය වන නගර සභා ආඥා පනතේ 153 වගන්තියේ (2) වන උප වගන්තියෙන් අනුව නියම කළ හැකිය.

22. 21 වන අතුරු ව්‍යවස්ථාව යටතේ නියම කරන දඩ මුදල් හා බලපත්‍ර ගාස්තු සභාවේ පොදු අරමුදලට බැරවිය යුතුය.

23. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස

a ''සභාව'' යන්නෙන් කඩුගන්නාව නගර සභාව ද,

b ''සභාපති '' යන්නෙන් කඩුගන්නාව නගර සභාවේ සභාපතිවරයා ද

c ''බලය පවරනු ලැබූ නිලධාරියා'' යන්නෙන් කඩුගන්නාව නගර සභාවේ සභාපතිවරයා විසින් බලය පවරනු ලැබූ නිලධාරියා ද

d ''අවමංගල්‍ය සේවා සැපයුම් ස්ථානය'' යන්නෙන් කිසියම් මෘත ශරීරයක් කල් තබා ගැනීමට හැකිවන පරිදි සැකසීම කරනු ලබන හෝ මෘත ශරීරයක් අවසන් කටයුතු සඳහා සැකසීම කරනු ලබන හෝ අවසන් කටයුතු කිරීමට සුසාන භූමියක් දක්වා ගෙනයනු ලබන තෙක් කිසියම් මුදලක් අයකර මහජන ගෞරවය පිණිස තබා තිබෙන ස්ථානයක් ද,

e "මෘත දේහ සැකසීම" යන්නෙන් මියගිය පුද්ගලයෙකුගේ මෘත දේහය අවසන් ගෞරවය පිණිස කල් තබා ගැනීමට හැකිවන වන ආකාරයට පිළියෙල කිරීම, එකී මෘත දේහයට ඇඳුම් ඇන්දවීම මෘත දේහය යම් පෙට්ටියක තැන්පත් කිරීම හා එකී කාර්යය සඳහා අවශ්‍ය වන වෙනත් ඕනෑම කාර්යයක් සිදු කිරීම ද,

f ''මෘත ශරීර කොටස්'' යන්නෙන් මියගිය පුද්ගලයෙකුගේ මෘත දේහයෙන් ඉවත් කරනු ලබන යම් ශරීර අවයවයක් හෝ ඉන් කොටසක් හෝ අභ්‍යන්තර කොටසක් හෝ මෘත ශරීරයෙන් බැහැර වන හෝ බැහැර කරන ලේ හෝ වෙනත් දියරයක් හෝ මියගිය අය ඒ අවස්ථාවේදී හැඳ සිටි යම් ඇඳුමක් හෝ ඇඳුම් හෝ ඉන් කොටසක් හෝ මිය ගිය අයගේ ශරීරයේ තිබූ කිසියම් තුවාලයක හෝ වෙනයම් හේතුවක් නිසා ඔහුගේ ශරීර අභ්‍යන්තරයේ තිබූ හෝ තිබෙන වෙලූ පටි, පුළුන් හෝ වෙන යම් ද්‍රව්‍යයක් ද අදහස් වේ.

23. මෙම අතුරු ව්‍යවස්ථාවේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් එවිට සිංහල පාඨයෙන් අර්ථ දැක්වෙන අදහස බලපැවැත්වේ.

07 - 279/5

## කඩුගන්නාව නගර සභාව

### අතුරු ව්‍යවස්ථා

255 වැනි අධිකාරය වන නගර සභා ආඥාපනතේ 153 වැනි වගන්තියේ (1) වන උපවගන්තිය සමග කියවිය යුතු එකී ආඥාපනතේ 157 වැනි වගන්තියේ 9 (ග) වැනි උප වගන්තිය යටතේ නගර සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව කඩුගන්නාව නගර සභාව විසින් සාදන ලද පහත සඳහන් අතුරු ව්‍යවස්ථා 1989 අංක 12 පළාත් සභා (ආනුශාංගික විධිවිධාන) පනතේ 2 වැනි වගන්තිය (1) වැනි උප වගන්තිය සමග කියවිය යුතු ඉහත කී නගර සභා ආඥාපනතේ 154 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව මධ්‍යම පළාත් සභාවේ පළාත් පාලන විෂය භාර අමාත්‍ය සරත් ඒකනායක වන මා විසින් අනුමත කරනු ලැබූ බවත් මෙම නිවේදනය ගැසට් පත්‍රයේ පළකරනු ලැබූ දින සිට එකී අතුරු ව්‍යවස්ථා කඩුගන්නාව නගර සභා බල ප්‍රදේශයේ බලපවත්වන බවත් මෙයින් නිවේදනය කරමි.

සරත් ඒකනායක,
මධ්‍යම පළාතේ ප්‍රධාන අමාත්‍ය හා පළාත් පාලන විෂයභාර අමාත්‍ය.

2014 සැප්තැම්බර් මස 15 වැනි දින,
මහනුවර,
මධ්‍යම පළාතේ පළාත් සභාවේ,
ප්‍රධාන අමාත්‍ය කාර්යාලයේ දී ය.

### පීඩාකාරී ව්‍යාපාර, අන්තරාදායක ව්‍යාපාර හා පීඩාකාරී හා අන්තරාදායක ව්‍යාපාර පිළිබඳ අතුරු ව්‍යවස්ථා

01. මෙම අතුරු ව්‍යවස්ථාව කඩුගන්නාව නගර සභා බල ප්‍රදේශය තුළ පීඩාකාරී ව්‍යාපාර, අන්තරාදායක ව්‍යාපාර හා පීඩාකාරී හා අන්තරාදායක ව්‍යාපාර විධිමත් කිරීම අධීක්ෂණය කිරීම, පාලනය කිරීම සහ ගාස්තු අයකිරීම සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස මෙම අතුරු ව්‍යවස්ථා පනවනු ලැබේ.

02. නගර සභාවේ සභාපතිවරයා විසින් තත්කාර්ය සඳහා නිකුත් කරන ලද බලපත්‍රයක් මත හැර, කිසිම තැනැත්තෙකු නගර සභා බල ප්‍රදේශය තුළ උපලේඛන වල දැක්වෙන පීඩාකාරී ව්‍යාපාරයක් හෝ අන්තරාදායක ව්‍යාපාරයක් හෝ පීඩාකාරී හා අන්තරාදායක ව්‍යාපාරයක් කරගෙන යාම නොකළ යුතුය.

03. කලින් අවලංගු නොකළහොත් මිස එවැනි සෑම බලපත්‍රයක්ම එය නිකුත් කරන ලද්දේ යම් වර්ෂයක් සඳහාද එම වර්ෂයේ දෙසැම්බර් මස 31 වෙනි දින දක්වා බල පැවැත්විය යුතුය.

04. ව්‍යාපාරයේ පරිශ්‍රය සහ එම කාර්යය සඳහා භාවිතයට ගනු ලබන යම් ගොඩනැගිල්ලක් වේ නම් එම ගොඩනැගිල්ල පහත සඳහන් කොන්දේසිවලට අනුකුල වන්නේ නම් මිස, කිසිදු තැනැත්තෙක් පීඩාකාරී ව්‍යාපාරයක් හෝ අන්තරාදායක ව්‍යාපාරයක් හෝ පීඩාකාරී හා අන්තරාදායක ව්‍යාපාරයක් කරගෙන යාම සඳහා බලපත්‍රයක් ලබාගැනීමට හිමිකමක් නොලබන්නේය.

(අ) පරිශ්‍රය හොඳ ප්‍රතිසංස්කරණ තත්ත්වයකින් සහ මනා වාතාශ්‍රයක් හා ආලෝකයක් ලැබෙන පරිදි සකස් කර තිබිය යුතු අතර, සෑම කාමරයක් විවෘත කළවිට ගෙබිමේ ප්‍රමාණයෙන් පහළොවෙන් පංගුවකට නොඅඩු ප්‍රමාණයේ ජනේල් සවිකර තිබිය යුතුය.

(ආ) සෑම කාමරයකම බිත්තිවල සෑම කොටසක උස මීටර් 2.14 ට නොඅඩු වියයුතු අතර, ගඩොල්, කළුගල්, කබොක් හෝ සිමෙන්ති ගල් වලින් සාදා තිබිය යුතුය. බිත්තිවල ඇතුල් පැති අවම වශයෙන් ගෙබිමේ සිට මීටර් 2 ක් උසට සිමෙන්ති බදාම යොදා කපරාදු කොට තිබිය යුතු අතර, ඉතිරි කොටස හුණු බදාම යොදා කපරාදු කොට වර්ණ ආලේප කර තිබිය යුතුය.

(ඇ) සෑම පියසි තෙළවරකම ගෙබිමේ සිට මීටර් 2 ට වැඩි උසකින් තිබිය යුතුය.

(ඈ) වහළය යම් ස්ථිර ද්‍රව්‍යයකින් සාදා තිබිය යුතුය.

(ඉ) දැව කර්මාන්ත සියල්ල තෙල් සායම් ගා හෝ හුණු ගා තිබිය යුතුය.

(ඊ) සම්පූර්ණ ගෙබිම සිමෙන්තියෙන් තනවා තිබිය යුතුය.

(උ) පරිශ්‍රය ප්‍රමාණවත් ජලවහනයක් සිදුවන පරිදි ඉදිකර තිබිය යුතුය.

(ඌ) පරිශ්‍රයෙහි සනීපාරක්ෂක කසල භාජන සහ ප්‍රමාණවත් වැසිකිළි පහසුකම් සපයා තිබිය යුතුය.

05. සෑම බලපත්‍රධාරියෙකුම ව්‍යාපාරය කරගෙන යාම සඳහා අවශ්‍යවන සියලු ද්‍රව්‍ය දුගඳ හැමීම හෝ වෙනත් පීඩාවක් ඇතිවීම වැළැක්වෙන පරිදි ගබඩාකර තැබිය යුතුය.

06. බලපත්‍රධාරියෙකු විසින් පීඩා ඇතිවීමට හෝ දුගඳ හැමීමට ඉඩ ඇති ද්‍රව්‍ය පොදු ස්ථානයක හෝ මංමාවත් ඔස්සේ රැගෙන යාමේදී කිසිදු පීඩාවක් ඇති නොවන සේ ආවරණය කරන ලද. උරා නොගන්නා භාජනවල දමා රැගෙන යා යුතුය.

07. සෑම බලපත්‍රධාරියෙකුම, යම් කිසි නිෂ්පාදන ක්‍රියාවලියකදී විමෝචනය වන පීඩාකාරී ශබ්ද වාෂ්ප හෝ වායු ඒවා විහිදී යාමේදී හානිකර හෝ පීඩාකාරී ප්‍රතිඵල හට ගැනීමට ඉඩ නොලැබෙන ආකාරයකින් හෝ උසකින් වායුගෝලයට මුදාහැරීම කළ යුතුය. නැතහොත් ගින්දර හෝ සනීකරණ උපකරණයක් තුලින් පිටවීමට සැලැස්විය යුතුය.

08. සෑම බලපත්‍රධාරියෙකුම, තම ව්‍යාපාරය කරගෙන යනු ලබන පරිශ්‍රයෙහි ප්‍රමාණවත් කාණු තනවා මැනවින් නඩත්තු කළයුතු අතර ඒවා දිනපතා සේදීම කළ යුතුය.

09. සෑම බලපත්‍රධාරියෙකුම ව්‍යාපාරය කරගෙන යනු ලබන පරිශ්‍රයෙහි ගෙබිම යම් අපාරගම්‍ය ද්‍රව්‍යයකින් ඉදිකරවිය යුතු අතර හොඳ ප්‍රතිසංස්කරණ තත්ත්වයෙන් නඩත්තු කිරීමත්, දිනපතා ශුද්ධ පවිත්‍ර කිරීමත් කළ යුතුය.

10. සෑම බලපත්‍රධාරියෙකුම ව්‍යාපාර කරගෙන යනු ලබන කාලයේදී, වාර්ෂිකව එම පරිශ්‍රයේ වර්ණ ආලේප කළ යුතුය.

11. සෑම බලපත්‍රධාරියෙකුම, ව්‍යාපාරික කටයුතුවලදී භාවිතා කරනු ලබන උපකරණ හා භාජන ඇතුළු සියලු ආම්පන්න පිරිසිදු කර තබාගත යුතුය.

12. සෑම බලපත්‍රධාරියෙකුම ව්‍යාපාරය කරගෙන යනු ලබන පරිශ්‍රයෙහි කසල, අතුගා එකතු කරනු ලබන බොල් රොඩු සමග අපතේ ගිය ද්‍රව්‍ය හා අතුරු නිෂ්පාදන ඒවා තවදුරටත් ව්‍යාපාර කටයුතු වලට වහාම නොයොදවන්නේ නම්, ආවරණය කරන ලද භාජනවල බහා දිනපතා නගර සභාවේ නියමය පරිදි ඉවත් කළ යුතුය.

13. සෑම බලපත්‍රධාරියෙකුම හම් හෝ වෙනත් ද්‍රව්‍යයක් සේදීම හෝ පෙඟවීම සඳහා භාවිතා කරනු ලබන ටැංකි, දුගඳ හැමීම වැළැක්වීම සඳහා අවශ්‍ය වන පරිදි හිස්කර පවිත්‍ර කළ යුතුය.

14. සෑම බලපත්‍රධාරියෙකුම යම් ගංගාවක්, දිය පාරක්, ඇලක්, සොරොව්වක්, ළිඳක්, වැවක් හෝ යම් කාණුවක් හෝ යම් අපවිත්‍ර, දුගඳ හමන හෝ පීඩාකාරී ජලය හෝ වෙනත් දියරයක් යැවීමෙන් හෝ ඒ තුළට ගලායාමට සැලැස්වීමෙන් හෝ පීඩාකාරී ද්‍රව්‍යයකින් සේදීමෙන් හෝ වෙනත් ආකාරයකින් හෝ එවැනි ගංගාවක්, දියපාරක්, ඇලක්, සොරොව්වක්, ළිඳක්, වැවක් හෝ විවෘත ජල ප්‍රදේශයක් අපවිත්‍ර කිරීම නොකළ යුතුය.

15. සභාපතිවරයා විසින් හෝ තත්කාර්ය සඳහා ඔහු විසින් සාමාන්‍යයෙන් හෝ විශේෂයෙන් බලය පවරන ලද නගර සභාවේ යම් නිලධාරියෙකු විසින් රාජකාරි වේලාවන් තුළදී පීඩාකාරී ව්‍යාපාරයක් හෝ අන්තරාදායක ව්‍යාපාරයක් හෝ පීඩාකාරී හා අන්තරාදායක ව්‍යාපාරයක් කරගෙන යනු ලබන පරිශ්‍රයකට ඇතුළුවී පරීක්ෂා කර බැලීම නීත්‍යානුකූල වන්නේය. තවද, බලපත්‍රලාභියා හෝ එහි පාලනය භාර තැනැත්තා එවැනි පරීක්ෂණයක් කිරීම සඳහා ඉඩදිය යුතු වන්නේය.

16. බලපත්‍ර පරිශ්‍රයක් මෙම අතුරු ව්‍යවස්ථාවල සඳහන් විධිවිධාන වලට අනුකූල නොවන බව පරීක්ෂණයකදී අනාවරණය වූ අවස්ථාවක යථෝක්ත පරිශ්‍රය මෙම අතුරු ව්‍යවස්ථාවල විධිවිධානවලට අනුකූල කරවීම සඳහා කළයුතු කාර්යයන්, නියමිත කාලයක් ඇතුළත දී ඉටුකරන ලෙස බලපත්‍රධාරියාට ලිඛිතව දැන්වීමට සභාපතිවරයාට බලය ඇත්තේය. තව ද, යථෝක්ත දැන්වීමේ විධිවිධාන ප්‍රකාර බලපත්‍රධාරියා විසින් ක්‍රියාකළ යුතුය. එසේ ක්‍රියා නොකරන්නේ නම්, එවැනි අවස්ථාවක බලපත්‍රය අවලංගු කිරීමට සභාපතිවරයාට බලය ඇත්තේය.

17. මෙම අතුරු ව්‍යවස්ථා යටතේ කිසියම් ව්‍යාපාරයක් කරගෙන යාම සඳහා බලපත්‍රයක් ලබාගැනීම පිණිස යම් තැනැත්තෙකු විසින් ඉදිරිපත් කරන ලද ඉල්ලුම්පත්‍රයක් තමා වෙත ලැබී දින 30 ක් ඇතුළත පරිශ්‍රය මෙම අතුරු ව්‍යවස්ථාවල අනුකූල වන්නේ නම් බලපත්‍රය නිකුත් කිරීම හෝ ඉල්ලීම ප්‍රතික්ෂේප කරන්නේ නම් ඊට හේතු ඉල්ලුම්කරුට දන්වා යැවීම සභාපතිවරයාගේ කාර්ය වන්නේය.

18. සෑම බලපත්‍රලාභියෙකු විසින්ම බලපත්‍රය සහ බලපත්‍රයට අදාළ කර්මාන්තයේ හෝ ව්‍යාපාරයේ සේවා නියුක්තිකයන්ගේ නම් සහ ලිපිනයන් සිංහල හා දෙමළ භාෂාවලින් දැක්වෙන ලැයිස්තුවක් බලපත්‍රලාභි ස්ථානයේ ප්‍රකටව පෙනෙන ස්ථානයක එල්ලා තැබීමට සැලැස්විය යුතුය.

19. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ කරනු ලබන සෑම දැන්වීමක්ම අවස්ථාවෝචිත පරිදි අයිතිකරු හෝ එම ස්ථානයේ භාරකරු වෙත භාරදිය යුතුය. එවැන්නෙකු නොමැති විට බලපත්‍රලාභී ස්ථානයේ ප්‍රකටව පෙනෙන පරිදි එල්ලා තැබිය යුතුය. එවැනි දැන්වීමකට ස්ථානයේ අයිතිකරුගේ හෝ පරිහරණය කරන අයගේ නම සඳහන් කිරීම අවශ්‍ය නොවිය යුතුය.

20. මෙම ආඥා පනතේ 164 වගන්තිය යටතේ බලපත්‍රයක් අවශ්‍ය වන්නාවූ කර්මාන්ත හෝ ව්‍යාපාර කිහිපයක් එකම ස්ථානයක පවත්වාගෙන යන්නාවූ අවස්ථාවක ඒ එක් එක් කර්මාන්තය හෝ ව්‍යාපාරය සඳහා ගෙවිය යුතු බලපත්‍ර ගාස්තුව එකී කර්මාන්තයේ හෝ ව්‍යාපාරයේ පාවිච්චි කරන නැතහොත් වෙන්කර ඇති භූමි වර්ග ප්‍රමාණය අනුව බලපත්‍ර ගාස්තු වෙන් වශයෙන් අයකළ යුතුය.

21. මේ අතුරු ව්‍යවස්ථාවල කවර වූ හෝ විධිවිධානයක් කඩකිරීම හෝ උල්ලංඝනය කිරීම වරදක් වන අතර, නිසි බලය ඇති අධිකරණයක් මගින් ඒ වරදකට වරදකරු කරනු ලැබූ විට නියම කළ හැකි උපරිම දඩය සහ එම කඩකිරීම හෝ උල්ලංඝනය නොකඩවා තවදුරටත් කරගෙන යන විටක ඒ පිළිබඳව වරදකරු කිරීමෙන් පසුව හෝ එම උල්ලංඝනය ගැන අවධානය යොමුකරමින් සභාපතිවරයා විසින් හෝ බලයලත් වෙන් නිලධාරියෙකු විසින් ලිඛිත දැන්වීමක් භාරදෙනු ලැබීමෙන් පසුව කඩකිරීම හෝ උල්ලංඝනය තවදුරටත් නොකඩවා කරගෙන යන සෑම එක් දිනයක් සඳහාම නියම කළහැකි අතිරේක දණ්ඩනයේ උපරිමය පිළිවෙලින් නගර සභා ආඥාපනතේ (255 වන අධිකාරය) 153 වගන්තියේ (2) වන උප වගන්තියෙන් නියම කර ඇති උපරිම දඩ මුදල හා අතිරේක දණ්ඩනයේ උපරිමය විය යුතුය.

22. 21 වන අතුරු ව්‍යවස්ථාව යටතේ නියම කරන දඩ මුදල් නගර සභාවේ පොදු අරමුදලට බැර විය යුතුය.

23. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස මෙම අතුරු ව්‍යවස්ථාවේ ;

"බලපත්‍රධාරියා" යන්නෙන් මෙම අතුරු ව්‍යවස්ථා යටතේ ව්‍යාපාරයක් කරගෙන යාම සඳහා බලපත්‍රයක් නිකුත් කරනු ලැබ ඇති යම් තැනැත්තෙකු අදහස් කරනු ලැබේ.

"තැනැත්තා" යන්නට සංස්ථාගත කරන ලද හෝ නොකරන ලද පුද්ගල මණ්ඩලයක් ද ඇතුළත් වේ.

"පාලනය භාර තැනැත්තා" යන්නට භාරකරුවෙක්, ආරක්ෂකයෙක්, දේපල ආරක්ෂකයෙක්, කළමණාකරුවෙක් හෝ යම් තැනැත්තෙක් වෙනුවෙන් යම් ව්‍යාපාරයක සංවිධානය, පාලනය හෝ කළමනාකරණය පැවරී ඇති වෙනත් තැනැත්තෙකුද ඇතුළත් වේ.

"සභාව" යන්නෙන් කඩුගන්නාව නගර සභාව අදහස් වේ,

"සභාපති" යන්නෙන් කඩුගන්නාව නගර සභාවේ සභාපතිවරයා අදහස් වේ,

"නගර සභා ප්‍රදේශය" යන්නෙන් කඩුගන්නාව නගර සභා බල ප්‍රදේශය අදහස් වේ.

"බලය පවරන ලද නගර සභාවේ යම් නිලධාරියෙක්" යන්නෙන් සභාපතිවරයා විසින් මෙම අතුරු ව්‍යවස්ථාව ක්‍රියාත්මක කිරීමට බලය පවරනු ලබන නිලධාරියා හෝ නිලධාරීන් අදහස් වේ.

24. මෙම අතුරු ව්‍යවස්ථාවේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් එවිට සිංහල පාඨයෙහි අර්ථ දැක්වෙන අදහස බලපැවැත්වේ.

***පළමුවන උපලේඛනය - පීඩාකාරී ව්‍යාපාර***

1. පොහොර හෝ රසායනික පොහොර නිපදවීම හෝ ගබඩාකර තබාගැනීම
2. සම් පදම් කිරීම
3. සම් විකිණීම
4. සත්ව පාලනය (මස්, කිරි හෝ බිත්තර සඳහා)
5. ඡායාරූප ශාලාවක් පැවැත්වීම
6. පශු වෛද්‍ය ගිලන්හලක් පැවැත්වීම
7. විකිණීම සඳහා නරක්වන සුළු කෑම වර්ග හෝ ආහාර ද්‍රව්‍ය ගබඩාකර තැබීම
8. කරවල, ලුණුමාළු හෝ ජාඩි කිලෝග්‍රෑම් 150 ට වැඩි ප්‍රමාණයක් තබාගැනීම
9. පොල් කටු අඟුරු හෝ දැව අඟුරු නිපදවීම හෝ අඟුරු ගබඩාකර තබාගැනීම
10. දුම්කොළ සකස් කිරීම හෝ ගබඩා කිරීමේ ස්ථානයක් පැවැත්වීම
11. සත්ව ආහාර නිපදවීම හෝ සත්ව ආහාර ගබඩාවක් පැවැත්වීම
12. පුන්නක්කු නිපදවීම හෝ කිලෝග්‍රෑම් 200 ට වැඩි ප්‍රමාණයක් ගබඩා කිරීම
13. සබන් නිෂ්පාදනය කිරීම
14. සත්ව ඇටකටු ඇඹරීම හෝ තබාගැනීම

15. අලුත් හෝ පරණ ලෝහ ගබඩාකර තබාගැනීම
16. ලෝහමය සුන්බුන් ද්‍රව්‍ය ගබඩා කිරීමේ ස්ථානයක් පැවැත්වීම
17. ගෘහ භාණ්ඩ නිපදවීම හෝ ගබඩාකර තබාගැනීම
18. වේවැල් භාණ්ඩ නිපදවීම
19. වඩු කර්මාන්ත ශාලාවක් පැවැත්වීම
20. සිරප් හෝ පලතුරු බීම වර්ග නිපදවීම
21. රසකැවිලි වර්ග නිපදවීම
22. පොල් ලෙලි පෙඟවීම (හෝ පල් කිරීම)
23. බුරුසු වර්ග නිපදවීම (දත් බුරුසු හැර)
24. දත් බුරුසු නිපදවීම
25. රා එකතු කිරීම
26. විනාකිරි නිපදවීම හෝ ගබඩා කිරීම
27. යන්ත්‍රානුසාරයෙන් හෝ අතින් දැව ඉරීමේ ස්ථානයක් පැවැත්වීම
28. පින්තාරු තීන්ත, වාර්නිෂ් හෝ ඩිස්ටෙම්පර් සායම් හෝ ඒවා ලීටර් 100ට වැඩි ප්‍රමාණයක් ගබඩාකර තබා ගැනීම
29. සෝඩා නිපදවීම
30. සම් භාණ්ඩ නිපදවීම
31. පලතුරු, මාළු හෝ වෙනත් ආහාර වර්ග ටින්වල ඇසිරීම
32. මිරිස්, කෝපි, ධාන්‍ය වර්ග, මාංශභෝග, කුළු බඩු හෝ පිටි ඇඹරීම සඳහා ඇඹරුම්හලක් පැවැත්වීම
33. ඉටිපන්දම් නිපදවීම
34. කපුරු නිපදවීම
35. ලියන තීන්ත, අච්චු තීන්ත හෝ ස්ටෙන්සිල් තීන්ත නිපදවීම
36. රෙදි සෝදන නිල් නිපදවීම
37. ලාකඩ නිපදවීම
38. සුවඳ විලවුන් නිපදවීම හෝ ගබඩාකිරීමේ ස්ථානයක් පැවැත්වීම
39. පාසැල් රටහුණු නිපදවීම
40. ටයර් හෝ ටියුබ් 50 ට වැඩි ප්‍රමාණයක් ගබඩාකර තබාගැනීම
41. ටයර් නැවත පිරවීම
42. ටයර් ටියුබ් වෝල්කනයිස් කිරීමේ ස්ථානයක් පැවැත්වීම
43. සිමෙන්ති කිලෝග්‍රෑම් 1000 ට වැඩි ප්‍රමාණයක් ගබඩාකර තබාගැනීම
44. සිමෙන්ති භාණ්ඩ හෝ ඇස්බැස්ටෝස් සිමෙන්ති භාණ්ඩ නිපදවීම
45. ප්ලාස්ටික් භාණ්ඩ නිපදවීම
46. යන්ත්‍රානුසාරයෙන් රෙදි විවීම
47. පොහොර, හුණු පිටි හෝ වෙනත් ද්‍රව්‍යයන් දමා තිබූ ගෝනි පිරිසිදු කර විකිණීම
48. යන්ත්‍රානුසාරයෙන් සිමෙන්ති බ්ලොක්ගල් නිපදවීම
49. ධාන්‍ය හෝ මාංශබෝග කිලෝග්‍රෑම් 250 ට වැඩි ප්‍රමාණයක් ගබඩාකර තබාගැනීම

*දෙවන උපලේඛනය - අන්තරාදායක ව්‍යාපාර*

1. තොග වශයෙන් විකිණීම සඳහා පිටි, ලුණු හෝ සීනි කිලෝග්‍රෑම් 750 ට වැඩි ප්‍රමාණයක් ගබඩාකර තැබීම
2. මැසූ ඇඳුම් නිෂ්පාදනය කිරීම
3. මුද්‍රණාලයක් පැවැත්වීම
4. කුකුළන් 100 ට වැඩි ප්‍රමාණයක් සඳහා කුකුල් ගාලක් හෝ කුකුල් කොටුවක් පැවැත්වීම
5. එළුවන්, ඌරන් 10 ට වැඩි ප්‍රමාණයක් සඳහා ගාලක් හෝ මඩුවක් පැවැත්වීම
6. ගඩොල් හෝ උළු ගබඩාකර තබාගැනීම
7. දර ගබඩාවක් පැවැත්වීම
8. කළුගල් කැණීම හෝ කැඩීම යන්ත්‍රානුසාරයෙන් හෝ අතින්
9. සිසිල් බීම නිෂ්පාදනය හෝ සිසිල්බීම බෝතල් 100 ට වැඩි ප්‍රමාණයක් ගබඩාකිරීම
10. අයිස්ක්‍රීම් නිෂ්පාදනය
11. පොල්තෙල් නිෂ්පාදනය හෝ ලීටර් 300 ට වැඩි ප්‍රමාණයක් ගබඩා කිරීම
12. ගිනිපෙට්ටි නිෂ්පාදනය හෝ දුසිම් 100 ට වැඩි ප්‍රමාණයක් ගබඩා කිරීම
13. කොහු හෝ වෙනත් කෙඳි වර්ග වලින් භාණ්ඩ නිෂ්පාදනය හෝ ගබඩා කිරීම
14. පාවිච්චි කළ ඇඳුම් ගබඩා කිරීම
15. ස්වර්ණාභරණ නිෂ්පාදනය කිරීම හෝ අලුත්වැඩියා කිරීම

16. යන්ත්‍රානුසාරයෙන් ලී ඉරීම
17. යන්ත්‍රෝපකරණ පාවිච්චි කරන කම්හලක් පැවැත්වීම
18. හිස් ගෝනි හෝ හිස් බෝතල් ගබඩාකර තබාගැනීම
19. පාපැදි හෝ යතුරු පැදි අලුත්වැඩියා කිරීමේ වැඩපලක් පැවැත්වීම
20. පාවිච්චි කරන ලද කඩදාසි හෝ පත්තර ගබඩාකර තබාගැනීම
21. විසිරි පින්තාරු කිරීමේ ස්ථානයක් පැවැත්වීම
22. ගිනිකෙළි භාණ්ඩ හෝ රතිඤ්ඤා ගබඩා කිරීම හෝ නිපදවීම
23. පොල්තෙල් හැර වෙනත් එළවළු තෙල් ලීටර් 50 ට වැඩි ප්‍රමාණයක් ගබඩා කිරීම
24. ශීතකළ මස් හෝ මාළු ගබඩාකර තබාගැනීම
25. දැව ගබඩා කිරීම

*තෙවන උපලේඛනය - පීඩාකාරී හා අන්තරාදායක ව්‍යාපාර*

1. රසායනික ද්‍රව්‍ය පාවිච්චි කර කුරුඳු, කරදමුංගු, එනසාල් හෝ කෙඳි වර්ග සකස් කිරීම
2. ඩ්‍රයික්ලීන් කිරීම හෝ සායම් දැමීම
3. රෙදි මුද්‍රණය කිරීම හෝ සායම් දැමීම
4. විද්‍යුත් ලෝහ ආලේපනය කිරීමේ ස්ථානයක් පැවැත්වීම
5. හුණුගල් හෝ හිරිගල් පිළිස්සීම, සකස් කිරීම හෝ අලුහුණු ගබඩා කිරීම
6. බැටරි විද්‍යුත් ආරෝපණය කිරීම හෝ අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පැවැත්වීම
7. මෝටර් වාහන අළුත් වැඩියා කිරීමේ ස්ථානයක් පැවැත්වීම
8. මෝටර් වාහන සේවා කිරීමේ ස්ථානයක් පැවැත්වීම
9. වාත්තු මඩුවක් පවත්වාගෙන යාම
10. බෙලෙක් වැඩපලක් පවත්වාගෙන යාම
11. ගෑස් සිලින්ඩර ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
12. ආයුර්වේද ඖෂධ, දේශීය ඖෂධ නිෂ්පාදනය කිරීම හෝ සංයෝජනය කිරීම
13. වීදුරු භාණ්ඩ හෝ වීදුරු තහඩු ගබඩා කිරීම
14. ප්ලාස්ටික් හෝ ෆයිබර් ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්ත ශාලාවක් පැවැත්වීම
15. කිලෝග්‍රෑම් 150 වැඩියෙන් තේ කුඩු ගබඩාකර තබාගැනීම
16. වෑල්ඩිං සඳහා ස්ථානයක් පැවැත්වීම
17. ලියවන පට්ටලයක් භාවිතා කරමින් වැඩපලක් පැවැත්වීම
18. පැට්‍රෝල්, ඩීසල්, තෙල් හෝ වෙනත් යම් ඛනිජ තෙල් වර්ගයක් ගබඩාකොට ඇති ස්ථානයක් පවත්වාගෙන යාම
19. කෘෂි රසායනික ද්‍රව්‍ය නිපදවීම හෝ ගබඩා කිරීම
20. වායුසමනය යන්ත්‍ර, ශීතකරණ හෝ අධි ශීතකරණ සර්විස් කිරීම හෝ අලුත්වැඩියා කිරීම
21. විදුලි කර්මාන්ත වැඩපලක් හෝ විදුලි උපකරණ නිපදවන හෝ අලුත්වැඩියා කිරීමේ වැඩපලක් පවත්වාගෙන යාම
22. කිරි ශීතකිරීමේ මධ්‍යස්ථානයක් පැවැත්වීම

07 - 279/6

---

**කඩුගන්නාව නගර සභාව**

අතුරු ව්‍යවස්ථා

255 වැනි අධිකාරය වන නගර සභා ආඥාපනතේ 153 වැනි වගන්තියේ (1) වන උපවගන්තිය සමග කියවිය යුතු එකී ආඥාපනතේ 157 වැනි වගන්තියේ 6 (අ) වැනි උප වගන්තිය යටතේ නගර සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව කඩුගන්නාව නගර සභාව විසින් සාදන ලද පහත සඳහන් අතුරු ව්‍යවස්ථා 1989 අංක 12 පළාත් සභා (ආනුශාංගික විධිවිධාන) පනතේ 2 වැනි වගන්තිය (1) වැනි උප වගන්තිය සමග කියවිය යුතු ඉහත කී නගර සභා ආඥාපනතේ 154 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව මධ්‍යම පළාත් සභාවේ පළාත් පාලන විෂය භාර අමාත්‍ය සරත් ඒකනායක වන මා විසින් අනුමත කරනු ලැබූ බවත් මෙම නිවේදනය ගැසට් පත්‍රයේ පළකරනු ලැබූ දින සිට එකී අතුරු ව්‍යවස්ථා කඩුගන්නාව නගර සභා බල ප්‍රදේශයේ බලපවත්වන බවත් මෙයින් නිවේදනය කරමි.

සරත් ඒකනායක,
මධ්‍යම පළාතේ ප්‍රධාන අමාත්‍ය හා පළාත් පාලන විෂයභාර අමාත්‍ය.

2014 සැප්තැම්බර් මස 15 වැනි දින,
මහනුවර,
මධ්‍යම පළාතේ පළාත් සභාවේ,
ප්‍රධාන අමාත්‍ය කාර්යාලයේ දී ය.

## ක්‍රීඩාභූමි පිළිබඳ අතුරු ව්‍යවස්ථාව

01. මෙම අතුරු ව්‍යවස්ථාව කඩුගන්නාව නගර සභාවේ ක්‍රීඩාභූමි පාලනය කිරීම සහ ගාස්තු අයකිරීමේ අතුරු ව්‍යවස්ථා යනුවෙන් හඳුන්වනු ලැබේ.

02. මෙම අතුරු ව්‍යවස්ථාව කඩුගන්නාව නගර සභාව සභා බල ප්‍රදේශය තුල ක්‍රීඩාභූමි පාලනය කිරීම, විධිමත් කිරීම සහ ගාස්තු අයකිරීම සඳහා පනවනු ලැබේ.

03. කඩුගන්නාව නගර සභාව සතු ක්‍රීඩාභූමියක් ප්‍රයෝජනයට ගැනීම සඳහා වූ අවසර පත්‍රයක් ලබාගැනීමට අපේක්ෂා කරන යම් තැනැත්තෙකු විසින් මෙම නගර සභාව විසින් නියම කරනු ලැබූ ආකෘති පත්‍රය සභාපතිවරයා වෙතින් හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියෙකු වෙතින් ලබා ගෙන අයදුම් කළ යුතුය.

04. යම් විශේෂ උත්සව පැවැත්වීම්, ක්‍රීඩා තරග, සංදර්ශන, සැණකෙළියක්, රැස්වීමක් හෝ ඒ හා සමාන ස්වරූපයේ කටයුතු සඳහා ක්‍රීඩාපිටිය වෙන්කර ගැනීම සඳහා වන ඉල්ලීමකදී අතුරු ව්‍යවස්ථාවේ පළමුවන උපලේඛනයට අනුකූල අයදුම්පත්‍රයක් මගින් යටත් පිරිසෙන් සතියකට පෙර ඉල්ලීම කළ යුතුය.

(අ) ක්‍රීඩා භූමි ප්‍රයෝජනයට ගැනීම සඳහා වූ සෑම අයදුම්පත්‍රයක්ම සභාපතිවරයා විසින් එම අයදුම්පත්‍ර නගර සභා කාර්යාලයට ලැබුණු අනුපිළිවෙල සලකා බැලිය යුතු අතර, ක්‍රීඩාභූමිය ප්‍රයෝජනයට ගැනීම සඳහා වූ සෑම ඉල්ලීමක්ම අනුමත කොන්දේසිවලට අනුව ලබාදීම හෝ ප්‍රතික්ෂේප කිරීම කළහැකි අතර, අවස්ථාවෝචිත පරිදි සුදුසු යැයි හැඟෙන කොන්දේසියක් ද පනවා අවසර දීම ක්‍රියාත්මක කළ හැකිය.

(ආ) ක්‍රීඩාභූමිය ප්‍රයෝජනයට ගැනීම සඳහා ලබාදීමට හෝ ප්‍රතික්ෂේප කිරීමට සභාපතිවරයා විසින් ගන්නා තීරණය නොපමාව ඉල්ලුම්කරුට දැන්විය යුතුය.

(ඇ) ක්‍රීඩාභූමිය පාවිච්චි කිරීමට දෙන්නේ නම් සභාව විසින් කලින් කලට තීරණය කර ගැසට්පත්‍රය මගින් ප්‍රකාශයට පත්කරනු ලබන ගාස්තු හා ඇප මුදල් ප්‍රමාණය ද දින 05 කට පෙර ගෙවන ලෙසට අයදුම්කරුට දැන්විය යුතුය.

(ඈ) ඉහත කී පරිදි නියමිත ගාස්තුව හා ඇප මුදල් අයදුම්කරු විසින් සභාපතිවරයා නියම කරනු ලැබ ඇති කාලසීමාව ඇතුළත ගෙවූ විට ක්‍රීඩාභූමිය ප්‍රයෝජනයට ගැනීම සඳහා වූ අවසර පත්‍රයක් එකී අයදුම්කරුට නිකුත් කරනු ලැබිය යුතුය.

05. ඉහත අතුරු ව්‍යවස්ථාවේ කාර්යයන්ට හැර මෙහි දැක්වෙන ආකාරයට හා මෙහි අඩංගු විධිවිධානවලට අනුකූලව ක්‍රීඩාභූමිය ප්‍රයෝජනයට ගැනීම සඳහා වූ බලපත්‍රයක් තමා විසින් ලබාගෙන ඇත්නම් මිස කවර හෝ වේලාවක කවර හෝ කාර්යයක් සඳහා ක්‍රීඩාභූමිය ප්‍රයෝජනයට ගැනීමට කිසිම තැනැත්තෙකුට අවසර නොදිය යුතුය.

06. ආපසු ගෙවීම් :-

(අ) ක්‍රීඩාභූමිය වෙන්කිරීම අවලංගු කරන බවට ලිඛිත දැන්වීමක් ක්‍රීඩාභූමි වෙන්කර ගත් දිනයට යටත් පිරිසෙයින් අවම වශයෙන් දින තුනකට කලින් සභාපතිවරයාට ලැබුණහොත් මිස කිසිම ගාස්තුවක් හෝ එහි කොටසක් ආපසු ගෙවිය නොහැක.

(ආ) වෙන්කර ගැනීමක් අවලංගු කරන බවට නිසි දැන්වීමක් සභාපතිවරයාට ලැබී ඇති අවස්ථාවක ගෙවා ඇති ගාස්තුවලින් සභාවට වියදම්වී ඇති මුදල අඩුකර, ඉතිරි මුදලද එසේත් නැත්නම් මුළු මුදලද ඇප තැන්පත් මුදල සමග ආපසු ගෙවිය හැක. කෙසේ වුවද අවලංගු කරන ලද වෙන්කර ගැනීම නිසා වෙනත් යම් ඉල්ලුම්කරුවෙකුට ක්‍රීඩා භූමි ලබාදීමට ප්‍රතික්ෂේප කිරීමට සිදුවූයේ නම්, ඇප තැන්පත් මුදල හැර වෙනත් කිසිම මුදලක් ආපසු ගෙවීමක් නොකළ යුතුය.

07. ක්‍රීඩාභූමි වෙන්කර ගන්නා කාර්යය හා වේලාව :-

(අ) අවසරපත්‍රය නිකුත් කරනු ලබන කාර්යය හැර වෙනත් කිසිම කාර්යයක් තුළදී අවසරපත්‍රලාභියා විසින් ක්‍රීඩාභූමිය ප්‍රයෝජනයට නොගත යුතුය. අවසරපත්‍රයේ ලිඛිතව සඳහන් කාලය තුළ පමණක් ක්‍රීඩාභූමිය ප්‍රායෝජනයට ගැනීමට අවසරපත්‍රලාභියෙකුට හිමිකම් තිබිය යුතුය.

(ආ) අවසරපත්‍රයේ නිශ්චිතව සඳහන් කාලසීමාව ඉකුත්වූ විට සභාපතිවරයා හෝ ඔහු විසින් නිසි බලය දෙන ලද නිලධාරියෙකුට ක්‍රීඩාභූමිය පරිහරණය කරන අතිරික්ත කාලපරිච්ජේදය සඳහා මෙම අතුරු ව්‍යවස්ථාවේ තෙවන අතුරු ව්‍යවස්ථාව අනුව, නිශ්චිතව සඳහන් ගාස්තු ප්‍රමාණවලට අමතරව සභාව විසින් තීරණය කරනප්‍රකාශයට පත් කරන්නට යෙදී ඇති අතිරේක ගාස්තු ගෙවීමට යටත් වන්නේය.

(ඇ) එම ගාස්තු ඔහුගේ ඇප තැන්පතුවෙන් අඩුකර ගත යුතුය. සභාපතිවරයා විසින් නිසි ලෙස දෙනලද බලය මත යම් නිලධාරියෙකුට අවශ්‍ය වන විටක පරීක්ෂා කිරීම සඳහා අවසරපත්‍රධාරියා විසින් එම අවසරපත්‍රය ඉදිරිපත් කළයුතු අතර, එම අවසරපත්‍රය එම නිලධාරියාට ඉදිරිපත් කරනු නොලැබුවහොත් අවසරපත්‍රලාභියාට ක්‍රීඩාභූමිය ප්‍රායෝජනයට ගැනීමට ඉඩ නොදිය යුතුය.

08. තෙවන අතුරු ව්‍යවස්ථාව අනුව සභාපතිවරයා විසින් නිකුත් කරනු ලබන අවසරපත්‍රයක් අවසරපත්‍රධාරියා විසින් අන්සතු නොකළ යුතුය.

09. බලපත්‍රලාභියා විසින් සභාව සතු දේපළ හා උපකරණ ආරක්ෂා කිරීමට බැඳී සිටිය යුතුය. දේපලවලට හා උපකරණවලට යම් හානියක් සිදුවී ඇත්නම් ඒවා යථා තත්ත්වයට පත්කර ආපසු භාරදිය යුතුය.

10. 09 වන අතුරු ව්‍යවස්ථාවේ සඳහන් පරිදි ක්‍රියා නොකරන්නේ නම්, සභාපතිවරයා විසින් ගණනය කරනු ලබන අලාභය ඇප මුදලින් අයකර ගැනීමේ බලය සභාව සතුය.

11. බලපත්‍රයේ සඳහන් ක්‍රියාකාරකම්වලදී බලපත්‍රලාභියාට හෝ වෙනත් යම් පාර්ශවයකට සිදුවන අලාභ හෝ ආපදා සම්බන්ධයෙන් නගර සභාව වගකියනු නොලැබේ.

12. මේ අතුරු ව්‍යවස්ථාවල කවර වූ හෝ විධිවිධානයක් කඩකිරීමක් හෝ උල්ලංඝනය කිරීම වරදක් වන අතර නිසි බලය ඇති අධිකරණයක් මගින් ඒ වරදකට වරදකරු කරනු ලැබූ විට නියම කළ හැකි උපරිම දඩය සහ එම කඩකිරීම හෝ උල්ලංඝනය නොකඩවා තවදුරටත් කරගෙන යන විටක ඒ පිළිබඳව වරදකරු කිරීමෙන් පසුව හෝ එම උල්ලංඝනය ගැන අවධානය යොමුකරමින් සභාපතිවරයා විසින් හෝ බලයලත් වෙනත් නිලධාරියෙකු විසින් ලිඛිත දැන්වීමක් භාරදෙනු ලැබීමෙන් පසුව කඩකිරීම් හෝ උල්ලංඝනය තවදුරටත් නොකඩවා කරගෙන යන සෑම එක් දිනයක් සඳහාම නියම කළ හැකි අතිරේක දණ්ඩනයේ උපරිමය පිළිවෙලින් නගර සභා ආඥා පනත 153 වගන්තියේ (2) වන උපවගන්තියෙන් නියම කර ඇති උපරිම දඩ මුදල හා අතිරේක දණ්ඩනයේ උපරිම විය යුතුය.

13. 12 වන අතුරු ව්‍යවස්ථාව යටතේ නියම කරන දඩ මුදල් නගර සභාවේ පොදු අරමුදලට බැර විය යුතුය.

14. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස මෙම අතුරු ව්‍යවස්ථාවේ —

"නගර සභාව" යන්නෙන් කඩුගන්නාව නගර සභාව අදහස් වේ,
"සභාපති" යන්නෙන් කඩුගන්නාව නගර සභාවේ සභාපතිවරයා ද,
"බලය ලත් නිලධාරියා" යන්නෙන් සභාපතිවරයා විසින් බලය පවරනු ලද නිලධාරියෙකු අදහස් වේ.

15. මෙම අතුරු ව්‍යවස්ථාවේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් එවිට සිංහල පාඨයෙහි අර්ථ දැක්වෙන අදහස බලපැවැත්වේ.

***පළමුවන උපලේඛනය***

*කඩුගන්නාව නගර සභාව*

**ක්‍රීඩා පිටිය වෙන් කිරීම සඳහා ඉල්ලුම් කිරීම**

1. ඉල්ලුම්කරුගේ නම :—..........................................................................................
2. ලිපිනය :—..........................................................................................
3. දුරකථන අංකය :—..........................................................................................
4. ඉල්ලුම් කළ කාරණය :—..........................................................................................
5. ඉල්ලුම් කරන දිනය හෝ දිනයන් :—..........................................................................................
6. ඉල්ලුම් කරන වේලාව :—..........................................................................................

. ............................................................... ...............................................................
දිනය අත්සන

---

කාර්යාලීය ප්‍රයෝජනය සඳහා

නිර්දේශය
..........................................................................................
..........................................................................................
..........................................................................................

ගරු සභාපතිතුමාගේ අනුමැතිය
..........................................................................................
..........................................................................................
..........................................................................................

මුදල් ගෙවීම

| | | | |
|---|---|---|---|
| ලදුපත් අංකය | | දිනය | |
| තැන්පත් මුදල | | මුළු මුදල | |

යතුරු භාරදීම

| | | | |
|---|---|---|---|
| දිනය | | ආපසු භාරදුන් දිනය | |
| භාරගත් අයගේ දුරකථන අංකය | | | |

07 - 279/7

---

**කඩුගන්නාව නගර සභාව**

අතුරු ව්‍යවස්ථා

255 වැනි අධිකාරය වන නගර සභා ආඥාපනතේ 153 වැනි වගන්තියේ (1) වන උපවගන්තිය සමග කියවිය යුතු එකී ආඥාපනතේ 157 වැනි වගන්තියේ 11 වැනි උප වගන්තිය යටතේ නගර සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව කඩුගන්නාව නගර සභාව විසින් සාදන ලද පහත සඳහන් අතුරු ව්‍යවස්ථා 1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 2 වැනි වගන්තිය (1) වැනි උප වගන්තිය සමග කියවිය යුතු ඉහත කී නගර සභා ආඥාපනතේ 154 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව මධ්‍යම පළාත් සභාවේ පළාත් පාලන විෂය භාර අමාත්‍ය සරත් ඒකනායක වන මා විසින් අනුමත කරනු ලැබූ බවත් මෙම නිවේදනය ගැසට් පත්‍රයේ පළකරනු ලැබූ දින සිට එකී අතුරු ව්‍යවස්ථාව කඩුගන්නාව නගර සභා බල ප්‍රදේශයේ බලපවත්වන බවත් මෙයින් නිවේදනය කරමි.

සරත් ඒකනායක,
මධ්‍යම පළාතේ ප්‍රධාන අමාත්‍ය හා පළාත් පාලන විෂයභාර අමාත්‍ය.

2014 සැප්තැම්බර් මස 15 වැනි දින,
මහනුවර,
මධ්‍යම පළාතේ පළාත් සභාවේ,
ප්‍රධාන අමාත්‍ය කාර්යාලයේ දී ය.

**පොළ සම්බන්ධ අතුරු ව්‍යවස්ථාව**

01. මෙම අතුරු ව්‍යවස්ථාව කඩුගන්නාව නගර සභා බල ප්‍රදේශය තුළ පොළ පැවැත්වීම පාලනය කිරීමේ සහ ගාස්තු අයකිරීමේ අතුරු ව්‍යවස්ථාව යනුවෙන් හඳුන්වනු ලැබේ.

02. මෙම අතුරු ව්‍යවස්ථාව කඩුගන්නාව නගර සභා බල ප්‍රදේශය තුල පොළ පැවැත්වීම, පාලනය කිරීම සහ විධිමත් කිරීම සඳහා පනවනු ලැබේ.

03. කිසිම තැනැත්තෙකු විසින් පොළක් පැවැත්වීම සඳහා නිශ්චිතව නම් කර ඇති ස්ථානයක සභාපතිවරයා විසින් නිකුත් කරනු ලබන වලංගු අවසරපත්‍රයක් මත හැර වෙළඳාම් කටයුතු නොකළ යුතුය.

04. නගර සභාව විසින් විටින් විට යෝජනා සම්මතයකින් තීරණය කරනු ලබන දිනය තුළ පමණක් පොළ පවත්වනු ලැබිය යුතු ය. එහෙත් විශේෂ උත්සව අවස්ථාවලදී මහජන උපයෝගීතාවය හා මහජනයාගේ හිතසුව පිණිස විශේෂ පොළවල් පැවැත්වීමට නගර සභාවට බලය ඇත. එම පොළවල් දිවා කාලය තුළ දී නම් පෙරවරු 6.00 සිට පස්වරු 6.00 දක්වාත් රාත්‍රී කාලය තුළදී නම් පස්වරු 6.00 සිට පෙරවරු 6.00 දක්වා කාලය තුළ ක්‍රියාත්මක කළ හැකිය.

05. නගර සභාව යෝජනා සම්මතයකින් තීරණය කරනු ලබන ගාස්තුවක් පොළ ගාස්තු ලෙස පොළ ප්‍රදේශය තුළ වෙළඳාම් කරන අයගෙන් අයකළ හැකි වන අතර, එකී ගාස්තුව ගෙවීමට වෙළෙඳුන් බැඳී සිටිය යුතු ය.

06. සිවුවන අතුරු ව්‍යවස්ථාවේ පරිදි කටයුතු නොකරන අය අදාළ පොළ ප්‍රදේශයෙන් ඉවත් කිරීමට නගර සභාවට බලය තිබිය යුතු ය.

07. පොළ ප්‍රදේශය තුළ වෙළඳාම් කරන අය අසංවරශීලී ලෙස හැසිරීම නොකළ යුතු අතර, සැමවිටම ඉතාම සංවරශීලීව හා සුහදශීලී ව කටයුතු කළ යුතු ය.

08. පොළ ප්‍රදේශය තුළ බීමත් ව හැසිරීම සම්පූර්ණයෙන්ම තහනම් විය යුතු ය.

09. පොළ පරිශ්‍රයේ වෙළඳාම් කරන අය විසින් ඉවත් කරනු ලබන අපද්‍රව්‍ය පරිසරයට හා අනෙක් පාර්ශවවලට හානිදයක නොවන ලෙස සභාව විසින් නියම කර ඇති ස්ථානයකට බැහැර කළ යුතු ය.

10. පොළ භූමියේ පොළ ගාස්තු අය කිරීම සභාව විසින් තීරණය කරනු ලබන අයෙකුට පවරාදීමට සභාවට බලය තිබිය යුතු ය.

11. පොළේ වෙළඳාම් කටයුතු පරීක්ෂා කිරීම, අධීක්ෂණය කිරීම සඳහා සභාපතිවරයා විසින් නිළධාරීන්, සේවකයින් පත්කළ හැකි අතර, ඔවුන්ට පහත සඳහන් කරුණු පරීක්ෂා කිරීම සඳහා බලතල තිබිය යුතු ය.

අ. වෙළඳම් කිරීම සඳහා නියමිත අවසරපත්‍ර ලබාගෙන තිබේ ද යන්න,
ආ. නිවැරදි හා බලපත්‍රලත් කිරුම් මිණුම් උපකරණ පාවිච්චි කරන්නේ ද යන්න,
ඇ. සෞඛ්‍ය ආරක්ෂිත ලෙස භාණ්ඩ ගබඩාකර තිබේ ද යන්න,
ඈ. අලෙවි කරන ද්‍රව්‍ය පරිභෝජනයට සුදුසු ප්‍රමිතියකින් තිබේ ද යන්න.

12. මේ අතුරු ව්‍යවස්ථාවල කවර වූ හෝ විධිවිධානයක් කඩ කිරීම හෝ උල්ලංඝනය කිරීම වරදක් වන අතර, නිසි බලය ඇති අධිකරණයක් මගින් ඒ වරදකට වරදකරු කරනු ලැබූ විට නියම කළ හැකි උපරිම දඩය සහ එම කඩ කිරීම හෝ උල්ලංඝනය නොකඩවා තවදුරටත් කරගෙන යන විටක ඒ පිළිබඳව වරදකරු කිරීමෙන් පසුව හෝ එම උල්ලංඝනය ගැන අවධානය යොමුකරමින් සභාපතිවරයා විසින් බලයලත් වෙනත් නිලධාරියෙකු විසින් ලිඛිත දැන්වීමක් භාර දෙනු ලැබීමෙන් පසුව කඩ කිරීම හෝ උල්ලංඝනය තවදුරටත් නොකඩවා කරගෙන යන සෑම එක් දිනයක් සඳහා ම නියම කළ හැකි අතිරේක දණ්ඩනයේ උපරිමය පිළිවෙළින්, 255 වන අධිකාරය වන නගර සභා ආඥා පනතේ 153 වගන්තියේ (2) වන උප වගන්තියෙන් නියම කර ඇති උපරිම දඩ මුදල හා අතිරේක දණ්ඩනයේ උපරිමය විය යුතු ය.

13. 12 වන අතුරු ව්‍යවස්ථාව යටතේ නියම කරන දඩ මුදල් නගර සභාවේ පොදු අරමුදලට බැර විය යුතුය.

14. සභාවෙන් ලබාගත් අවසරපත්‍රයක් මත පමණක් සතිපොළ භූමියේ නිශ්චිත ව නියම කර ඇති ස්ථානයක හැර මාළු විකිණීම, තබා ගැනීම නොකළ යුතු ය.

15. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස මෙම අතුරු ව්‍යවස්ථාවේ —

"නගර සභාව" යන්නෙන් කඩුගන්නාව නගර සභාව අදහස් වේ,

"සභාපති" යන්නෙන් කඩුගන්නාව නගර සභාවේ සභාපතිවරයා ද,

"බලය පවරනු ලබන නිලධාරියා" යන්නෙන් පොළ ප්‍රදේශය තුළ සියළු කටයුතු පරීක්ෂා කිරීමට, අධීක්ෂණය කිරීමට සභාපතිවරයාගේ බලය පවරනු ලැබූ නිලධාරියා ද අදහස් වේ.

''පොළ පරිශ්‍රය'' යන්නෙන් නගර සභාව විසින් නිශ්චිතව තීරණය කරනු ලබන ප්‍රදේශය අදහස් වේ.

16. මෙම අතුරු ව්‍යවස්ථාවේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතුය.

07 - 279/8

## කඩුගන්නාව නගර සභාව

### අතුරු ව්‍යවස්ථා

255 වැනි අධිකාරය වන නගර සභා ආඥාපනතේ 153 වැනි වගන්තියේ (1) වන උපවගන්තිය සමග කියවිය යුතු එකී ආඥාපනතේ 157 වැනි වගන්තියේ 9 (එ) වැනි උප වගන්තිය යටතේ නගර සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව කඩුගන්නාව නගර සභාව විසින් සාදන ලද පහත සඳහන් අතුරු ව්‍යවස්ථා 1989 අංක 12 පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 2 වැනි වගන්තිය (1) වැනි උප වගන්තිය සමග කියවිය යුතු ඉහත කී නගර සභා ආඥාපනතේ 154 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව මධ්‍යම පළාත් සභාවේ පළාත් පාලන විෂය භාර අමාත්‍ය සරත් ඒකනායක වන මා විසින් අනුමත කරනු ලැබූ බවත් මෙම නිවේදනය ගැසට් පත්‍රයේ පළකරනු ලැබූ දින සිට එකී අතුරු ව්‍යවස්ථාව කඩුගන්නාව නගර සභා බල ප්‍රදේශයේ බලපවත්වන බවත් මෙයින් නිවේදනය කරමි.

සරත් ඒකනායක,
මධ්‍යම පළාතේ ප්‍රධාන අමාත්‍ය හා පළාත් පාලන විෂයභාර අමාත්‍ය.

2014 සැප්තැම්බර් මස 15 වැනි දින,
මහනුවර,
මධ්‍යම පළාතේ පළාත් සභාවේ,
ප්‍රධාන අමාත්‍ය කාර්යාලයේ දී ය.

**කොණ්ඩා සැකසීමේ ස්ථාන, බාබර් සාප්පු හා සැලුන්හල් සහ රූපලාවන්‍ය මධ්‍යස්ථාන පිළිබඳ අතුරු ව්‍යවස්ථාව**

01. මෙම අතුරු ව්‍යවස්ථාව කඩුගන්නාව නගර සභා බල ප්‍රදේශයේ කොණ්ඩා සකසන ස්ථාන, බාබර් සාප්පු හා සැලුන්හල් සහ රූපලාවන්‍ය මධ්‍යස්ථාන විධිමත් කිරීම, අධීක්ෂණය කිරීම හා පාලනය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා යනුවෙන් හඳුන්වනු ලැබේ.

02. මෙම අතුරු ව්‍යවස්ථාව කඩුගන්නාව නගර සභා බල ප්‍රදේශය තුල කොණ්ඩා සකසන ස්ථාන, බාබර් සාප්පු හා සැලුන්හල් සහ රූපලාවන්‍ය මධ්‍යස්ථාන විධිමත් කිරීම, අධීක්ෂණය කිරීම හා පාලනය කිරීම සඳහා පනවනු ලැබේ.

03. කිසියම් තැනැත්තෙකු විසින් කඩුගන්නාව නගර සභාවේ සභාපතිවරයා ගෙන් ලබාගත් බලපත්‍රයක් යටතේ හැර කොණ්ඩා සකසන ස්ථාන, බාබර් සාප්පු හා සැලුන්හල් සහ රූපලාවන්‍ය මධ්‍යස්ථානයක් පවත්වාගෙන නොයා යුතුය.

04. තුන්වන අතුරු ව්‍යවස්ථාව යටතේ නිකුත් කරනු ලබන සෑම බලපත්‍රයක්ම සභාපතිවරයා විසින් කලින් අවලංගු කරනු ලැබුවහොත් මිස එය නිකුත් කරනු ලැබුවේ යම් වර්ෂයක් වෙනුවෙන්ද ඒ වර්ෂයේ දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් විය යුතුය.

05. (අ) මෙම අතුරු ව්‍යවස්ථාවේ (ආ) සහ (ඇ) ඡේදවල සඳහන් නියමන් ඒ ආකාරයෙන්ම සම්පූර්ණ කර ඇත්තේ නම් මිස කඩුගන්නාව නගර සභාවේ සභාපතිවරයා විසින් කොණ්ඩා සකසන ස්ථාන බාබර් සාප්පු හා සැලුන්හල් සහ රූපලාවන්‍ය මධ්‍යස්ථානයකට බලපත්‍රයක් නිකුත් නොකළ යුතුය.

**(ආ) කොණ්ඩා සකසන ස්ථාන බාබර් සාප්පු හා සැලුන්හල් සහ රූපලාවන්‍ය මධ්‍යස්ථානය පවත්වාගෙන යාමට අදහස් කරන ගොඩනැගිල්ල හෝ ගොඩනැගිල්ලේ කොටස**

i. ශක්තිමත්ව නිමකර තිබිය යුතුය අතර එක් ගණුදෙනුකරුවෙකුට සේවා සැපයීම සඳහා වෙන්කරන ඉඩ ප්‍රමාණය අවම වශයෙන් වර්ග මීටර් 1.5 නොඅඩු වනසේ එකවර සේවා සපයන ගණුදෙනුකරුවන් සංඛ්‍යාවට අනුරූපීව ප්‍රමාණවත් ඉඩ කඩ සපයා තිබිය යුතුය.

ii. සේවා සපයා ගැනීමට බලාපොරොත්තුවෙන් පැමිණෙන කිසියම් ගණුදෙනුකරුවෙකුට සේවා ලබාගන්නා ගණුදෙණුකරු ස්ථානගත කර ඇති ස්ථානයේ සිට අවම වශයෙන් මීටර් 1.5 ක් දුරින් වන සේ පහසුවෙන් අසුන්ගෙන රැඳී සිටීමට ප්‍රමාණවත් ඉඩ කඩ සපයා තිබිය යුතුය.

iii. ඇතුළත බිත්ති ශක්තිමත් ද්‍රව්‍යවලින් තිබිය යුතු අතර තීන්ත ආලේප කර තිබිය යුතුය.

iv. ඇතුළත වහලය ලී හෝ වෙනත් ශක්තිමත් ද්‍රව්‍යකින් තනා තිබිය යුතු මෙන්ම අවම වශයෙන් පොළව මට්ටමේ සිට මීටර් 2.25 ක් උස සිවිලිමකින් යුක්ත විය යුතුය. තවද සිවිලිම සුදු පාටින් පින්තාරු කර තිබිය යුතුය.

v. ඇතුළත පොළව සිමෙන්තියෙන් මැද හෝ පිඟන් ගඩොල් අල්ලා තිබිය යුතු අතර බිත්තිය හා පොළව සම්බන්ධ වන ස්ථානය පිරිසිදු කිරීමට පහසු වන සේ වටකුරු හැඩයට සකස් කර තිබිය යුතුය.

vi. අතුළත වායු සමීකරණය කර නොමැති ගොඩනැගිල්ලක් වන විට එහි භූමියේ වර්ග ප්‍රමාණයෙන් පහළොවෙන් එකකට නොඅඩු වා කවුළු සවිකර තිබිය යුතු අතර ප්‍රමාණවත් ආලෝකය ලැබීමට සලස්වා තිබිය යුතුය.

vii. ඇතුළත වායු සමීකරණය කර ඇති ගොඩනැගිල්ලක් වන විට ප්‍රමාණවත් විදුලි ආලෝකය සපයා තිබිය යුතුය.

viii. ගණුදෙනුකරුවන්ට සේවා සැපයීමේදී සේදීම සඳහා ජලය භාවිතා කරන්නේ නම් සෝදන බේසම් සවිකර තිබිය යුතු අතර පාවිච්චි කල අප ජලය ගලායාමට ප්‍රමාණවත් නල සවිකර තිබිය යුතුය.

ix. ඇතුළත භාවිතා කර බැහැර කරන අප ජලය උරාගැනීමේ වළකට ගලායාමට සලස්වා තිබිය යුතු අතර පොදු ජල මාර්ගයකට ගලායාමට සැලැස්වීම නොකළ යුතුය.

x. ඇතුළත හෝ පරිශ්‍රය ඇතුළත ජලමුද්‍රිත වැසිකිළි පහසුකම් සපයා තිබිය යුතුය.

xi. ඇතුළත නිවාසයක කාර්යය සඳහා යොදාගැනීම නොකළ යුතු අතර නිවාසය සඳහා යොදාගන්නා කොටසින් වෙන්කර තිබිය යුතුය.

(ඇ) කොණ්ඩා සකසන ස්ථාන, බාබර් සාප්පු හා සැලූන්හල් සහ රූපලාවන්‍ය මධ්‍යස්ථාන

i. ගණුදෙනුකරුවන් සඳහා විවෘතව තබන සෑම අවස්ථාවකදීම ප්‍රමාණවත් ජල සම්පාදනයක්

ii. පවත්වාගෙන යාමේදී පාවිච්චි කරන උපකරණ හා මෙවලම් ජීවානුහරණය සඳහා ප්‍රමාණවත් වන ජලය උතුරුවන ක්‍රමයක් හෝ ජීවානුහරණ ක්‍රමයක් සහ ජීවානුහරණය සඳහා භාවිතා කෙරෙන බඳුන් ප්‍රමාණවත් සංඛ්‍යාවක්

iii. ඇතුළත සේවා සපයන්නන්ට ඔවුන්ගේ වැඩකරගෙන යාමේදී අත් සෝදාගැනීමේ පහසුකම් සහිත බේසම් හා සබන් හෝ සබන් දියර

iv. ගණුදෙනුකරුවන්ගේ ප්‍රයෝජනය සඳහා සුදු පැහැයෙන් යුක්ත වන තුවා හා උඩුකය ආවරන වැස්ම ප්‍රමාණවත් සංඛ්‍යාවක්

v. ඇතුළතදී කපන ලද කෙස් හා වෙනත් අපද්‍රව්‍ය දැමීම සඳහා හොඳින් වැසුණු පියනකින් යුත් එහා මෙහා ගෙන යා හැකි භාජනයක්

vi. අතුළත විදුලියෙන් ක්‍රියාත්මක කරන උපකරණ යොදාගන්නේ නම් එක් ගණුදෙනුකරුවෙකුගේ මේසයට අවම වශයෙන් එකක් බැගින් වනසේ ආරක්ෂිත විදුලි පේනු එකක් බැගින්

vii. සභාපතිවරයා විසින් නියම කරනු ලබන ආකාරයෙන් ප්‍රමාණවත් ප්‍රථමාධාර උපකරණ හා ඖෂධ සහිත ප්‍රථමාධාර පෙට්ටියක් සපයා තිබිය යුතුය.

06. මේ කොටසේ අතුරු ව්‍යවස්ථා යටතේ බලපත්‍රයක් ලත් සෑම ස්ථානයකම සේවයේ යොදවා ඇති තැනැත්තෙකුටම සභාපතිවරයා විසින් නිර්දේශ කරනු ලබන ප්‍රමාණයේ ප්‍රථමාධාර පුහුණුවක් හා අවම වශයෙන් වර්ෂයකට එක් වතාවක් බැගින් වන ප්‍රථමාධාර පෙරහුරුවක් ලබාදිය යුතුය.

07. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ බලපත්‍රයක් ලත් සෑම තැනැත්තෙකුම විසින් හතරවන අතුරු ව්‍යවස්ථාවේ (ආ) ඡේදයේ සඳහන් ආකාරයට බලපත්‍රලත් ස්ථානයේ තීන්ත ආලේප කර තිබිය යුතු යැයි නියම කර ඇති ස්ථාන අවම වශයෙන් වර්ෂයකට එක් වතාවක් බැගින් තීන්ත ආලේප කළ යුතුය.

08. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ බලපත්‍රයක් ලත් සෑම තැනැත්තෙකුම විසින් බලපත්‍රලත් ස්ථානයේ ගෙබිම අවම වශයෙන් සතියකට වරක්වත් විෂබීජනාශක යොදා සෝදාහැරීම කළයුතුය.

09. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ බලපත්‍රයක් ලත් ස්ථානයක ඇතුළත දිවාකාලයේ හෝ රාත්‍රී කාලයේ නිදා ගන්නා හෝ ආහාර ගන්නා ස්ථානයක් ලෙස පාවිච්චි නොකළ යුතු අතර වෙනත් යම් තැනැත්තෙකුට එසේ පාවිච්චි කිරීමට ඉඩ නොදිය යුතුය.

10. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ බලපත්‍රයක් ලත් ස්ථානයක ඇතුළත ආහාර පිසීම හෝ ආහාර විකිණීම හෝ විකිණීම සඳහා ආහාර ප්‍රදර්ශනය කිරීම හෝ නොකළ යුතුය.

(අ) කිසියම් ආසාදන ස්පර්ශක හෝ චර්ම රෝගයකින් පෙළෙන හෝ මෑතකදී එවැනි රෝගයකින් පෙළෙමින් සිටි කවර හෝ තැනැත්තෙකු හෝ එවැනි කිසියම් රෝගයකින් පෙළෙන යම් තැනැත්තෙකුට මෑතකදී සාත්තු කිරීමෙහි යෙදී සිටි කවර හෝ තැනැත්තෙකු එකී රෝග ආසාදන සහ බීජ පෝෂණ කාල සීමාව ඉකුත්වී ඇත්තේ නම් මිස කවර හෝ ආකාරයක කාර්යයක හෝ එසේ කාර්යයක නියුක්ත යම් තැනැත්තෙකුගේ සහායකුයෙකු වශයෙන් හෝ නියුක්ත වීම හෝ නියුක්ත කරවීම හෝ කිසියම් කාර්යයක නියුක්ත විමට ඉඩදීම හෝ නොකළ යුතුය.

(ආ) හොඳින් සෝදා පිරිසිදු කල ඇඳුම් හැඳ ඇත්තේ නම් මිස කවර හෝ තැනැත්තෙකු විසින්, බලපත්‍රලත් ස්ථානයක කවර හෝ ආකාරයක කාර්යයක නියුක්ත වීම හෝ නියුක්ත වීමට ඉඩදීම හෝ නොකළ යුතුය.

(ඇ) බලපත්‍රලත් ස්ථානයේ සේවයේ යොදවා ඇති සියලුම සේවකයින් අවම වශයෙන් වර්ෂයකට, එක් වතාවක් වෛද්‍ය පරීක්ෂණයට භාජනය කරවීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතුය.

11. කවර හෝ ආකාරයක හෝ ආසාදන හෝ ස්පර්ශක හෝ චර්ම රෝගයකින් පෙළෙන නැතහොත් එවැනි රෝගයකින් පෙළෙන තැනැත්තෙකුට මෑතකදී උපස්ථාන කල කිසියම් ගණුදෙනුකරුවෙකුට සේවා සැපයීමෙන් අනතුරුව ;

(අ) එකී සේවා සැපයීම කළ තැනැත්තා විශබීජ නාශක ද්‍රව්‍යයක් යොදා තමාගේ දෑත් පිරිසිදු කරගෙන ඇත්තේ නම් මිස වෙනත් යම් ගණුදෙනුකරුවෙකුට සේවය කිරීම හෝ සේවය කිරීමට ඉඩදීම හෝ නොකළ යුතුය.

(ආ) එකී ගණුදෙනුකරුවා සඳහා පාවිච්චි කල කවර හෝ උපකරණයක් ජීවානුහරණය කර ඇත්තේ නම් මිස සහ පාවිච්චි කල තුවා සහ උඩුකය ආවරණ වැස්ම විෂබීජ නාශක සහ සබන් යොදා සෝදා ඇත්තේ නම් මිස වෙනත් යම් ගණුදෙනුකරුවෙකු වෙනුවෙන් පාවිච්චි කිරීම හෝ එසේ කිරීමට ඉඩදීම හෝ නොකළ යුතුය.

12. බලපත්‍රලත් ස්ථානයේ සේවයේ නියුක්ත කර ඇති සෑම සේවකයෙකුම -

(අ) දිනපතා දියනෑමෙන් හෝ ඇඟ සෝදාගැනීමෙන් අනතුරුව පමණක් සේවයේ නියුක්ත වන බවට

(ආ) අඳින ඇඳුම් හා පැළඳුම් පිරිසිදුව හා සෞඛ්‍යාරක්ෂක තත්ත්වයෙන් වන බවට

(ඇ) නියපොතු කොටට කපා කුණුවලින් තොරව තබාගන්නා බවට සහ

(ඈ) එක් එක් ගණුදෙනුකරු සඳහා සේවය කිරීමට පෙරාතුව සබන් ගා අත් සෝදා ගන්නා බවට සහතික වීම බලපත්‍රලාභියාගේ වගකීම විය යුතුය.

13. බලපත්‍රලත් ස්ථානයේ පාවිච්චියට ගන්නා -

(අ) උපකරණ පාවිච්චි කරන එක් එක් වතාවට පසුව ජීවානුහරණය කිරීම

(ආ) බුරුසු සහ පනා සෑම දිනයකම පාවිච්චියට ගැනීමට පෙර හොඳින් සෝදා පිරිසිදුකර ජීවානුහරණය කිරීම

(ඇ) සියලුම කතුරු, කෝප්ප සහ සබන් බුරුසු ඒවා ප්‍රයෝජනයට ගන්නා එක් එක් වතාවෙන් පසුව උණු වතුරෙහි ගිල්වා සෝදාහැරීම කරන බවට බලපත්‍රලාභියා සහතික විය යුතුය.

14. බලපත්‍රලත් ස්ථානයේ සේවය ලබාගන්නා එක් එක් ගණුදෙනුකරුගේ -

(අ) කොණ්ඩය හෝ රැවුල කැපීමෙන් ඉවත් කරන කෙස් කැබලි හෝ වෙනත් අපද්‍රව්‍ය අතුගෑමෙන් හෝ විදුලි බලයෙන් ක්‍රියාකරන උරාගන්නා යන්ත්‍රයක් මගින් හෝ එකතු කර ඒ සඳහා වෙන්කළ භාජනයට දැමීම කරන බවට සහ

(ආ) කොණ්ඩය හෝ රැවුල කැපීමට උපයෝගී කරගන්නා තල මාරුකළ හැකි දැලි පිහියේ තලය මාරුකරන බවට බලපත්‍රලාභියා සහතික විය යුතුය.

15. දෛනික කටයුතු අවසානයේ හෝ අවශ්‍ය වන්නේ නම් දිනකට කිහිප වතාවක් බැගින් ඉවත් කරන කෙස් කැබලි ඇතුළත් බඳුනේ ඇති අපද්‍රව්‍ය අවම වශයෙන් පොළවෙන් මීටර එකකට නොඅඩු ගැඹුරකින් වළදැමීමට සැලැස්වීම බලපත්‍රලාභියාගේ කාර්යය වන්නේය. එසේම ඉවත දමන කෙස් කැබලි හෝ වෙනත් අපද්‍රව්‍ය සුළඟේ ගසාගෙන යාම හෝ පරිශ්‍රය තුල යම් පොදු ස්ථානයක විසිරී යාම වැළැක්වීමට ක්‍රියාකිරීමද බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතුය.

16. බලපත්‍රලත් ස්ථානයේ රැස්කරන කෙස් කැබලි සහ වෙනත් අපද්‍රව්‍ය 15 වන අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ආකාරයට බැහැර කිරීමට නොහැකි වන අවස්ථාවකදී නගර සභාවේ අපද්‍රව්‍ය කළමනාකරන වැඩපිළිවෙල යටතේ නියම කරනු ලබන ආකාරයෙන් නගර සභාවේ කසල රැස්කිරිමේ වාහනයකට භාරදීමට ක්‍රියාකළ යුතුය.

17. බලපත්‍රලත් ස්ථානයේ පාවිච්චියට ගන්නා අපද්‍රව්‍ය රැස්කිරීමේ භාජනය හිස් කිරීමෙන් පසු පිරිසිදු කර විෂබීජ නාශක යෙදීමට සැලැස්වීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතුය.

18. කවර හෝ බලපත්‍රලත් ස්ථානයක -

(අ) කවර ආකාරයෙන් හෝ ලේ නවත්වන පැන්සල් වර්ගයක් හෝ පියරු මලක් හෝ වෙනත් යම් ද්‍රව්‍යයක් හෝ

(ආ) යම් ලේ ගැලීමක් නතර කිරීමේ කාර්යය සඳහා සීනක්කාරම් හෝ වෙනත් ද්‍රව්‍යයක් (එය කුඩු වශයෙන් හෝ ද්‍රව වශයෙන් ඇත්නම් මිස) කිසිම ගණුදෙනුකරුවෙකු සඳහා පාවිච්චි කිරීම හෝ පාවිච්චි කිරීමට ඉඩදීම හෝ නොකළ යුතු ය.

19. බලපත්‍රලත් ස්ථානයක බලපත්‍රලාභියා විසින් පිරිසිදු තත්ත්වයෙන් නොමැති උඩුකය ආවරණ වැස්මක් හෝ සෝදනු ලැබීමෙන් පසු පළමු වරට පාවිච්චි කරන තුවායක් නොවන තුවායක් හෝ කවර හෝ ගණුදෙනුකරුවෙකුගේ ප්‍රයෝජනය සඳහා යොදා ගැනීම නොකළ යුතු ය.

20. මේ කොටසේ අතුරු ව්‍යවස්ථා යටතේ බලපත්‍රලත් ස්ථානයකට නිකුත් කරන ලද බලපත්‍රයේ සඳහන් කාර්යයන් හැර වෙනත් කවර හෝ කාර්යයක් සභාපතිවරයාගේ ලිඛිත අවසරය ඇත්තේ නම් මිස නොකළ යුතු ය.

21. සභාපතිවරයා විසින් හෝ තත් කාර්යය සඳහා ඔහු විසින් පොදුවේ හෝ විශේෂයෙන් ලියවිල්ලක් මගින් බලය දෙන ලද නගර සභාවේ යම් නිලධාරියෙකු විසින් හෝ මෙම අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ස්ථාන වලට යුක්ති සහගත වේලාවන් හිදී ඇතුල් වී පරීක්ෂා කිරීම නීත්‍යානුකූල වන අතර ඒ සඳහා අවශ්‍ය විය හැකි සියලු සහය බලපත්‍රලාභියා හෝ එය භාරව සිටින තැනැත්තන් විසින් ලබාදිය යුතු ය.

22. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස —

"සභාව" යන්නෙන් කඩුගන්නාව නගර සභාව ද,
"සභාපති" යන්නෙන් කඩුගන්නාව නගර සභාවේ සභාපතිවරයා ද,
"බලය පවරනු ලැබූ නිලධාරියා" යන්නෙන් කඩුගන්නාව නගර සභාවේ සභාපතිවරයා විසින් බලය පවරනු ලැබූ නිලධාරියා ද,
"උඩුකය ආවරණ වැස්ම" යන්නෙන් බලපත්‍රලත් ස්ථානයේ සේවය ලබාගන්නා කිසියම් ගණුදෙනුකරුවෙකුගේ උඩුකය ආවරණය කිරීමට පාවිච්චි කරන ආවරණ රෙද්දක් අදහස් වේ.

23. මෙම අතුරු ව්‍යවස්ථාවේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් එවිට සිංහල පාඨයෙහි අර්ථ දැක්වෙන අදහස බලපැවැත්වේ.

07 - 279/9

---

## කඩුගන්නාව නගර සභාව

අතුරු ව්‍යවස්ථා

255 වැනි අධිකාරය වන නගර සභා ආඥාපනතේ 153 වැනි වගන්තියේ (1) වන උපවගන්තිය සමග කියවිය යුතු එකී ආඥාපනතේ 157 වැනි වගන්තියේ 7 (ඊ) වැනි උප වගන්තිය යටතේ නගර සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව කඩුගන්නාව නගර සභාව විසින් සාදන ලද පහත සඳහන් අතුරු ව්‍යවස්ථා 1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 2 වැනි වගන්තිය (1) වැනි උප වගන්තිය සමග කියවිය යුතු ඉහත කී නගර සභා ආඥාපනතේ 154 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව මධ්‍යම පළාත් සභාවේ පළාත් පාලන විෂය භාර අමාත්‍ය සරත් ඒකනායක වන මා විසින් අනුමත කරනු ලැබූ බවත් මෙම නිවේදනය ගැසට් පත්‍රයේ පළකරනු ලැබූ දින සිට එකී අතුරු ව්‍යවස්ථා කඩුගන්නාව නගර සභා බල ප්‍රදේශයේ බලපවත්වන බවත් මෙයින් නිවේදනය කරමි.

සරත් ඒකනායක,
මධ්‍යම පළාතේ ප්‍රධාන අමාත්‍ය හා පළාත් පාලන විෂයභාර අමාත්‍ය.

2014 සැප්තැම්බර් මස 15 වැනි දින,
මහනුවර,
මධ්‍යම පළාතේ පළාත් සභාවේ,
ප්‍රධාන අමාත්‍ය කාර්යාලයේ දී ය.

**නගරයේ සැරසිලි විධිමත් කිරීම සඳහා වන අතුරු ව්‍යවස්ථාව**

01. මෙම අතුරු ව්‍යවස්ථාව කඩුගන්නාව නගර සභා බල ප්‍රදේශයේ සැරසිලි විධිමත් කිරීම, පාලනය කිරීම සහ ගාස්තු අයකිරීම සඳහා අතුරු ව්‍යවස්ථා යනුවෙන් හඳුන්වනු ලැබේ.

02. කඩුගන්නාව නගර සභා සීමාව තුළ පිහිටි වීථිවල මහජනයා විසින් සිදුකරනු ලබන සැරසිලි විධිමත් කිරීම හා පාලනය කිරීම සඳහා මෙම අතුරු ව්‍යවස්ථා පනවනු ලැබේ.

03. මෙම අතුරු ව්‍යවස්ථා අනුව කඩුගන්නාව නගර සභාවේ සභාපතිවරයාගෙන් ලබාගත් ලිඛිත අවසරයක් නොමැතිව සභා බල ප්‍රදේශයේ කිසියම් ස්ථානයක සැරසිලි කිරීම නිත්‍යානුකූල නොවන්නේය.

04. මෙහි මින් මතු කඩුගන්නාව නගර සභාවේ සභාපතිවරයාගේ හෝ බලය පවරන ලද නිලධාරියා විසින් නිකුත් කරන ලද අවසරපත්‍රයක් නොමැතිව කිසිම තැනැත්තෙකු විසින් කඩුගන්නාව නගර සභා බල ප්‍රදේශයේ වීථි හා ප්‍රසිද්ධ ස්ථාන සැරසිලි කිරීම නොකළ යුතුය.

05. කවර හෝ සැරසිල්ලක් සඳහාම අවසරපත්‍රයක් ලබාගැනීමේදී මෙම අතුරු ව්‍යවස්ථාවේ 06 වන අතුරු ව්‍යවස්ථාව අනුව අයදුම්පතක් සැරසිලි කිරීමට යටත් පිරිසෙන් පැය 48 කට පෙර සභාවට ඉදිරිපත් කළ යුතුය.

06. සැරසිලි කරන වීථියේ හෝ ප්‍රසිද්ධ ස්ථානයේ නම :-
සැරසිල්ලේ ස්වභාවය :-
සැරසිලි කරන කාලසීමාව :-
සැරසිල්ල කුමක් අරභයාද යන වග :-
සැරසිල්ල ඉවත් කරගන්නා දිනය :-
ඉවතලන දෑ බැහැර කරන ආකාරය කෙසේද ? යන්න :-

07. අයදුම්පත්‍රයක් ඉදිරිපත් කිරීමෙන් පසු සැරසිලි සඳහා මෙම අතුරු ව්‍යවස්ථාවේ විධිවිධානවලට අනුකූලව අවසරපත්‍රයක් නිකුත් කරනු ලැබේ.

08. සැරසිලි සඳහා කවර හෝ අවස්ථාවක පොලිතින් භාවිතා නොකළ යුතුය.

09. මෙම අතුරු ව්‍යවස්ථාවේ සඳහන් සෑම අවසර පත්‍රයක් සඳහාම රු. 500/- ක මුදලක් අවසරපත්‍ර ගාස්තු වශයෙන් අයකරනු ලැබේ.

අ. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ සෑම සැරසිලි කාර්යයක් සඳහාම රු.5000/- ක තැන්පතු මුදලක් සභාවේ තැන්පත් කළ යුතුය.

ආ. අවසරපත්‍රයක් ලත් යම් තැනැත්තෙකු විසින් කරනු ලබන යම් සැරසිල්ලක් අවසරපත්‍රයේ සඳහන් සැරසිලි ඉවත් කළයුතු යැයි සඳහන් දිනයෙන් පැය 24 ක් තුළ සැරසිලි ඉවත් කරනු නොලැබේ නම්, සභාව විසින් එම සැරසිලි ඉවත් කර, ඊට වැයවූ වියදම් අයකර යම් ඉතිරි මුදලක් වේනම් එය තැන්පත්කරු වෙත ආපසු ගෙවීම නීත්‍යානුකූල වන්නේය.

10. 09 වන අතුරු ව්‍යවස්ථාවේ සඳහන් කරුණු අවමංගල්‍ය සැරසිලි සඳහා අදාළ නොවන්නේය.

11. මෙම අතුරු ව්‍යවස්ථා යටතේ කරනු ලබන සැරසිල්ලක්, ප්‍රදේශයේ මාර්ග සංඥා පුවරු, ප්‍රදේශ සිතියම් හා නාමපුවරු වැසී යනසේ හෝ අවහිර වන සේ නොකළ යුතුය.

12. මේ අතුරු ව්‍යවස්ථාවල කවර වූ හෝ විධිවිධානයක් කඩ කිරීම හෝ උල්ලංඝනය කිරීම වරදක් වන අතර නිසි බලය ඇති අධිකරණයක් මගින් ඒ වරදකට වරදකරු කරනු ලැබූ විට නියම කළ හැකි උපරිම දඬය හා එම කඩකිරීම හෝ උල්ලංඝනය නොකඩවා තවදුරටත් කරගෙන යන විටක ඒ පිළිබඳව වරදකරු කිරීමෙන් පසුව හෝ එම උල්ලංඝනය ගැන අවධානය යොමුකරමින් සභාපතිවරයා විසින් හෝ බලයලත් වෙනත් නිලධාරියෙකු විසින් ලිඛිත දැන්වීමක් භාරදෙනු ලැබීමෙන් පසුව කඩකිරීම් හෝ උල්ලංඝනය තවදුරටත් නොකඩවා කරගෙන යන සෑම එක් දිනයක් සඳහාම නියම කළ හැකි අතිරේක දණ්ඩනයේ උපරිමය පිළිවෙලින්, නගර සභා ආඥා පනතේ (255 වන අධිකාරය) 153 වගන්තියේ (02) වන උප වගන්තියෙන් නියම කර ඇති උපරිම දඩ මුදල හා අතිරේක දණ්ඩනයේ උපරිමය විය යුතුය.

13. 12 වන අතුරු ව්‍යවස්ථාව යටතේ නියම කරන දඩ මුදල් නගර සභාවේ පොදු අරමුදලට බැර විය යුතුය.

14. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස මෙම අතුරු ව්‍යවස්ථාවේ —

"නගර සභාව" යන්නෙන් කඩුගන්නාව නගර සභාව අදහස් වේ,
"සභාපතිවරයා" යන්නෙන් කඩුගන්නාව නගර සභාවේ සභාපතිවරයා ද,

"සැරසිල්ලක් " යන්නෙන් යම් සිද්ධියක් හෝ යම් කාර්යයක් අරමුණු කරගත් කෘත්‍රිම හෝ ස්වභාවික ද්‍රව්‍යවලින් යුතුව, එම සිද්ධිය හෝ කාර්යය නියෝජනය කිරීම සඳහා තාවකාලිකව සකස් කරගනු ලබන උපක්‍රමයක්ද,

"බලය පවරනු ලබන නිලධාරියා" යන්නෙන් කඩුගන්නාව නගර සභාවේ සභාපතිවරයා විසින් බලය පවරන ලද නිලධාරියා ද අදහස් වේ.

මෙම අතුරු ව්‍යවස්ථාවේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් එවිට සිංහල පාඨයෙහි අර්ථ දැක්වෙන අදහස බලපැවැත්වේ.

07 - 279/10

---

**කඩුගන්නාව නගර සභාව**

අතුරු ව්‍යවස්ථා

255 වැනි අධිකාරය වන නගර සභා ආඥාපනතේ 153 වැනි වගන්තියේ (1) වන උපවගන්තිය සමග කියවිය යුතු එකී ආඥාපනතේ 157 වැනි වගන්තියේ 9 (ඇ) වැනි උප වගන්තිය යටතේ නගර සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව කඩුගන්නාව නගර සභාව විසින් සාදන ලද පහත සඳහන් අතුරු ව්‍යවස්ථා 1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 2 වැනි වගන්තිය (1) වැනි උප වගන්තිය සමග කියවිය යුතු ඉහත කී නගර සභා ආඥාපනතේ 154 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව මධ්‍යම පළාත් සභාවේ පළාත් පාලන විෂය භාර අමාත්‍ය සරත් ඒකනායක වන මා විසින් අනුමත කරනු ලැබූ බවත් මෙම නිවේදනය ගැසට් පත්‍රයේ පළකරනු ලැබූ දින සිට එකී අතුරු ව්‍යවස්ථා කඩුගන්නාව නගර සභා බල ප්‍රදේශයේ බලපවත්වන බවත් මෙයින් නිවේදනය කරමි.

සරත් ඒකනායක,
මධ්‍යම පළාතේ ප්‍රධාන අමාත්‍ය හා පළාත් පාලන විෂයභාර අමාත්‍ය.

2014 සැප්තැම්බර් මස 15 වැනි දින,
මහනුවර,
මධ්‍යම පළාතේ පළාත් සභාවේ,
ප්‍රධාන අමාත්‍ය කාර්යාලයේ දී ය.

**පොදු වැසිකිළි පාවිච්චිය විධිමත් කිරීම සඳහා වන අතුරු ව්‍යවස්ථාව**

01. මෙම අතුරු ව්‍යවස්ථාව කඩුගන්නාව නගර සභා බල ප්‍රදේශයේ පොදු වැසිකිළි පාවිච්චිය විධිමත් කිරීම හා පාලනය කිරීම සඳහා වන අතුරු ව්‍යවස්ථාව යනුවෙන් හැඳින්වේ.

02. කඩුගන්නාව නගර සභා බල ප්‍රදේශයේ මහජනතාවට පිරිසිදු හා සනීපාරක්ෂකව පාවිච්චිය සඳහා පොදු වැසිකිළි පද්ධතිය විධිමත් කිරීම හා පාලනය කිරීම මෙම අතුරු ව්‍යවස්ථාව පැනවීමේ අරමුණ වේ.

03. පොදු වැසිකිළියක් තුළදී මලපහ කිරීමේදී කිසිම තැනැත්තෙකු වැසිකිළි තැටියට හැර, වෙනත් ස්ථානයකට මළපහ නොකළ යුතු අතර, මූත්‍රා කිරීමේදී වැසිකිළියට හෝ ඒ සඳහා සලසා ඇති ස්ථානයට හැර වෙනත් කිසිම ස්ථානයකට මූත්‍රා කිරීම නොකළ යුතු ය.

04. වැසිකිළියට සපයා ඇති ජලය වැසිකිළියේ කටයුතු සඳහා හැර වෙනත් කිසිම කටයුත්තක් සඳහා කිසිම පුද්ගලයෙකු විසින් භාවිතා නොකළ යුතු ය.

05. කිසිම තැනැත්තෙකු විසින් පොදු වැසිකිළියක හෝ ඊට සම්බන්ධ වැසිකිළි තැටි තුළට හෝ කාණු තුළට හෝ වෙනත් විවර ස්ථාන තුළට ගඩොල්, පස්, ගල්, අළු හෝ එම කාණු අවහිර වන වෙනත් කිසිම ද්‍රව්‍යයක් දැමීම හෝ තැබීම නොකළ යුතු ය.

06. පොදු වැසිකිළියක අළුත්වැඩියාවකදී හැර වැසිකිළි තැටියක, නලයක, කපාටයක, ටැංකියක හෝ වෙනත් සවි කිරීමක් සවි කර ඇති ආකාරය, පිහිටීම හෝ පිළිවෙළ හෝ කිසිම තැනැත්තෙකු විසින් හානියට පත් කිරීම, ඉවත් කිරීම, අවහිර කිරීම හෝ කිසිදු ආකාරයකින් වෙනස් කිරීම හෝ එම වැසිකිළියේ යම් බිත්තියක් බිමක් වහලයක් හෝ ව්‍යුහයන් යන මේ කොටසක් ඕනෑකමින් විනාශ කිරීම, විරූප කිරීම, හානියට පත් කිරීම හෝ පළුදු කිරීම කරනු නොලැබිය යුතු ය.

07. ස්ත්‍රී පක්ෂයේ ප්‍රයෝජන සඳහා වෙන් කර තිබෙන්නා වූ යම් පොදු වැසිකිළියකට කාන්තාවන් පමණක්ද, පුරුෂයන් සඳහා වෙන්කර ඇති වැසිකිළි සඳහා පිරිමින් පමණක්ද, ඇතුළත් විය යුතු අතර, වැසිකිළි ශුද්ධ පවිත්‍ර කිරීම හෝ අළුත්වැඩියා කිරීම සිදු කරන අවස්ථාවලදී දොරවල් වසා ඒ බව ඇතුල්වන ස්ථානයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවලින් ප්‍රදර්ශනය කර අදාල කාර්යයන් ඉටු කිරීම පැවරී ඇති අය විසින් කළ යුතු යි.

08. නගරය තුළදී කිසිවෙකු විසින් වැසිකිළියක හැර වෙනත් කිසිම ස්ථානයක මළපහ කිරීම හෝ මූත්‍රා කිරීම නොකළ යුතු ය.

09. පොදු වැසිකිළියක උපස්ථායකයෙකු, මුරකරුවකු, සේවකයෙකු හෝ භාරකරුවෙකු විසින් තම රාජකාරි ඉටු කරන අතරතුර දී කරනු ලබන යම් නීත්‍යානුකූල නියෝගයක් පැහැර හැරීම, ඊට බාධා කිරීම නොකළ යුතු ය.

10. පොදු වැසිකිළිය මළපහ කිරීමට, මූත්‍රා කිරීම සඳහා පමණක් භාවිතා කළ යුතු අතර, එහිදී දුම්පානය, මත්ද්‍රව්‍ය භාවිතය වැනි දේ නොකළ යුතු අතර, නිකරුණේ රැඳී සිටීම නොකළ යුතු ය.

11. පොදු වැසිකිළියක නඩත්තු හා භාරකාරත්වය පෞද්ගලික අංශයකට පවරා ඇති අවස්ථාවකදී එකී පැවරුම්ලාභියා මගින් දිනපතා වැසිකිළි සෝද පවිත්‍ර කර තබා ගත යුතුය. වැසිකිළිය නඩත්තු කටයුතු සඳහා ගාස්තුවක් අය කරන්නේ නම් අදාල මුදල දන්වීමක් මගින් ඇතුල්වීමට පෙර ප්‍රදර්ශනය කර තිබිය යුතු ය.

12. වැසිකිළිය පිරිසිදුව හා සනීපාරක්ෂකව නිරන්තරයෙන්ම තබා ගත යුතු වන අතර, දිනපතා විෂබීජනාශක යොදා පිරිසිදු කර, මනා තත්වයකින් යුතුව පවත්වාගෙන යා යුතු ය.

13. පොදු වැසිකිළිය පුද්ගලයෙකුට හෝ වෙනත් ආයතනයකට පවරා ඇති විටදී වියදම් සඳහා ඔහු විසින් අය කළ යුතු මුදල් ප්‍රමාණය වරින් වර සභාව විසින් තීරණය කළ හැකිය. එම ගාස්තුව පමණක් එකී පුද්ගලයා විසින් වැසිකිළිය පාවිච්චි කරන්නාගෙන් අය කළ යුතු ය.

14. මේ අතුරු ව්‍යවස්ථාවල කවර වූ හෝ විධිවිධානයක් කඩ කිරීම හෝ උල්ලංඝනය කිරීම වරදක් වන අතර, නිසි බලය ඇති අධිකරණයක් මගින් ඒ වැරදකට වරදකරු කරනු ලැබූ විට නියම කළ හැකි උපරිම දඩය සහ එම කඩ කිරීම හෝ උල්ලංඝනය නොකඩවා තවදුරටත් කරගෙන යන විටක ඒ පිළිබඳව වරදකරු කිරීමෙන් පසුව හෝ එම උල්ලංඝනය ගැන අවධානය යොමුකරමින් සභාපතිවරයා විසින් හෝ බලයලත් වෙනත් නිලධාරියෙකු විසින් ලිඛිත දැන්වීමක් භාර දෙනු ලැබීමෙන් පසුව කඩ කිරීම හෝ උල්ලංඝනය තවදුරටත් නොකඩවා කරගෙන යන සෑම එක් දිනයක් සඳහාම නියම කළ හැකි අතිරේක දණ්ඩනයේ උපරිමය පිළිවෙලින්, නගර සභා ආඥා පනතේ (255 අධිකාරය) 153 (2) උප වගන්තියෙන් නියම කර ඇති උපරිම දඩ මුදල හා අතිරේක දණ්ඩනයේ උපරිමය විය යුතු ය.

15. 14 වන අතුරු ව්‍යවස්ථාව යටතේ නියම කරන දඩ මුදල් නගර සභාවේ පොදු අරමුදලට බැර විය යුතුය.

16. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස මෙම අතුරු ව්‍යවස්ථාවේ —

"සභාව" යන්නෙන් කඩුගන්නාව නගර සභාව අදහස් වේ,
"සභාපති" යන්නෙන් කඩුගන්නාව නගර සභාවේ සභාපතිවරයා ද,
"බලය පවරනු ලැබූ නිලධාරියා" යන්නෙන් කඩුගන්නාව නගර සභාවේ සභාපතිවරයා විසින් බලය පවරනු ලැබූ නිලධාරියා ද අදහස් වේ.

17. මෙම අතුරු ව්‍යවස්ථාවේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් එවිට සිංහල පාඨයෙහි අර්ථ දැක්වෙන අදහස බලපැවැත්වේ.

07 - 279/11

---

**කඩුගන්නාව නගර සභාව**

අතුරු ව්‍යවස්ථා

255 වැනි අධිකාරය වන නගර සභා ආඥාපනතේ 153 වැනි වගන්තියේ (1) වන උපවගන්තිය සමග කියවිය යුතු එකී ආඥාපනතේ 157 වැනි වගන්තියේ 8 (ඉ) වැනි උප වගන්තිය යටතේ නගර සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව කඩුගන්නාව නගර සභාව විසින් සාදන ලද පහත සඳහන් අතුරු ව්‍යවස්ථා 1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 2 වැනි වගන්තිය (1) වැනි උප වගන්තිය සමග කියවිය යුතු ඉහත කී නගර සභා ආඥාපනතේ 154 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව මධ්‍යම පළාතේ සභාවේ පළාත් පාලන විෂය භාර අමාත්‍ය සරත් ඒකනායක වන මා විසින් අනුමත කරනු ලැබූ බවත් මෙම නිවේදනය ගැසට් පත්‍රයේ පළකරනු ලැබූ දින සිට එකී අතුරු ව්‍යවස්ථාව කඩුගන්නාව නගර සභා බල ප්‍රදේශයේ බලපවත්වන බවත් මෙයින් නිවේදනය කරමි.

සරත් ඒකනායක,
මධ්‍යම පළාතේ ප්‍රධාන අමාත්‍ය හා පළාත් පාලන විෂයභාර අමාත්‍ය.

2014 සැප්තැම්බර් මස 15 වැනි දින,
මහනුවර,
මධ්‍යම පළාතේ පළාත් සභාවේ,
ප්‍රධාන අමාත්‍ය කාර්යාලයේ දී ය.

**පෞද්ගලික ඉගැනුම් ආයතන පාලනය කරීම, විධිමත් කිරීම හා ගාස්තු අය කිරීම පිළිබඳව වූ අතුරු ව්‍යවස්ථාව**

01. කඩුගන්නාව නගර සභා බල ප්‍රදේශයේ පෞද්ගලික ඉගෙනුම් ආයතන පවත්වාගෙන යන්නන් විසින් හා ඒවා භාරව සිටින හෝ පාලනය කරන තැනැත්තන් විසින් ශුද්ධ කිරීම, පවිත්‍ර කිරීම, ඒවාට වාතාශ්‍රය ලැබීමට සැලැස්වීම හා ඒවායේ විෂබීජනාශනය සහ පීඩා මැඩ පැවැත්වීම විධිමත් කිරීම, පාලනය කිරීම හා ගාස්තු අය කිරීම පිළිබඳව අතුරු ව්‍යවස්ථාව යනුවෙන් හඳුන්වනු ලැබේ.

02. මෙම අතුරු ව්‍යවස්ථාව අමාත්‍යවරයා අනුමත කළ බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් නිවේදනය මගින් ප්‍රකාශයට පත් කළ දින සිට ක්‍රියාත්මක වන්නේ ය.

03. නගර සභා බල ප්‍රදේශයේ සියළුම පෞද්ගලික ඉගෙනුම් ආයතන හිමිකරුවන්, භාරකරුවන්, හෝ පවත්වාගෙන යන්නන් විසින් සභාපතිවරයා හෝ ඔහු විසින් බලය පැවරූ නිලධාරියකු විසින් තත්කාර්ය සඳහා නිකුත් කළ බලපත්‍රයක් නොමැතිව පෞද්ගලික ඉගෙනුම් ආයතනයන් පවත්වාගෙන නොයා යුතු ය.

04. තුන් වන අතුරු ව්‍යවස්ථාවේ සඳහන් බලපත්‍රය ලබා ගැනීම සඳහා නගර සභාවෙන් ලබාගත් ඉල්ලුම්පත්‍රයක් පහත ලියවිලි ද සමග සභාපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතු ය.

i. අදාළ ගොඩනැගිල්ලේ අනුමත සැලැස්ම.
ii. අභ්‍යන්තර පිරිසැකැස්ම.
iii. උපයෝගී කරගන්නා තාක්ෂණික උපකරණ පිළිබඳ විස්තර.

05. අංක 3 අතුරු ව්‍යවස්ථාවේ සඳහන් බලපත්‍රය ලබා ගැනීම සඳහා බලපත්‍ර ගාස්තු ලෙස 1939 අංක 61 දරන නගර සභා ආඥා පනතේ (255 අධිකාරය) 165 (අ) වගන්තිය ප්‍රකාරව එම ස්ථානයේ වාර්ෂික වටිනාකම මත සභාව විසින් තීරණය කරන ලද ගාස්තුවක් ගෙවිය යුතු ය.

06. තුන්වන අතුරු ව්‍යවස්ථාව යටතේ ලබා ගනු ලබන බලපත්‍රය කලින් අවලංගු කරන ලද්දේ නම් මිස ලබා ගන්නේ යම් වර්ෂයක් වෙනුවෙන්ද එම වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන්නේ ය.

07. දේශන ගොඩනැගිල්ලේ දිග අඩි 50 ට වඩා වැඩි වන විට දේශකයා පසුපසට දර්ශනය වන ලෙස අඩි 1.5 උසැති වේදිකා පහසුකමක් අදළ දේශකයා සඳහා ලබා දී තිබිය යුතු ය.

08. දේශන ගොඩනැගිල්ලේ දිග අඩි 50 ට වඩා වැඩි වන අවස්ථාවක සභාපතිවරයා සෑහීමකට පත් වන ආකාරයේ ශබ්ද විකාශන පහසුකම් සපයා තිබිය යුතු ය.

09. ගොඩනැගිල්ල තුළ ප්‍රමාණවත් පරිදි ගිනිනිවීම් උපකරණ සවිකර තිබිය යුතු අතර, සභාපතිවරයා විසින් හෝ ඔහු විසින් බලය පවරන ලද නිළධාරියෙකු විසින් පරීක්ෂා කරනු ලබන ඕනෑම අවස්ථාවක ක්‍රියාත්මක තත්වයේ පැවතිය යුතු ය.

10. ඇතුල්වීම හා පිටවීම වශයෙන් දොරටු සකස් කර තිබිය යුතු අතර ළමුන් 100 කට වැඩි නම් හදිසි අවස්ථාවක දී පිටවීම සඳහා අතිරේක පිටවීම දොරටුවක් සකසා තිබිය යුතු ය.

11. දේශන ගොඩනැගිල්ලෙ ඇතුලත බිත්ති වල බිම සිට අඩි 04 ට වඩා ඉහල කොටස සුදු තීන්තයෙන් ආලේප කර තිබිය යුතු ය.

12. අවම වශයෙන් වසරකට වරක් හෝ සභාපතිවරයා විසින් එසේ කළ යුතු යැයි නියම කරනු ලබන අවස්ථාවක බිත්ති වල තීන්ත ආලේප කළ යුතු ය.

13. මෙම අතුරු ව්‍යවස්ථාවේ උපලේඛන ii හි දැක්වෙන ඖෂධ වලින් සමන්විත ප්‍රමාණවත් ප්‍රථමාධාර පහසුකම් සෑහෙන පරිදි ගොඩනැගිල්ල තුළ සපයා තිබිය යුතු ය.

14. දේශන ගොඩනැගිල්ලේ දෙපස බිත්ති වල වර්ග ප්‍රමාණයෙන් අවම වශයෙන් 1/4 ක ප්‍රමාණයක් ආවරණය වන පරිදි වාතාශ්‍ර හොඳින් ලැබෙන සේ වාකවුළු සකස් කර තිබිය යුතු ය.

15. දේශන ගොඩනැගිල්ල අවට පරිසරය නිරන්තර පිරිසිදු තත්වයෙන් පවත්වාගෙන යා යුතු අතර, කැලි කසල බැහැර කිරීම සඳහා ප්‍රමාණවත් කසල බඳුන් සංඛ්‍යාවක් ශාලාවෙන් පිටත තබා තිබිය යුතු ය.

16. ගැහැණු පිරිමි වශයෙන් වෙන් වෙන්ව වැසිකිළි හා කැසිකිළි පහසුකම් සපයා තිබිය යුතු අතර, අවම වශයෙන් සිසුන් 50 දෙනෙකුට එක් වැසිකිළියක් බැගින් වන සේ අදළ පහසුකම් සපයා තිබිය යුතු ය. එම වැසිකිළි හා කැසිකිළි සුදුසු විෂබීජ නාශකයන් භාවිතා කර දුර්ගන්ධය වහනය නොවන ආකාරයෙන් නිරන්තර පිරිසිදු තත්වයෙන් පවත්වාගෙන යා යුතු ය. ප්‍රමාණවත් ජල පහසුකම් ක්‍රියාත්මක තත්වයේ තිබිය යුතු ය.

17. ශිෂ්‍යයන් 50 දෙනෙකුට එක් පානීය ජල කරාමය බැගින් ප්‍රමාණවත් පානීය ජල පහසුකම් සපයා තිබිය යුතු ය.

18. සිසුන් සඳහා අඩි 1 1/2 නොඅඩු උසකින් යුත් පිටුපසට ඇඳි සහිත අඩියකට නොඅඩු පළලකින් යුත් ආසන පැනවිය යුතු ය. එක් එක් සිසුන් වෙනුවෙන් වෙන් වෙන් වශයෙන් ආසන නොපනවන්නේ නම්, එම ආසන දිගින් අවම වශයෙන් අඩි 02 ක් එක් සිසුවෙකු වෙනුවෙන් වෙන්විය යුතු ය.

19. සිසුන් සඳහා අවම වශයෙන් අඩි 02 ක් දිගින් අඩි 1.5 ක් පළලින් යුත් මේසයක් බැගින් සැපයිය යුතු ය. එක් එක් සිසුන් වෙනුවෙන් වෙන් වෙන් වශයෙන් මේස නොපනවන්නේ නම් පනවනු ලබන මේසයේ දිගින් අවම වශයෙන් අඩි 02 ක් එක් සිසුවකු වෙනුවෙන් වෙන් විය යුතු ය. මේසයක උපරිම දිග අඩි 12 ක් විය යුතු ය.

20. දේශන ශාලාවේ ආසන හා මේස ස්ථානගත කිරීමේදී දුර පිළිබඳ සැලකිලිමත්ව කටයුතු කළ යුතු ය.

21. සෑම අවස්ථාවකම සිසුන් සඳහා පනවා ඇති ආසන හා මේස භාවිතයට සුදුසු තත්වයෙන් තිබිය යුතු ය.

22. සභාපතිවරයා විසින් හෝ සභාපතිවරයා බලය පැවරූ නිළධාරියෙකු විසින් හෝ සියලු යුක්ති සහගත වේලාවක දී කවර හෝ පෞද්ගලික ඉගෙනුම් මධ්‍යස්ථානයකට ඇතුළු වී පරීක්ෂා කිරීම නීත්‍යානුකූල වන්නේ ය.

23. මේ අතුරු ව්‍යවස්ථාවල කවර වූ හෝ විධිවිධානයක් කඩ කිරීම හෝ උල්ලංඝනය කිරීම වරදක් වන අතර, නිසි බලය ඇති අධිකරණයක් මගින් ඒ වරදකට වරදකරු කරනු ලැබූ විට නියම කළ හැකි උපරිම දඬය සහ එම කඩ කිරීම හෝ උල්ලංඝනය කිරීම නොකඩාව තවදුරටත් කරගෙන යන විටක ඒ පිළිබඳව වරදකරු කිරීමෙන් පසුව හෝ එම උල්ලංඝනය ගැන අවධානය යොමුකරමින් සභාපතිවරයා විසින් හෝ බලයලත් වෙනත් නිළධාරියෙකු විසින් ලිඛිත දැන්වීමක් භාර දෙනු ලැබීමෙන් පසුව කඩ කිරීම හෝ උල්ලංඝනය තවදුරටත් නොකඩවා කරගෙන යන සෑම එක් දිනයක් සඳහා ම නියම කළ හැකි අතිරේක දණ්ඩනයේ උපරිමය පිළිවෙළින්, නගර සභා ආඥා පනතේ (255 වන අධිකාරය) 153 වගන්තියේ (2) වන උප වගන්තියෙන් නියම කර ඇති උපරිම දඩ මුදල හා අතිරේක දණ්ඩනයේ උපරිමය විය යුතු ය.

24. 23 වන අතුරු ව්‍යවස්ථාව යටතේ නියම කරන දඩ මුදල් නගර සභාවේ පොදු අරමුදලට බැර විය යුතුය.

25. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස මෙම අතුරු ව්‍යවස්ථාවේ —

"සභාපතිවරයා" යන්නෙන් කඩුගන්නාව නගර සභාවේ සභාපතිවරයා ද,
''සභාව'' යන්නෙන් කඩුගන්නාව නගර සභාව ද,
"බලය පවරනු ලැබූ නිලධාරියා" යන්නෙන් කඩුගන්නාව නගර සභාවේ සභාපතිවරයා විසින් බලය පවරනු ලැබූ නිලධාරියා ද අදහස් වේ.
''පෞද්ගලික ඉගෙනුම් ආයතනය'' යන්නෙන් මුදල් අය කර පවත්වාගෙන යනු ලබන ඕනෑම ඉගෙනුම් ආයතනයක් අදහස් කෙරේ.

26. මෙම අතුරු ව්‍යවස්ථාවේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් එවිට සිංහල පාඨයෙහි අර්ථ දැක්වෙන අදහස බලපැවැත්වේ.

### *I වන උපලේඛනය*

පෞද්ගලික ඉගැනුම් ආයතනයක් පවත්වාගෙන යෑම සඳහා බලපත්‍රයක් ලබාගැනීමේ අයදුම් පත්‍රය

1. අයදුම්කරුගේ නම -
2. ලිපිනය -
3. හැඳුනුම්පත් අංකය -
4. ඉදිරිපත් කර ඇති ලේඛන

| | | | | | |
|---|---|---|---|---|---|
| I. | ගොඩනැගිලි සැලැස්ම | ඇත | ☐ | නැත | ☐ |
| II. | පිරිසැකැස්ම | ඇත | ☐ | නැත | ☐ |
| III. | තාක්ෂණික උපකරණ විස්තරය | ඇත | ☐ | නැත | ☐ |

5. අධ්‍යාපන ආයතනයේ නම -
6. ලිපිනය -
7. ලියාපදිංචි අංකය -

ඉහත තොරතුරු සත්‍ය හා නිවැරදි බවට සහතික කරමි.

අයදුම්කරුගේ අත්සන - .................................. දිනය - ...............................................

කාර්යාලීය ප්‍රයෝජනය සඳහා

විෂය ලිපිකරු — නිවැරදි ☐ — වැරදි ☐

ගොඩනැගිලි අයදුම්පත්‍රය

ආදායම් පරීක්ෂක / පිරිසැකැස්ම — නිවැරදි ☐ — වැරදි ☐

බලපත්‍රය නිකුත් කිරීම සුදුසු වේ.

අත්සන 1.......................................

2.......................................

බලපත්‍රය නිකුත් කිරීම සුදුසු බව නිර්දේශ කරමි/නොකරමි.

...............................................

ලේකම්,

අනුමත කරමි/නොකරමි.

...............................................

සභාපති.


ii උපලේඛනය

| | | | |
|---|---|---|---|
| පැරසිටමෝල් | ගෝස් | ප්ලාස්ටික් | අසමෝදගම් |
| පුළුන් | බෙටර්දින් | වතුර | සිද්ධාලේප |
| සර්ජිකල් ස්ප්‍රීතු | බ්ලේඩ් | | |

iii උපලේඛනය

එක් සිසුවෙකු සඳහා වන ඉඩ කඩ පිළිබඳ උපලේඛනය

| | | |
|---|---|---|
| මේසයක උස | පළල | දිග |
| අඩි 1.5 නොඅඩු | අඩි 1 | අඩි 2 |



**කඩුගන්නාව නගර සභාව**

අතුරු ව්‍යවස්ථා

255 වැනි අධිකාරය වන නගර සභා ආඥාපනතේ 153 වැනි වගන්තියේ (1) වන උපවගන්තිය සමග කියවිය යුතු එකී ආඥාපනතේ 157 වැනි වගන්තියේ 10 (ආ) වැනි උප වගන්තිය යටතේ නගර සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව කඩුගන්නාව නගර සභාව විසින් සාදන ලද පහත සඳහන් අතුරු ව්‍යවස්ථා 1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 2 වැනි වගන්තිය (1) වැනි උප වගන්තිය සමග කියවිය යුතු ඉහත කී නගර සභා ආඥාපනතේ 154 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව මධ්‍යම පළාත් සභාවේ පළාත් පාලන විෂය භාර අමාත්‍ය සරත් ඒකනායක වන මා විසින් අනුමත කරනු ලැබූ බවත් මෙම නිවේදනය ගැසට් පත්‍රයේ පළකරනු ලැබූ දින සිට එකී අතුරු ව්‍යවස්ථාව කඩුගන්නාව නගර සභා බල ප්‍රදේශයේ බලපවත්වන බවත් මෙයින් නිවේදනය කරමි.

සරත් ඒකනායක,
මධ්‍යම පළාතේ ප්‍රධාන අමාත්‍ය හා පළාත් පාලන විෂයභාර අමාත්‍ය.

2014 සැප්තැම්බර් මස 15 වැනි දින,
මහනුවර,
මධ්‍යම පළාතේ පළාත් සභාවේ,
ප්‍රධාන අමාත්‍ය කාර්යාලයේ දී ය.

**සත්ව ගොවිපලවල් පාලනය කිරීම හා විධිමත් කිරීම සඳහා වූ අතුරු ව්‍යවස්ථාව**

01. මෙම අතුරු ව්‍යවස්ථාව කඩුගන්නාව නගර සභා බල ප්‍රදේශයේ මස් පිණිස, කිරි පිණිස හෝ බිත්තර ලබාගැනීම පිණිස හෝ සත්ව අභිජනනය පිණිස පවත්වාගෙන යන්නාවූ සත්ව ගොවිපලවලින් හා ඒ සම්බන්ධ වූ ක්‍රියාවන් පාලනය කිරීම, පරිපාලනය කිරීම, අධීක්ෂණය විධිමත් කිරීම හා ගාස්තු අයකිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා යනුවෙන් හඳුන්වනු ලැබේ.

02. කඩුගන්නාව නගර සභා බල ප්‍රදේශයේ සියලුම සත්ව ගොවිපලවල් මහජනතාවට හා පරිසරයට හානි නොවන ලෙස සෞඛ්‍යාරක්ෂිතව පවත්වාගෙන යාමටත්, පීඩාවන් හා වධහිංසා කිරීම්වලින් තොරව පිළිගත් ප්‍රමිතීන් මත සතුන් පාලනය කිරීම මෙම අතුරු ව්‍යවස්ථාව පැනවීමේ අරමුණ වේ.

03. සභාපතිවරයා විසින් තත්කාර්ය සඳහා නිකුත් කරන ලද බලපත්‍රයක් මත හැර කිසිම තැනැත්තෙකු විසින් කවර හෝ සත්ව ගොවිපොලක් මස් පිණිස, කිරි ලබාගැනීම පිණිස හෝ බිත්තර ලබාගැනීම පිණිස හෝ සත්ව අභිජනනය පිණිස සත්ව ගොවිපලක් පවත්වාගෙන නොයා යුතුය.

04. දෙවන අතුරු ව්‍යවස්ථාව පරිදි නිකුත් කරන ලද බලපත්‍රයක් කලින් අවලංගු කරනු ලැබුවහොත් මිස සෑම බලපත්‍රයක්ම එය නිකුත් කරන ලද්දේ යම් වර්ෂයක් සඳහාද එම වර්ෂයේ දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වන්නේය.

05. සෑම බලපත්‍රයක් සඳහා නගර සභා ආඥා පනතේ (255 අධිකාරය) 164, 165, 165අ, 165ආ වගන්ති ප්‍රකාරව ගාස්තුවක් අයකරනු ලැබේ. මෙම ගාස්තු සභාව විසින් කලින් කලට තීරණය කරනු ලැබිය හැකිය. එම සංශෝධිත ගාස්තු ගැසට් පත්‍රයේ පළකීමෙන් පසු වලංගු වන්නේය.

06. බලපත්‍රයක් ලබාගැනීමට අදහස් කරන යම් තැනැත්තෙකු විසින් මෙම අතුරු ව්‍යවස්ථාවේ උපලේඛනයට සාරානුකූල වන පරිදි අයදුම්පත්‍රයක් බල ප්‍රදේශයට අදාළ පශු වෛද්‍යවරයාගේ නිර්දේශය සහිතව ඉදිරිපත් කළ යුතුය.

07. සෑම සත්ව ගොවිපල බලපත්‍රයකම "බලපත්‍රලත් සත්ව ගොවිපල" යන පරිදි සහ බලපත්‍රධාරියාගේ නමද සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවලින් පැහැදිලිව පින්තාරු කළ පුවරුවක් තමාගේ සත්ව ගොවිපොළෙහි පිට පැත්තේ ප්‍රකටව පෙනෙන ස්ථානයක සවිකර තැබිය යුතුය.

08. සෑම සත්ව ගොවිපල බලපත්‍රධාරියෙකුම ගොවිපොලෙහි බිත්ති හා කුළුණු වර්ෂයකට වරක් වර්ණ පිරියම් කිරීමට සැලැස්විය යුතුය.

09. සෑම සත්ව ගොවිපල බලපත්‍රධාරියෙකුම ගොවිපොල හා එහි සියලු ගොඩනැගිලි මනා අලුත්වැඩියාවෙන්ද පිරිසිදු හා සෞඛ්‍යාරක්ෂිත තත්ත්වයෙන්ද තබාගැනීමට සහ එය දිනපතා සේදීමට සහ ඇමදීමට සැලැස්විය යුතුය.

10. සෑම සත්ව ගොවිපල බලපත්‍රධාරියෙකුම ස්ථානය පිරිසිදුව හා සෞඛ්‍යාරක්ෂිත තත්ත්වයෙන් තබාගත හැකි වනු පිණිස සියලු සත්ව මල මුත්‍රා හා වෙනත් අපද්‍රව්‍ය දිනපතා වරින් වර හා කෙටි කාලසීමාවකට වරක් බැගින් එකතු කිරීමට සැලැස්විය යුතු අතර, එසේ එකතු කරන සත්ව මල මුත්‍රා හා අපද්‍රව්‍ය යම් ස්ථිර ද්‍රව්‍යයකින් තැනූ ආවරණය කරන ලද භාජනයකට හෝ සිමෙන්ති බඳාමයෙන් බැඳ කපරාරු කරන ලද ප්‍රමාණවත් ඉඩ පහසුකම් ඇති වළකට දැමිය යුතුය.

11. සෑම සත්ව ගොවිපල බලපත්‍රධාරියෙකුම සියලු අපද්‍රව්‍ය මූත්‍රා හෝ සේද්‍ර ජලය දිනකට යටත් පිරිසෙයින් එක් වරක් වත් ඉවත් කර ඒවා මගින් පීඩාවක් ඇති නොවන පරිදි ඒවා බැහැර කිරීමට සැලැස්විය යුතුය.

12. සෑම සත්ව ගොවිපොල බලපත්‍රධාරියෙකුම අවම ලෙස මාස 03 කට වරක් ගොවිපලේ සෑම සත්වයෙකුම රජයේ පශු වෛද්‍යවරයාගේ පරීක්ෂාවට ලක්කර ලබාගත් වාර්තාවක් තමා භාරයේ තබාගත යුතු අතර පශු වෛද්‍යවරයා විසින් යම් නිර්දේශයක් ලබාදී ඇත්නම් එය වහාම ක්‍රියාත්මක කළ යුතුය.

13. සත්ව ගොවිපොල තුළ සිටින සතෙකුට හෝ සතුන්ට යම් රෝගයක්, බෝවන රෝගයක් වංසගත තත්ත්වයක් ඇති වුවහොත් සත්ව ගොවිපොල තුළ එම සතුන් වෙන්කොට තැබීමට හැකි වන ලෙස ගොවිපොල නිර්මාණය කළ යුතුය.

14. ඉහත 13 වන අතුරු ව්‍යවස්ථාවේ සඳහන් තත්ත්වයක් ගොවිපොල තුළ ඇතිවුවහොත් එවැනි අවස්ථාවකදී ඒ බව ප්‍රදේශයේ පශු වෛද්‍යවරයාට ලිඛිතව දැනුම් දීමක් කළ යුතුය.

15. සත්ව ගොවිපොල තුළ සතුන් රඳවා තබා සිටින ස්ථානයකදී කිසිදු සතෙකු මැරීම හෝ සතෙකුට වධ හිංසා පැමිණවීම නොකළ යුතුය.

16. සත්ව ගොවිපොල තුළ යම් රෝගයකින් බෝවන රෝගයකින් හෝ වසංගත තත්ත්වයක් හේතුවෙන් මියයන යන සතෙකුගේ මස් මනුෂ්‍ය පරිභෝජනයට ලක්විය නොහැකි පරිදි විනාශ කළ යුතුය.

17. සභාපතිවරයා විසින් හෝ ලියවිල්ලකින් බලය පවරනු ලැබූ යම් නිලධාරියෙකු විසින් සත්ව ගොවිපලකට යුක්ති සහගත වේලාවන් තුළ ඇතුළු වී එය පරීක්ෂා කිරීම නීත්‍යානුකුල වන්නේය.

18. සභාපතිවරයාට හෝ සභාපතිවරයා විසින් ලියවිල්ලකින් බලය පවරනු ලැබූ නිලධාරියෙකුට ස්ථානයට ඇතුළු වී පරීක්ෂා කිරීමට බලපත්‍රධාරියා විසින් හෝ සත්ව ගොවිපල භාරව සිටින තැනැත්තා විසින් හෝ ඉඩදෙනු ලැබිය යුතු අතර, සභාපතිවරයා හෝ එවැනි නිලධාරියෙකුට හෝ අවශ්‍ය විය හැකි සියලුම සහාය දිය යුතුය.

19. මේ අතුරු ව්‍යවස්ථාවල කවර වූ හෝ විධිවිධානයන් කඩ කිරීම හෝ උල්ලංඝනය කිරීම වරදක් වන අතර නිසි බලය ඇති අධිකරණයක් මගින් ඒ වරදකට වරදකරු කරනු ලැබූ විට නියම කළ හැකි උපරිම දඬය හා එම කඩකිරීම හෝ උල්ලංඝනය කිරීම නොකඩවා තවදුරටත් කරගෙන යන විටක ඒ පිළිබඳ වරදකරු කිරීමෙන් පසුව හෝ උල්ලංඝනය ගැන අවධානය යොමුකරමින් සභාපතිවරයා විසින් හෝ බලයලත් වෙනත් නිලධාරියෙකු විසින් ලිඛිත දැන්වීමක් භාරදෙනු ලැබීමෙන් පසුව කඩකිරීම හෝ උල්ලංඝනය කිරීම තවදුරටත් නොකඩවා කරගෙන යන සෑම එක් දිනයක් සඳහාම නියම කළ හැකි අතිරේක දණ්ඩනයේ උපරිමය පිළිවෙළින්, නගර සභා ආඥා පනතේ (255 අධිකාරය) 153 වගන්තියේ (02) උප වගන්තියෙන් නියම කර ඇති උපරිම දඩ මුදල හා අතිරේක දණ්ඩනයේ උපරිමය විය යුතුය.

20. 19 වන අතුරු ව්‍යවස්ථාව යටතේ නියම කරන දඩ මුදල් නගර සභාවේ පොදු අරමුදලට බැර විය යුතුය.

21. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස මෙම අතුරු ව්‍යවස්ථාවේ —

"සභාපති" යන්නෙන් කඩුගන්නාව නගර සභාවේ සභාපතිවරයා ද,
"සභාව" යන්නෙන් කඩුගන්නාව නගර සභාව අදහස් වේ,
"බලය ලත් නිලධාරියා" යන්නෙන් සභාපතිවරයා විසින් බලය පවරනු ලැබූ නිලධාරියෙකු ද,
"සතුන්" යන්නෙන් මස් පිණිස හෝ කිරි පිණිස හෝ බිත්තර ලබාගැනීම පිණිස හෝ සත්ව අභිජනනය පිණිස ඇති කරන සත්ව කොට්ඨාසයන් අදහස් වේ.

22. මෙම අතුරු ව්‍යවස්ථාවේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් එවිට සිංහල පාඨයෙහි අර්ථ දැක්වෙන අදහස බලපැවැත්වේ.

***I* වන උපලේඛනය (හයවන අතුරු ව්‍යවස්ථාව)**

*සත්ව ගොවිපල බලපත්‍රයක් ලබාගැනීම සඳහා වන අයදුම්පත්‍රය*

1. අයදුම්කරුගේ නම :–
2. අයදුම්කරුගේ ලිපිනය :–
3. දුරකථන අංකය :–
4. ගොවිපල පවත්වාගෙන යන ස්ථානයේ ලිපිනය :–
5. දිස්ත්‍රික්කය :–
6. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය :–
7. ගොවිපල පිහිටි ග්‍රාම නිලධාරි වසම / ගම :–
8. ඇති කරන සතුන් වර්ගය හා ප්‍රමාණයන් :–

| *අංකය* | *වර්ගය* | *ප්‍රමාණය* | *සතුන් ඇති කරන අරමුණ මස් පිණිස/වෙනත් .......* | *සතුන් සඳහා වෙන් කරදී ඇති ඉඩ ප්‍රමාණය* |
|---|---|---|---|---|
| 01 | ගවයන් | | | |
| 02 | එළුවන් | | | |
| 03 | ඌරන් | | | |
| 04 | කුකුළන් | | | |

9. ගොවිපලට යන මාර්ග විස්තරය :–

. ................................................................ ................................................................

දිනය අයදුම්කරුගේ අත්සන

10. නගර සහා පරිසර නිලධාරි වාර්තාව :–
11. ප්‍රදේශයේ පශු වෛද්‍ය නිලධාරිගේ වාර්තාව :–

12. කාර්යාල ප්‍රයෝජනය සඳහා

ඉහත සඳහන් තොරතුරු හා වාර්තාව අනුව සත්ව පාලන ඒකකයක් පවත්වාගෙන යාම සඳහා බලපත්‍රයක් ලබාදීම සුදුසු බව නිර්දේශ කරමි/නොකරමි.

................................................................ ................................................................

දිනය ලේකම්

සත්ව පාලන ඒකකයක් පවත්වාගෙන යාම සඳහා බලපත්‍රයක් ලබාදීම අනුමත කරමි/නොකරමි.

................................................................ ................................................................

දිනය සභාපති

07 - 279/13

## කඩුගන්නාව නගර සභාව

### අතුරු ව්‍යවස්ථා

255 වැනි අධිකාරය වන නගර සභා ආඥාපනතේ 153 වැනි වගන්තියේ (1) වන උපවගන්තිය සමග කියවිය යුතු එකී ආඥාපනතේ 157 වැනි වගන්තියේ 9 (ප) වැනි උප වගන්තිය යටතේ නගර සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව කඩුගන්නාව නගර සභාව විසින් සාදන ලද පහත සඳහන් අතුරු ව්‍යවස්ථා 1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 2 වැනි වගන්තිය (1) වැනි උප වගන්තිය සමග කියවිය යුතු ඉහත කී නගර සභා ආඥාපනතේ 154 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව මධ්‍යම පළාත් සභාවේ පළාත් පාලන විෂය භාර අමාත්‍ය සරත් ඒකනායක වන මා විසින් අනුමත කරනු ලැබූ බවත් මෙම නිවේදනය ගැසට් පත්‍රයේ පළකරනු ලැබූ දින සිට එකී අතුරු ව්‍යවස්ථාව කඩුගන්නාව නගර සභා බල ප්‍රදේශයේ බලපවත්වන බවත් මෙයින් නිවේදනය කරමි.

සරත් ඒකනායක,
මධ්‍යම පළාතේ ප්‍රධාන අමාත්‍ය හා පළාත් පාලන විෂයභාර අමාත්‍ය.

2014 සැප්තැම්බර් මස 15 වැනි දින,
මහනුවර,
මධ්‍යම පළාතේ පළාත් සභාවේ,
ප්‍රධාන අමාත්‍ය කාර්යාලයේ දී ය.

### නගර සභා සීමාව තුළ පොදු නාන ස්ථාන පාලනය කිරීම හා විධිමත් කිරීම සඳහා වූ අතුරු ව්‍යවස්ථාව

01. මෙම අතුරු ව්‍යවස්ථාව කඩුගන්නාව නගර සභා බල ප්‍රදේශයේ පොදු නාන ස්ථාන පාලනය කිරීමේ හා විධිමත් කිරීමේ අතුරු ව්‍යවස්ථා යනුවෙන් හැඳින් වේ.

02. මෙම අතුරු ව්‍යවස්ථාව කඩුගන්නාව නගර සභා බල ප්‍රදේශය තුළ පොදු නාන ස්ථාන පාලනය කිරීම සඳහා පනවනු ලැබේ.

03. සෑම නාන ළිඳක්ම විධිමත්ව පවත්වාගෙන යාම එම නාන ළිඳ ප්‍රයෝජනයට ගන්නා ගම්වැසියන්ගේ නියෝජනයෙන් සමන්විත වූ කමිටුවක් මගින් සිදුවිය යුතුය.

04. එකී කමිටුව කඩුගන්නාව නගර සභාවේ ලියාපදිංචි වියයුතු අතර කමිටුව තීරණය කරනු ලබන සුළු සාමාජික මුදලක් සාමාජිකයන්ගෙන් අයකර කමිටුව මගින් ඉතිරිකිරීමේ ගිණුමක තැන්පත් කළ යුතුය. සභාව තිරණය කරනු ලබන මුදලක් එම ගිණුමට ලබාදිය හැක. එම මුදල් ළිඳේ ප්‍රයෝජනය සඳහා ආපසු ගැනීම කමිටුවේ අභිමතය පරිදි කමිටුවේ සභාපති හා ලේකම් කළයුතු අතර මුදල් වියදම් කිරීම පිළිබඳ හා ගාස්තු අයවීම් පිළිබඳ මාස 06 කට වරක් සභාවට දැන්වීම කමිටුවේ වගකීම විය යුතුය.

05. තුන්වන අතුරු ව්‍යවස්ථාවේ සඳහන් කමිටුව ළිඳ විධිමත්ව පවත්වාගෙන යාම සඳහා පහත සඳහන් කාර්යයන් කළ යුතුය.

i. නාන ළිඳ සඳහා බාල්දියක් සහ ලණුවක් අවශ්‍ය පරිදි යෙදීම
ii. එම බාල්දිය මාස 06 කට වරක් තීන්ත ආලේප කර පවිත්‍ර කිරීම
iii. ළිඳේ අපිරිසිදු වූ ජලය සෑම මාස 06 කට වරක් හිස්කර ළිඳ පිරිසිදු කිරීම
iv. ළිඳේ ජල මූලාශ්‍රය හා ළිං පරිශ්‍රයේ තිබෙන ගස් කොලන් ආරක්ෂා කිරීම

06. ජලය ස්නානය කිරීමේ කාර්ය සඳහා යොදාගන්නා සෑම ළිඳක්ම මීටර් 0.6096 නොඅඩු උසකින් යුත් ආරක්ෂිත තාප්පයක් සහිත විය යුතු අතර, එම තාප්පය පිටත පොළව මට්ටමෙන් පහතට මීටර් 0.6096 ක් ගැඹුරට සිමෙන්ති යොදා තිබිය යුතුය.

07. සෑම පොදු ළිඳක් වටා ආසන්නව ඇති භූමිය ජලය පොළවට උරා නොගෙන ගලායන ආකාරයට ඉදිකර ඇති කාණුවකට බැස යන පරිදි සකස්කර තිබිය යුතුය.

08. ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයෙන් එක් පක්ෂයක ප්‍රයෝජනය සඳහා නගර සභාව විසින් නාන ස්ථානයක් වශයෙන් වෙන්කොට ඇති අවස්ථාවක හෝ ඇඳුම් මාරුකිරීම සඳහා ස්ත්‍රී පුරුෂ ලෙස වෙන්කොට ඇති ස්ථානයක අනෙක් පාර්ශවයට අයත් කිසිම තැනැත්තෙකු විසින් ප්‍රයෝජනයට නොගත යුතුය.

09. බෝවන රෝගයකින් පෙළෙන හෝ එවැනි රෝගයකින් මෑතකදී සුවය ලැබූ කිසිම තැනැත්තෙකුටම එවැනි යම් පොදු ළිඳක් හෝ නාන ස්ථානයක් වශයෙන් නගර සභාව විසින් වෙන්කර ඇති යම් ස්ථානයක නෑම, සේදීම හෝ එහි ජලය කවර ආකාරයකින් හෝ ප්‍රයෝජනයට ගැනීම නොකළ යුතුය.

10. පොදු නාන ස්ථානයක් වශයෙන් වෙන්කර ඇති කවර හෝ ස්ථානයකින් පානය කිරීම සඳහා ජලය ලබා නොගත යුතුය.

11. පොදු නාන ස්ථානයක් වශයෙන් වෙන්කර ඇති කවර හෝ ස්ථානයක හෝ ඒ ආසන්නයේ කිසිම ගවයෙකු එළුවෙකු, ඌරකු, කොටලුවෙකු, පෝනියෙකු සුනඛයෙකු හෝ වෙනත් යම් සතෙකු සේදීම හෝ කවර හෝ කාර්යයක් සඳහා එවැනි ස්ථානයකට සතෙකු ඇතුල් කිරීම හෝ පැන්නීම කිසිම තැනැත්තෙකු විසින් නොකල යුතුය.

12. එවැනි යම් පොදු ළිඳක් හෝ ඒ ආසන්නයේ හෝ නාන ස්ථානයක් වශයෙන් නගර සභාව විසින් වෙන්කර ඇති යම් ස්ථානයක මලපහ කිරීම හෝ මුත්‍රා කිරීම කිසිම තැනැත්තෙකු විසින් නොකළ යුතුය.

13. පොදු ළිඳක් හෝ නාන ස්ථානයක් වශයෙන් නගර සභාව විසින් වෙන්කර ඇති යම් ස්ථානයක වාහන සේදීම හෝ එවැනි කාර්යයකට ජලය ලබාගැනීම හෝ නොකළ යුතුය.

14. පොදු ළිඳක් හෝ නාන ස්ථානයක් වශයෙන් නගර සභාව විසින් වෙන්කර ඇති යම් ස්ථානයක කෘෂි රසායනික ඉසීමට ගන්නා උපකරණ සේදීම හෝ කෘෂි රසායනික ද්‍රව්‍ය ජලයේ දියකිරීම සඳහා ජලය ප්‍රයෝජනයට ගැනීම හෝ නොකළ යුතුය.

15. එවැනි පොදු ළිං පරිශ්‍රයක් තුළ හෝ ළිඳ පිහිටි ස්ථානයට ආසන්නව අසංවරව හැසිරීම නොකළ යුතුය.

16. පොදු ළිඳක් ජලය ස්නානය කිරීමේදී ළිඳට බැස ජලය ස්නානය නොකළ යුතු අතර යම් ආකාරයකින් ජලය අපවිත්‍ර වීමට සැලැස්වීම නොකළ යුතුය.

17. පොදු ළිඳක් හෝ නාන ස්ථානයක් වශයෙන් නගර සභාව විසින් වෙන්කර ඇති යම් ස්ථානයක විධිමත් පරිදි කටයුතු කෙරෙන්නේද යන්න පරීක්ෂා කර බැලීම සඳහා සභාපතිවරයා විසින් හෝ තත්කාර්ය සඳහා ඔහු විසින් සාමාන්‍යයෙන් හෝ විශේෂයෙන් බලය පවරන ලද නගර සභාවේ යම් නිලධාරියෙකු විසින් පරීක්ෂා කර බැලීම නීත්‍යානුකූල විය යුතුය.

18. ඉහතින් දැක්වූ අතුරු ව්‍යවස්ථා එකක් හෝ කිහිපයක් හෝ සියල්ලම හෝ උල්ලංඝනය කිරීම වරදක් වන අතර නිසි බලය ඇති අධිකරණයක් මගින් වරදකට වරදකරු කරනු ලැබූ විට නියම කළ හැකි උපරිම දඩය හා එම කඩකිරීම හෝ උල්ලංඝනය කිරීම නොකඩවා තවදුරටත් කරගෙන යන විටක ඒ පිළිබඳ වරදකරු කිරීමෙන් පසුව හෝ උල්ලංඝනය ගැන අවධානය යොමුකරමින් සභාපතිවරයා විසින් හෝ බලයලත් වෙනත් නිලධාරියෙකු විසින් ලිඛිත දැන්වීමක් භාරදෙනු ලැබීමෙන් පසුව කඩකිරීම හෝ උල්ලංඝනය තවදුරටත් නොකඩවා කරගෙන යන සෑම එක් දිනක් සඳහාම නියම කළ හැකි අතිරේක උපරිම දඩය 255 වන අධිකාරය වන නගර සභා ආඥා පනතේ 153 වගන්තියේ (02) වන උප වගන්තිය අනුව නියම කළ හැකිය.

19. 18 වන අතුරු ව්‍යවස්ථාව යටතේ නියම කරන දඩ මුදල් නගර සභාවේ පොදු අරමුදලට බැර විය යුතුය.

20. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස මෙම අතුරු ව්‍යවස්ථාවේ —

"සභාව" යන්නෙන් කඩුගන්නාව නගර සභාව අදහස් වේ,

"සභාපති" යන්නෙන් කඩුගන්නාව නගර සභාවේ සභාපතිවරයා ද,

"බලය පවරනු ලැබූ නිලධාරියා" යන්නෙන් කඩුගන්නාව නගර සභාවේ සභාපතිවරයා විසින් බලය පවරනු ලැබූ නිලධාරියා ද අදහස් වේ.

21. මෙම අතුරු ව්‍යවස්ථාවේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් එවිට සිංහල පාඨයෙහි අර්ථ දැක්වෙන අදහස බලපැවැත්වේ.

07 - 279/14

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.